

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2018



අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ஏற்றுமதி விவசாயத் திணைக்களம்
DEPARTMENT OF EXPORT AGRICULTURE

ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்பக் கைத்தெழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES & SOCIAL EMPOWERMENT

2018

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය

ஏற்றுமதி விவசாயத் திணைக்களம்
சமூக நல சேவை மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சு

DEPARTMENT OF EXPORT AGRICULTURE
MINISTRY OF SOCIAL WELFARE & PRIMARY INDUSTRIES

අපේ දැක්ම

කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙන් විශිෂ්ටත්වය

අපේ මෙහෙවර

වැඩි විදේශ විනිමයක් ඉපයීමත්, අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නිරත සියලු පාර්ශවකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින්, පරිසරය සුරැකෙන අයුරින් අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වන්නාවූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

எமது தொலை நோக்கு

வாசனைத் திரவியங்களுக்கும் அதனுள் இணைந்த உற்பத்திகளுக்கும் ஏற்றுமதிகளில் சிறப்பிடம்

எமது குறிக்கோள்

“உயர் அந்நியச் செலாவணி வருவாயைப் பெறுவதுடன் ஏற்றுமதி விவசாய துறையில் ஈடுபட்டிருக்கும் அனைவரினதும் பொருளாதார, சமூக அபிவிருத்திக்கு முன்னுரிமை வழங்கி, சூழல் பாதுகாப்பை உறுதி செய்து, ஏற்றுமதி விவசாய உற்பத்திகளின் அளவையும் தரத்தையும் உயர்த்துவதற்குத் தேவையான ஆராய்ச்சி அபிவிருத்தி நடவடிக்கைகளை திட்டமிடலும் நடைமுறைப்படுத்தலும்”.

OUR VISION

"Excellence in Exports of Spices and Allied Products"

OUR MISSION

"Planning and Implementation of an appropriate Research and Development Programme with the prime objective of earning more foreign exchange through enhancement of quality and quantity of Export Agricultural Crop production for sustainable development of economic and social standards of all the stakeholders of the Export Agricultural Crop sector while ensuring the safeguards to environment."

කෘතඥතාව

මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම සඳහා ලබාදුන් දායකත්වය වෙනුවෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලුම අංශවල ප්‍රධානීන්හට මාගේ හෘදයාංගම ස්තුතිය පිරි නැමේ.

අතිරේකඅධ්‍යක්ෂ ජනරාල්වරු(පර්යේෂණ, සංවර්ධන සහ පරිපාලන), අධ්‍යක්ෂවරු (පර්යේෂණ, සංවර්ධන සහ නියාමන),ගණකාධිකාරී සහ උප පර්යේෂණ මධ්‍යස්ථානසහ ආර්ථික පර්යේෂණ ඒකකය භාර සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) විසින් අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා දක්වන ලද සහයෝගය ඉතා අගය කොට සලකමි. පිටකවරය නිර්මාණය හා වාර්තාව මුද්‍රණය කිරීමෙහිලා සන්නිවේදන අංශයේ කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය ද මෙහි දී කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

අවශ්‍ය සියලු දත්ත රැස්කර මෙම වාර්තාව සම්පාදනය කිරීම වෙනුවෙන් කටයුතු කළ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ආර්.එම්.සී.එම්.එම්. රණසිංහ මහත්මියට ද මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය පුද කරමි.

ආචාර්යඒ.පි.හීන්කෙන්ද
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2019. මැයි

	පටුන	පිටුව
	සාමාන්‍ය තොරතුරු – 2018	2
1.	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය	3
	1.1 භූමිකාව හා අරමුණ	3
	1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්	3
2.	පරිපාලන අංශය	5
	2.1 හැඳින්වීම	5
	2.2 කාර්ය මණ්ඩලය	5
	2.3 2018වර්ෂයේ කාර්ය මණ්ඩල වෙනස්වීම	7
	2.4 දෙපාර්තමේන්තු විභාග-2018	8
	2.5 2018 වර්ෂයේ පුහුණු ලැබූ නිලධාරින් පිළිබඳ විස්තර	9
	2.6 2018වසරේදී ළභාකර ගත් ඉලක්ක	10
3.	මූල්‍ය අංශය	11
	3.1 2018වර්ෂය තුළ මුදල් වෙන් කිරීම් සහ වැය කිරීම්	11
	3.2 2018 වර්ෂය තුළ මුදල් වෙන් කිරීම සහ වැය කිරීම	12
	3.3 වර්ෂයේ ආදායම - 2018	13
	3.4 අභ්‍යන්තර විගණන අංශය	14
4.	සංවර්ධන අංශය	17
	4.1 හැඳින්වීම	17
	4.2 සංවර්ධන වැඩසටහන	17
	4.2.1 අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන	18

	4.2.2	**ඵලදායිතා වර්ධන වැඩසටහන**	28
	4.2.3	බෝග අගය එකතු කිරීමේ වැඩසටහන	34
	4.2.4	ජනමාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන	37
	4.2.5	ශක්‍යතා සංවර්ධන වැඩසටහන	38
	4.2.6	**වෙනත් වැඩසටහන**	39
5.	පර්යේෂණ අංශය		43
	5.1	පර්යේෂණ අංශයේ තාක්ෂණික ක්‍රියාකාරීත්වය හා සංවිධානය	43
	5.2	2018 වර්ෂය තුළ අපනයන කෘෂි බෝග සම්බන්ධ පර්යේෂණවල ප්‍රගතිය	44
	5.3	2018 වසර තුළ සිදුකෙරෙමින් පවතින පර්යේෂණ	70
	5.4	පර්යේෂණ අංශයේ අනෙකුත් කාර්යයන්ගේ ප්‍රගතිය	79
	5.5	අපනයන කෘෂි බෝග වල ආර්ථික හා අලෙවිකරණය සම්බන්ධ පරීක්ෂණ	89
	5.6	පර්යේෂණ ප්‍රකාශන	96

වගු ලැයිස්තුව

වගුව		පිටුව
2.2.1	2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු	5
2.4.1	දෙපාර්තමේන්තු විභාග -2018	8
2.5.1	2018 වර්ෂයේ පුහුණු ලැබූ නිලධාරීන් විස්තර	9
3.1.1	2018වර්ෂය තුළ මුදල් වෙන් කිරීම් සහ වැය කිරීම්	11
3.2.1	අපනයන බෝග පර්යේෂණ හා ඒකාබද්ධ පළිබෝධ රෝග කළමණාකරණ වැඩසටහන (ව්‍යාපෘතිය 02)	12
4.2.1	සංවර්ධන වැඩසටහන	18
4.2.1.1.1	2018 වර්ෂයේ පැළ අවශ්‍යතාවය	19
4.2.1.2	අපනයන කෘෂි බෝග රෝපණ ද්‍රව්‍ය මිල ගණන්	20
4.2.1.3	2018 වර්ෂය තුළ මධ්‍යම පැළ තවාන් වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම්	21
4.2.1.4	2018 වර්ෂයේ මධ්‍යම පැළ තවාන් වල පැළ නිෂ්පාදනය	22
4.2.1.5	2018 වර්ෂයේ ලියාපදිංචිව ඇති ක්‍රියාකාරී පැළ තවාන්	23
4.2.1.6	ලියාපදිංචි පැළ තවාන් වල යටිතල පහසුකම් සංවර්දනය - 2018	24
4.2.1.7	2018 වර්ෂයේ ලියාපදිංචි පැල තවාන් වලින් නිකුත් කළ පැළ	25
4.2.1.8	දිස්ත්‍රික්ක අනුව 2018 වර්ෂයේ සමස්ථ පැළ නිකුතුව	26
4.2.1.2.1	2018 වර්ෂයේ නව වගා වැඩසටහනේ ආයෝජන උපකාර යෝජනා ක්‍රමය	27
4.2.1.2.2	2018 නව වගා වැඩසටහනේ ප්‍රගතිය	28
4.2.2.1	ඵලදායිතා වර්ධන වැඩසටහනේ ප්‍රගතිය	30

4.2.2.2.1	අපනයන කෘෂි බෝග පදනම් වූ තවාන් වල බෝග සංයුතිය - 2018	31
4.2.2.2.2	ධනසවිය ගෙවතු සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය - 2018	32
4.2.2.2.3	ධනසවිය ගෙවතු සංවර්දන වැඩසටහනේ පැල නිකුත් කිරීම - 2018	33
4.2.3.2.1	කාබනික ගම්මාන වැඩසටහනේ ප්‍රගතිය - 2018	34
4.2.3.4.1	උචිත තාක්ෂණය භාවිතයෙන් අස්වනු ප්‍රශස්ථ කරණ ප්‍රගතිය	35
4.2.3.5.1	කුරුඳු සතියේ ප්‍රගතිය	36
4.2.4.1	ජනමාධය වැඩසටහනේ ප්‍රගතිය	37
4.2.5.1.1	2018 වර්ෂය තුල පවත්වන ලද ගොවි පුහුනු වැඩසටහන් වල හා ක්ෂේත්‍ර දින වල ප්‍රගතිය	38
4.2.5.2.1	මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත් වූ පුහුණු වැඩසටහන්	39
4.2.6.3.1	ගංවතුරින් සිදු වූ හානි සඳහා වන්දි ගෙවීමේ විස්තර	40
4.2.6.4.1	දුම්කොළ වෙනුවට ආදේශක බෝගයක් ලෙස ගම්මිරිස් වගාව හඳුන්වා දීම	41
5.4.7.1	පැළ සංරක්ෂණ සේවය යටතේ 2018 වර්ෂයේ දී පවත්වන ලද ක්ෂේත්‍ර චාරිකා, පුහුනු පන්ති හා ක්ෂේත්‍ර දින සංඛ්‍යාව	86
5.5.3.1	අපනයන කෘෂි බෝග වල ඇස්තමේන්තු වටිනාකම (මෙට්‍රි.ටෝ. 2016-2018)	92

ඇමුණුම		පිටුව
ඇමුණුම 1	අපනයන කෘෂි බෝග වල වගා වපසරියදිස්ත්‍රික්ක මට්ටමින්- 2018*	101
ඇමුණුම 11	අපනයන කෘෂි බෝග වල අපනයන පරිමාව සහ අගය – 2017 සහ 2018	102
ඇමුණුම III	2016/2018 වර්ෂයන්හි අපනයන කෘෂි බෝගයන්හි සාමාන්‍ය මිල ගණන්	103
ඇමුණුම 1V	අපනයන කෘෂී බෝගයන්හි ආනයන පරිමාව හා වටිනාකම 2017-2018	104
ඇමුණුම V	ව්‍යාප්ති නිලධාරීන් ස්ථානගත කිරීම	105
ඇමුණුම VI	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවිධාන සැලැස්ම - 2018	107
ඇමුණුම VII	විගණකාධිපති වාර්තාව - 2018	108

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය



අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වනුයේ නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම, නිෂ්පාදිතයන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රාථමික නිෂ්පාදිතයන්ගේ අගය එකතු ධාරිතාවය වර්ධනය කිරීම තුළින් අපනයන කෘෂිකාර්මික භෝගවලින් ලැබෙන විදේශ විනිමය ආදායම වැඩිකර ගැනීමයි. මෙම අංශය කුළුබඩු, පානීය බෝග, කාර්මික බෝග, අත්‍යවශ්‍ය තෙල් නිෂ්පාදනයට යොදා ගන්නා බෝග සහ උත්තේජක බෝග වලින් සමන්විතය. ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම දෙපාර්තමේන්තුව ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා 2018 වර්ෂයට අදාල එහි පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාවට නැංවීය.

අපනයන කෘෂි බෝගයන්හි මුළු අපනයන පරිමාව මෙට්‍රික් ටොන් 48331 සහ අපනයන ඉපයීම් රුපියල් මිලියන 64540 ක් දක්වා ළඟාවිය. කුරුඳු හැරුණු විට සියළුම බෝගයන්හි අපනයන පරිමාව හා ඉපයීම් 2017 වර්ෂය හා සසඳන කළ අඩුවීමක් පෙන්නුම් කරයි. වසර ගණනාවක් වර්ධනයක් පෙන්නුම් නොකළ කුරුඳු අපනයන පරිමාව 2016 වර්ෂයේ සිට සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කිරීමට පටන් ගන්නා ලදි. එය පසුගිය වර්ෂය තුල 5.5 % ක වර්ධනයක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 17356 ක් දක්වා වර්ධනයක් මේ වන විට අත් කරගෙන ඇත. මෑත ඉතිහාසයේ වාර්තා වූ ඉහළම අපනයන පරිමාව මෙය වේ. 2017 වර්ෂයේ රු. මිලියන 30873 සිට 2018 වර්ෂයේ රු. මිලියන 34853 දක්වා 12.9%කින් අපනයන ඉපයීම් වර්ධනය වී ඇත. (2018 වර්ෂයේ අපනයන කෘෂිබෝගයන්හි මුළු අපනයන ඉපයීමෙන් 54% ක් පමණ කුරුඳු අපනයෙන් ලබාගත් බව නිරීක්ෂණය කරන ලදි.)

ප්‍රතිපත්තියක් ලෙස අපනයන කෘෂිබෝග නිෂ්පාදනයේ නියැළී සිටින අනෙකුත් රටවල් හා තරඟ කිරීමට හැකියාව ලබා දෙන අන්තර්ජාතික ප්‍රමිතීන්ට හා වෙළෙඳ නීති රීති වලට දක්වන අනුකූලතාවය ඇති කර ගැනීම සඳහා නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීමට නිෂ්පාදිතයන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට වැඩි අවධානයක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලදි. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ යහපත් කළමණාකරණ පිළිවෙත් (GMP) ප්‍රවර්ධනය කරන අතරතුර , ගෘහස්ථ නිෂ්පාදන පද්ධතිය තුළ ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීමට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වඩා වැඩි සැලකිල්ලක් දැක්වීය. තවද , 2018 දී ක්‍රියාත්මක කරන ලද ධනසවිය නමැති ගෙවතු වගා වැඩසටහන ගෙවතු 145,000ක ඉලක්කය සපුරා ගනිමින් සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කළේය.

මෙම වාර්තාවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හතර වන පර්යේෂණ, සංවර්ධන, පරිපාලන හා මූල්‍ය යන අංශ වල සමස්ථ කාර්යසාධනය සහ අදාළ තොරතුරු සාරාංශගත කෙරේ. 2018 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවේ සිදු කළ සියළුම ක්‍රියාකාරකම් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට යොදාගත් ක්‍රමෝපායන් සහ ලබාගත් ප්‍රගතිය ද මෙහි අන්තර්ගතය.

ආචාර්ය . ඒ. පී. හීන්කෙන්ද
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2019 මැයි.

සාමාන්‍ය තොරතුරු -2018

- 2018 වසරේ අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ සාමාන්‍ය තොරතුරු
- දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය - 0.7
- අපනයන කෘෂි ආදායම් සඳහා දායකත්වය - 16.00%
- අපනයන පරිමාව (මෙට්‍රික් ටොන්) – 48,331.82
- අපනයන අගය (රු.මි.) - 64,590.51
- තක්සේරු කළ අපනයන කෘෂි බෝග වපසරිය (හෙක්.) - 111.120(ඉහුරු හා කහ ඇතුළුව)
- දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල, පර්යේෂණ මධ්‍යස්ථාන හා පැළ තවාන් ව්‍යාප්තිය

රටතුළ කාර්යාල 17 ක් පහත අයුරින් ව්‍යාප්තව ඇත.

මධ්‍යම පළාත	- මහනුවර, මාතලේ, නුවරඑළිය
සබරගමුව පළාත	- කෑගල්ල, රත්නපුර
ඌව පළාත	- බදුල්ල, මොණරාගල
දකුණු පළාත	- ගාල්ල, මාතර, හම්බන්තොට
බස්නාහිර පළාත	- කොළඹ, කළුතර, ගම්පහ
වයඹ පළාත	- කුරුණෑගල, පුත්තලම
නැගෙනහිර පළාත	- අම්පාර
උතුරු මැද පළාත	- අනුරාධපුර, පොලොන්නරුව

පර්යේෂණ මධ්‍යස්ථාන හා උප පර්යේෂණ මධ්‍යස්ථාන වල පිහිටීම

පර්යේෂණ මධ්‍යස්ථාන සහ උප පර්යේෂණ මධ්‍යස්ථාන 8 පිහිටා ඇති ප්‍රදේශ පහත දැක්වේ.

1. මධ්‍යම පර්යේෂණ ස්ථානය, මාතලේ
2. කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය, පළොල්පිටිය, තිහගොඩ, මාතර
3. අතුරුබෝග හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය, දම්පැලැස්ස, නාරම්මල
4. ආර්ථික සහ අලෙවිකරණ පර්යේෂණ ඒකකය, ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය
5. මැදරට පර්යේෂණ මධ්‍යස්ථානය, දැල්පිටිය ,ගම්පොල
6. පටක රෝපණ ඒකකය හා පැළ තවාන, වල්පිට ,ගම්පහ
7. පර්යේෂණ අනු ඒකකය, කුණ්ඩසාලේ
8. පර්යේෂණ අනු ඒකකය, නිල්ලඹ ,ගලහ

දෙපාර්තමේන්තු පැළ තවාන්වල පිහිටීම

කුරුණෑගල දිස්ත්‍රික්කය	-	සෙරපිස් පැළ තවාන - පොල්ගහවෙල හොලොන්ගොල්ල පැළ තවාන - දොඩන්ගස්ලන්ද වෙන්නෝරුව පැළ තවාන - නාරම්මල
නුවරඑළිය දිස්ත්‍රික්කය	-	බ්ලැක්වෝටර් පැළ තවාන - ගිනිගත්හේන වලපනේ පැළ තවාන, මුල්හාල්කැලේ
මාතලේ දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - ඇල්වල, උකුවෙල
මාතර දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - මාපළාන, කඹුරුපිටිය
කෑගල්ල දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - ගස්නාව, නෙලුන්දෙනිය
ගම්පහ දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - වල්පිට
හම්බන්තොට දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන හා කුළුබඩු උද්‍යානය - මිද්දෙණිය

විවිධ ස්ථානවල පිහිටි පැළ තවාන් 10 ක පැළ නිෂ්පාදනය පහත පරිදි සිදුවේ.

1. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

1.1 භූමිකාව හා අරමුණු

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ අපනයන පරිමාව ඉහළ නංවා නිෂ්පාදිතයන්ගේ ගුණාත්මය වැඩි දියුණු කිරීම මගින් වැඩි විනිමය ආදායමක් ලබා ගත හැකි වන පරිදි අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමයි. නිල වර්ගීකරණයට අනුව වාර්ෂික නිෂ්පාදනයෙන් 32%කට අධික පරිමාවක් අපනයනය කරනු ලබන (තේ, රබර්, පොල් හා කජු අයත් නොවේ) බහු වාර්ෂික බෝග හා අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවේ විෂය පථයට ඇතුළත් කළ යුතු යැයි නම් කරන ඕනෑම බෝගයක් අපනයන කෘෂි බෝගයක් ලෙස හැඳින්වේ. මෙම වර්ගීකරණයට අනුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික අවධානය යොමු වී ඇත්තේ කුරුඳු, ගම්මිරිස්, කරාබු, සාදික්කා, කරඳමුංගු, කෝපි, කොකෝවා, බුලත්, පුවක්, වැනිලා, පැහිරි, සේර, ගොරකා, කිතුල්, ඉඟුරු හා කහ ආදී සාම්ප්‍රදායික බෝග සංවර්ධනය කිරීම කෙරෙහිය. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මූලික වශයෙන් තාක්ෂණික දෙපාර්තමේන්තුවක් වන අතර එහි කාර්යයන් කේන්ද්‍රගත වී ඇත්තේ අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහිය.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුවේ 1992 සැප්තැම්බර් 22 දිනැති අංක 46 දරන අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය කිරීමේ පනත මගින් පහත සඳහන් කාර්යයන් හා සේවාවන් සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ව්‍යවස්ථාපිත බලය පවරා දෙනු ලැබ තිබේ.

- අපනයන කෘෂි බෝග වගාව හා පිරිසැකසුම්කරණය සංවිධානය හා ප්‍රවර්ධනය.
- බෝග සංවර්ධනය, බෝග වගාව, බෝග ආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා සමාජ ආර්ථික විද්‍යාව සම්බන්ධ බහු විෂයානුබද්ධ පර්යේෂණ සිදු කිරීම.
- ඉහළ ගුණාත්මකභාවයකින් යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීම.
- බෝග නිෂ්පාදනය, ඵලදායිතා වර්ධනය හා ගුණාත්මභාවය වර්ධනයට අදාළ අපනයන කෘෂි බෝග ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- බෝග ආරක්ෂණ උපදේශන සේවා සැපයීම.
- ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය.
- ඒකාබද්ධ ශාක පෝෂණ කළමනාකරණය ප්‍රවර්ධනය.
- කාබනික වගාව ප්‍රවර්ධනය.
- අලෙවිකරණය, ගුණාත්මක ප්‍රමිතීන් හා මිල ගණන් ආදිය පිළිබඳ දත්ත නිකුත් කිරීම.
- අපනයන කෘෂි බෝග නිපැයුම් හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම.
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනය, පිරිසැකසුම්කරණය, අලෙවියෙහි නියුතු පුද්ගලයින් හා අනෙකුත් පාර්ශවකරුවන් පුහුණු කිරීම.
- වැවිලි අංශය තුළ අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම.
- 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්ම පනත යටතේ විධායක අධිකාරී බලය පැවරීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සංවිධාන වෙත උපදෙස් සැපයීම.
- තාක්ෂණික ආදර්ශන පවත්වාගෙන යාම.



පාලන
நிர்வாகம்
Administration



2. පරිපාලන අංශය

2.1 හැඳින්වීම

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) ගේ මෙහෙය වීම යටතේ ක්‍රියාත්මක වන පරිපාලන අංශය, අනෙකුත් සියලු අංශ හා බාහිර ආයතන සමඟ සම්බන්ධවෙමින් දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙය වීමට උරදෙනු ලබයි . ඒ අනුව නව බඳවා ගැනීම්, උසස් කිරීම් සහ ස්ථානමාරු, මානව සම්පත් සංවර්ධනය, විනය පාලනය, දෙපාර්තමේන්තුවේ විභාග හා ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ කරුණු හා දෙපාර්තමේන්තුවේ මූලධන වත්කම් නඩත්තු කිරීම ආදී කටයුතු ප්‍රධාන වශයෙන්ම සිදුකරනු ලබයි. එසේම කාර්යමණ්ඩලයේ සුභසාධනය හා අභිප්‍රේරණය උදෙසා යෝග්‍ය පරිදි සුභසාධන සේවා ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පරිපාලන අංශය විසින් දරණු ලැබේ.

2.2 කාර්ය මණ්ඩලය

අනුමත සේවක සංඛ්‍යාව සහ සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 2.2.1 වගුව අනුව පහත දැක්වේ.

2.2.1

2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

අංකය	තනතුර	අනුමත සේවක සංඛ්‍යාව		දැනට සිටින සේවක සංඛ්‍යාව		පුරප්පාඩු
		ස්ථිර	කොන්ත්‍රාත්ත්	ස්ථිර	කොන්ත්‍රාත්ත්‍රාත්	
01	අධ්‍යක්ෂ ජනරාල්	01	-	01	-	-
02	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ/සංවර්ධන)	02	-	-	-	02
03	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)	01	-	01	-	-
04	ප්‍රධාන ගණකාධිකාරී	01	-	01	-	-
05	අධ්‍යක්ෂ (පර්යේෂණ/සංවර්ධන/ නියාමන/විශේෂ පර්යේෂණ පර්යේෂණ)	08	-	04	-	04
06	නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (පාලන)	01	-	01	-	-
07	නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන / පර්යේෂණ)	67	-	55	-	12
08	ගණකාධිකාරී	01	-	01	-	-
10	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)	01	-	01	-	-
11	අභ්‍යන්තර විගණක	01	-	01	-	-
12	සංඛ්‍යා ලේඛණඥ	01	-	01	-	-
ජ්‍යෙෂ්ඨ මට්ටමේ එකතුව		**85**	**-**	**67**	**-**	**18**

13	පරිපාලන නිලධාරි	03	-	01	-	02
14	ව්‍යාප්ති නිලධාරි (විශේෂ ශ්‍රේණිය)	19	-	01	-	18
15	ප්‍රධාන තාක්ෂණ නිලධාරි	03	-	02	-	01
16	ගොවිපල් කළමණාකරු(විශේෂ ශ්‍රේණිය)	01	-	-	-	01
17	භාෂා පරිවර්තක	02	-	01	-	01
18	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි	01		-	-	01
තෘතීය මට්ටමේ එකතුව		**29**	**-**	**05**	**-**	**24**
18	පර්යේෂණ හා සංවර්ධන සහකාර	84	-	73	-	11
19	සංවර්ධන නිලධාරි	411	-	315	-	96
20	අයවැය සහකාර (ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කිරීම කළයුතුය.)	01	-	01	-	-
21	පුස්තකාලයාධිපති	03	-	01	-	02
22	ව්‍යාප්ති නිලධාරි	171	-	139	-	32
23	තාක්ෂණ නිලධාරි	22	-	19	-	03
24	කාර්මික නිලධාරි	01	-	01	-	-
25	ගොවිපල් කළමණාකරු	20	-	5	-	15
26	රාජ්‍ය කළමණාකරණ සහකාර	83	-	75	-	08
27	තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර	01	-	01	-	-
28	නිවාස පාලක	01	-	01	-	-
29	ගොවිපල්සේවා සහකාර	02	-	02	-	-
ද්විතීය මට්ටමේ එකතුව		**800**	**-**	**632**	**-**	**168**
30	රියැදුරු	61	-	55	-	06
31	පෙදරේරු	01	-	01	-	-
32	ට්‍රැක්ටර් රියදුරු	02	-	01	-	01
33	ඉසින යන්ත්‍ර ක්‍රියාකරු	02	-	02	-	-
34	බද්ධකරු	01	-	01	-	-
35	ජලනල ක්‍රියාකරු	01	-	01	-	-
36	පැළ තවාන්කරු	02	-	02	-	-
37	කාර්යාල කාර්ය සහායක	35	-	29	-	06
39	රියැදුරු සහායක	08	-	07	-	01
40	මුරකරු	47	-	37	-	10
41	කම්කරු	190	97	*262	-	25
42	අරක්කැමි	01	-	01	-	-
43	සංචාරක බංගලා භාරකරු	02	-	02	-	02
ප්‍රාථමික මට්ටමේ එකතුව		**353**	**97**	**401**	**-**	**69**
එකතුව		**1267**	**97**	**1105**	**-**	**279**

* රා.පරි.ව 25/2014 අනුව ස්ථීර කරන ලද සංඛ්‍යාවද සමඟ

2.3 . 2018 වර්ෂයේ කාර්යමණ්ඩල වෙනස් වීම්

නව පත්වීම්

1.	විද්‍යාත්මක සේවය	03
2.	රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය	04
3.	රිය සහයක	01
4.	කම්කරු	21
5.	මුරකරු	

ස්ථානමාරුවී පැමිණි

1.	ශ්‍රී ලංකා පරිපාලන සේවය	01
2.	ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය	01
3.	සංවර්ධන නිලධාරි	08
4.	රාජ්‍ය කළමනාකරණ සහකාර	08
5.	රියැදුරු	06
6.	කාර්යාල කාර්ය සහයක	03

ස්ථානමාරුවී යාම

1.	ශ්‍රී ලංකා පරිපාලන සේවය	01
2.	ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය	01
3.	සංවර්ධන නිලධාරි	05
4.	රාජ්‍ය කළමනාකරණ සහකාර	11
5.	කාර්යාල සේවක සේවය	02
6.	රියැදුරු	04

සේවයෙන් ඉල්ලා අස්වීම

1.	සංවර්ධන නිලධාරි	02
2.	රාජ්‍ය කළමනාකරණ සහකාර	01

මුදාහැරීම

1.	විද්‍යාත්මක සේවය	01

2. ව්‍යාප්ති නිලධාරි	02
3. සංවර්ධන නිලධාරි	02
4. කාර්යාල සේවක සේවය	02
5. රියැදුරු	01

විශ්‍රාම යාම

1. විද්‍යාත්මක සේවය	02
2. ව්‍යාප්ති නිලධාරි	07
3. රාජ්‍ය කළමනාකරණ සහකාර	04
4. රියැදුරු	01
5. මුරකරු	01
6. කම්කරු	04

2.4 දෙපාර්තමේන්තු විභාග

2.4.1 දෙපාර්තමේන්තු විභාග

අංකය	විභාගය	පවත්වන ලද දිනය
01	ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරින් සඳහා වන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය	2018.07.13
02	ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ව්‍යාප්ති නිලධාරින් සඳහා වන පළමුවන දෙපාර්තමේන්තු පරීක්ෂණය	2018.06.29
03	ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ව්‍යාප්ති නිලධාරින් සඳහා වන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය	2018.02.22
04	ප්‍රාථමික ශ්‍රේණියේ කම්කරු නිලධාරීන් සඳහා වන1,2 හා 3 වන කාර්යක්ෂතා කඩඉම් පරීක්ෂණය	2018.10.11

2.5. 2018 වර්ෂයේ පුහුණු ලැබූ නිලධාරීන් පිළිබඳ විස්තර

2.5.1. 2018 වර්ෂයේ පුහුණු ලැබූ නිලධාරීන් පිළිබඳ විස්තර

අනු අංකය	පුහුණු ආයතන	සහභාගී වූ පාඨමාලාව	තනතුර	ගණන
01	වෘත්තීය සංවර්ධන ආයතනය	ලංසු ඇගයීම හා වාර්තාකරණය	සහකාර අධ්‍යක්ෂ	03
02	ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය	DALA/PDNA තොරතුරු පද්ධති කළමණාකරණය	සහකාර අධ්‍යක්ෂ	01
03	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	මූලික විමර්ශනය	සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)	01
04	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (මහනුවර)	කාර්යාල කළමණාකරණය සහ කාර්යාල ක්‍රම	සංවර්ධන නිලධාරී රාජ්‍ය කළමණාකරණ සහකාර	01 01
05	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (මහනුවර)	රියදුරන්ගේ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම	රියදුරු	01
06	නිපුණතා සංවර්ධන අරමුදල	දේපල/ උපකරණ සබැඳිව ස්ථාවර වත්කම් පවත්වා ගෙන යාම / නඩත්තුව	සංවර්ධන නිලධාරී	02
07	නිපුණතා සංවර්ධන අරමුදල	මු.රෙ. 104 අලාභ වාර්තා කිරීම , හානි පූර්ණය, ගිණුම් තැබීම	සහකාර අධ්‍යක්ෂ (පාලන) රාජ්‍ය කළමණාකරණ සහකාර	01 01
08	නිපුණතා සංවර්ධන අරමුදල	ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටිගත රීති භාවිතය	රාජ්‍ය කළමණාකරණ සහකාර	01
09	නිපුණතා සංවර්ධන අරමුදල	රාජ්‍ය නිලධාරීන් සඳහා වූ තෙදින පුහුණුව	රාජ්‍ය කළමණාකරණ සහකාර	02
10	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව	කාර්යාල කාර්ය සහායක	02
11	ටෙලිවිව් තාක්ෂණික ආයතනය	ත්‍රිමාණ සජීවිකරණ ඩිප්ලෝමා පාඨමාලාව	සංවර්ධන නිලධාරී	01
12	ජාතික සමූපකාර සංවර්ධන ආයතනය	පරිගණක පුහුණු පාඨමාලාව	ව්‍යාප්ති නිලධාරී රාජ්‍ය කළමණාකරණ සහකාර පර්යේෂණ හා සංවර්ධන සහකාර සංවර්ධන නිලධාරී කාර්යාල කාර්ය සහායක	02 30 05 39 05
13	වෘත්තීය සංවර්ධන ආයතනය	නායකත්ව කුසලතා සහ පෞරුෂත්ව සංවර්ධනය	රාජ්‍ය කළමණාකරණ සහකාර	02
14	නිපුණතා සංවර්ධන අරමුදල	සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් ගණනය කිරීම හා ගිණුම්ගත කිරීම.	සංවර්ධන නිලධාරී	01
15	නිපුණතා සංවර්ධන අරමුදල	කාර්යාල කාර්ය සහායක ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ දැමීම	කාර්යාල කාර්ය සහායක	03
16	නිපුණතා සංවර්ධන	ආයතන සංග්‍රහය හා මුදල්	රාජ්‍ය කළමණාකරණ සහකාර	02

	අරමුදල	රෙගුලාසි	සංවර්ධන නිලධාරි	01
17	නිපුණතා සංවර්ධන අරමුදල	අභ්‍යන්තර විගනනය සහ අභ්‍යන්තර පාලන ක්‍රම	රාජ්‍ය කළමණාකරණ සහකාර සංවර්ධන නිලධාරි	03 01
18	නිපුණතා සංවර්ධන අරමුදල	වැඩමුළුව හා විශ්‍රාම වැටුප්	රාජ්‍ය කළමණාකරණ සහකාර සංවර්ධන නිලධාරි	03 01
19	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	වත්කම් කළමණාකරණය සහ වාර්ෂික සමාලෝචන මණ්ඩලය	රාජ්‍ය කළමණාකරණ සහකාර සංවර්ධන නිලධාරි	01 02
20	කැළණිය විශ්වවිද්‍යාලය	මහජන හා මාධ්‍ය සම්බන්ධතා පිළිබඳ ඩිප්ලෝමාව	සංවර්ධන නිලධාරි	01
21	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩයිම් විභාගය සම්බන්ධ පාඨමාලාව	රාජ්‍ය කළමණාකරණ සහකාර	04
22	රාජ්‍ය පරිපාලන ,කළමණාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරින් සඳහා දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා දීම	සහකාර අධ්‍යක්ෂ	16
23	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	කාර්යාල කළමණාකරණය සඳහා නිපුණතා සංවර්ධනය	රාජ්‍ය කළමණාකරණ සහකාර	01
24	ජාතික භාෂා අධ්‍යයන හා පුහුණු ආයතනය	දෙමළ භාෂාව පිළිබඳව දින 06ක නේවාසික නොවූ පුහුණු පාඨමාලාව	කාර්යාල කාර්ය සහයක	28

2.6 2018 වර්ෂයේදී ළඟා කර ගත් ඉලක්ක

ඉඩම් පවරා ගැනීම

ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) අනුරු විධානය පරිදි පහත සඳහන් ඉඩම්වල හුක්තිය, 2018 වසරේදී දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.

- බදුල්ල, හල්දුම්මුල්ල, නිකපොත ව්‍යාප්ති නිලධාරී නිල නිවස පිහිටි ඉඩම
- පලොල්පිටිය ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම
- මාතලේ, යටවත්ත, ඩන්ගන්වත්ත ව්‍යාප්ති නිලධාරී නිල නිවස පිහිටි ඉඩම

මූල්‍ය
நிதி
Finance





3.මූල්‍ය අංශය

2018 වර්ෂය තුල දී දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ඇස්තමේන්තු ගත (ඒකාබද්ධ අරමුදල) මුළු ප්‍රතිපාදනය වූ රු මිලියන 1179.465 ක මුදල වැය ශීර්ෂ 289 යටතේ වූ එක වැඩසටහනක් ව්‍යාපෘති 02ක් වෙනුවෙන්වූ ප්‍රාග්ධන හා පුනරාවර්ථන වියදම් සඳහා වෙන් කෙරුණි.

3.1 වර්ෂය තුල මුදල් වෙන් කිරීම සහ වැය කිරීම

වගුව 3.1.1 2018 වර්ෂය තුල මුදල් වෙන් කිරීම සහ වැය කිරීම			
කරුණු	ලැබීම් (රු)	වියදම(රු)	ප්‍රතිශතය (%)
වැය ශීර්ෂය- 289			
වැඩසටහන- 02 ව්‍යාපෘතිය-01 අපනයන බෝග සංවර්ධන වැඩසටහන			
ප්‍රාග්ධන වියදම්			
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	12,500,000	11,669,057	93.35
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	10,000,000	9,184,870	91.85
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	500,000	488,525	97.71
වාහන	2,000,000	1,995,662	99.78
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	12,000,000	11,612,254	96.77
ගෘහ භාණ්ඩ සහ කර්යාලීය උපකරණ	3,000,000	2,987,538	99.58
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2,000,000	1,994,205	99.71
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	5,000,000	4,638,201	92.76
ඉඩම් ඉඩම් වැඩිදියුණු කිරීම	2,000,000	1,992,310	99.62
යටිතල පහසුකම් සංවර්ධනය	1,000,000	484,656	48.47
සංවර්ධන සහයන්	500,000,000	440,432,183	88.09
හැකියා වර්ධනය			
පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	1,500,000	1,475,869	98.39
මුළු ප්‍රාග්ධන වියදම්	527,000,000	465,674,019	88.36
පුනරාවර්තන වියදම්			
පුද්ගල පඩිනඩි	378,670,000	377,825,393	99.78
වෙනත් වියදම්	67,608,000	66,595,688	98.50
සාමාන්‍ය පරිපාලනය	446,278,000	444,421,081	99.58
මුළු වියදම (ව්‍යාපෘති 01)	973,278,000	910,095,100	93.51

3.2 වර්ෂය තුල මුදල් වෙන් කිරීම සහ වැය කිරීම

3.2.1. ව්‍යාපෘතිය -2- අපනයන භෝග පර්යේෂණ හා ඒකාබද්ධ පලිබෝධ රෝග කළමණාකරන වැඩසටහන	ලැබීම් (රු)	වියදම (රු)	ප්‍රතිශතය (%)
ප්‍රාග්ධන වියදම්			
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා දියුණු කිරීම්	5,000,000	4,976,263	99.53
ගොඩනැගිලි සහ ඉදිකිරිම්	2,500,000	2,488,686	99.55
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	500,000	494,918	98.98
වාහන	2,000,000	1,992,659	99.63
ස්ථාවර වත්කම් අත්පත්කර	16000,000	10,239,228	64.00
ගෘහ භාණ්ඩ සහ කර්යාලිය උපකරණ	2,000,000	1,733,321	86.67
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	4,000,000	3,999,999	100.00
ගොඩනැගිලි සහ ඉදිකිරිම්	7,000,000	1,672,329	23.89
ඉඩම් ඉඩම් වැඩිදියුණු කිරිම	3,000,000	2,833,579	94.45
හැකියා වර්ධනය			
පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	5000,000	411,107	82.22
යටිතල පහසුකම් සංවර්ධනය	1,000,000	962,261	96.23
ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම ක්‍රියාත්මක කිරිම			
ආයෝජන	6,000,000	5,930,986	98.85
මුළු ප්‍රාග්ධන වියදම්	28,500,000	22,519,845	79.02
පුනරාවර්තන වියදම්			
පුද්ගල පඩිනඩි	156,690,000	156,414,291	99.82
වෙනත් වියදම්	20,997,000	20,579,795	98.01
සාමාන්‍ය පරිපාලනය	177,687,000	176,994,086	99.61
මුළු වියදම (ව්‍යාපෘතිය 012)	206,187,000	199,513,931	96.76
මුළු වියදම	1,179,465,000	1,109,609,031	94.08

2017 වසරට සාපේක්ෂව මෙම වසර සඳහා ඒකාබද්ධ අරමුදල් මඟින් දෙපාර්තමේන්තුවට ලබාදුන් ප්‍රතිපාදන රු. මිලියන 98.933 ක අඩුවීමක් පෙන්වයි. වර්ෂය සඳහා වූ සම්පූර්ණ මුදල් වෙන් කිරීම් රුපියල් මිලියන 1179.485 කින් 1109.609 ක් වැය කිරීමට හැකි වූ අතර එය 94 %ක ප්‍රගතියකි. ලබා දුන් ප්‍රතිපාදන වලින් 93.51% හා 76% ක මූල්‍ය ප්‍රගතිය පෙන්වීමට පිළිවෙලින් ව්‍යාපෘති අංක 01 හා අංක 02 සමත් වී සවිස්තරව ගත් විට 2018 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දුන් මුදලින් 88.36 % හා 79.02%ක ප්‍රගතියක් පිළිවෙලින් ව්‍යාපෘති අංක 01හා අංක 02 පෙන්වූ අතර පුනරාවර්ථන වියදම් සඳහා එය පිළිවෙලින් 99.58 % හා 99.61%කි. ක්ෂේත්‍ර මට්ටමේ තාක්ෂණික නිලධාරින්ගේ මදි පාඩුවක් මධ්‍යයේ වුව ද 2018 වර්ෂය සඳහා ලබා දුන් මුදලින් 94.08 % ප්‍රගතියක් ලභා කර ගැනීම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලද දිරි ගන්වන සුළු ප්‍රගතියකි.

3.3 2018 ආදායම්

ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත මුදල (රු .මී)	සත්‍ය ලැබීම්
රජයේ ගොඩනැගිලි කුලී	1.70	2.00
බද්ධ	4.00	4.3
දෙපාර්තමේන්තුමය විකිණීම්	9.00	28.40
විවිධ	45.00	58.20
අනෙකුත් ලැබීම්	5.00	15.00
වැ.අ.වි.වැ	25.00	23.76
ප්‍රාග්ධන වත්කම් විකිණීම	0.66	0.66
එකතුව	88.66	132.32

අත්තිකාරම් ගිණුම් සීමා		
උපරිම වියදම් සීමාව	45,000,000	44,966,732
අවම ලැබීම් සීමාව	29,000,000	31,555,343
උපරිම හර ශේෂ සීමාව	115,000,000	112,653,060

3.4 අභ්‍යන්තර විගණන අංශය

අරමුණ

ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල , පර්යේෂණ මධ්‍යස්ථාන, ගොවිපළ , පැළ තවාන් හා ගබඩා වලින් සමන්විත සංවර්ධන සහ පර්යේෂණ කාර්යයන් වල නිරත අප දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුවේ 1992 සැප්තැම්බර් 22 දිනැති අංක 46 දරණ අපනයන කෘෂි භෝග ප්‍රවර්ධනය කිරීමේ පනත මඟින් සහ අනෙකුත් පනත් , චක්‍රලේඛ සහ විධිවිධාන ආදිය මඟින් පවරන ලද රාජකාරී සහ වගකීම් එම පනත් , මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය , ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ,චක්‍රලේඛ සහ අනෙකුත් නීතිරීති සහ විධිවිධාන අනුව සිදු වන්නේ දැයි මුදල් රෙගුලාසි 133 සහ හා 134 අනුව සොයා බැලීම සහ වාර්තා කිරීම.

3.4.1 අභ්‍යන්තර විගණනයේ පරමාර්ථ

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයට සහාය වී වංචා හා වැරදි වැළැක්වීම, අනාවරණය කර ගැනීම හා අභ්‍යන්තර සෝදිසි මගින් විධිමත් හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් සිදු කර ඉදිරි කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීම.

- දෙපාර්තමේන්තුවට නියම කෙරුනු හා දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද සංවර්ධන සහ පර්යේෂණ ව්‍යාපෘති යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම , සැලසුම් හා වැඩ සටහන් සපුරා ගැනීමේදී ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ගණන් දීමේ නිලධාරියාට සහ ප්‍රගති සමාලෝචන කටයුතු වලට සහාය වීම.

- උචිත අවස්ථාවන්හිදී ඉහත කාර්යයන්හි නිරත අයවළුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා /ප්‍රගති සමාලෝචන කමිටුව අතර සම්බන්ධීකාරකයෙක් වශයෙන් කටයුතු කිරීම.

3.4.2. අභ්‍යන්තර විගණනයේ වගකීම

- දෙපාර්තමේන්තුවේ දැක්ම, අරමුණු මෙහෙවර කරා ළඟා වීමේදී ඉටු කළ යුතු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ,විනිවිදභාවයෙන් යුතුව ඉටු කිරීම සඳහා නෛතිකමය අවශ්‍යතාවයන් මත රාජ්‍ය මුදල් පාලනය හා සැලසුම් කිරීමට සහාය වීම.

අභ්‍යන්තර විගණන හා විමර්ශන පහත අංශයන්ගෙන් සිදු කරනු ලබයි.

- මූල්‍ය විගණනය
- පද්ධති විශ්ලේෂණය
- කාර්ය සාධන විශ්ලේෂණය
- විශේෂ විමර්ශන

3.4.3 අභ්‍යන්තර විගණන වාර්තා සකස් කිරීම

- විගණන වාර්තා
- විශේෂ විමර්ශන විගණන වාර්තා
- කළමනාකරණ විගණන කමිටු තීරණ වාර්තා

3.4.4. අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්

- දෙපාර්තමේන්තුව කළමනාකරණය කිරීම සඳහා පාලන ක්‍රියාවන්හි ක්‍රියාකාරිත්වය සාර්ථක දැයි විමර්ශනය කිරීම.
- මුදල් රෙගුලාසි , ආයතන සංග්‍රහයේ නියමයන් , ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් හා චක්‍රලේඛ උපදෙස් , දෙපාර්තමේන්තුව තුළ ගිණුම් හා පාලන කටයුතු වලදි නිසි ලෙස පිළිපැද ක්‍රියාත්මක වේදැයි පරීක්ෂා කිරීම.
- ගිණුම් හා වෙනත් වාර්තා වල විශ්වාසනීයත්වය විමර්ශනය කිරීම.
- ආයතන තුළ කාර්යක්ෂමතාවය වර්ධනය වන පිළිවෙත් ස්ථාපිත කිරීමට සහාය වීම.
- අකාර්යක්ෂමතාවය හා වංචනික ක්‍රියා අවම කොට සේවාවන්හි ගුණාත්මක භාවය වැඩි කරවීම.
- ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් නොපිරිහෙලා ඉටු වන්නේ දැයි සොයා බැලීම.
- රජයේ දේපළ හා වත්කම් අලාභහානි වලින් කොතෙක් දුරට ආරක්ෂා කරමින් භාවිතා කර ඇතිදැයි සොයා බැලීම.
- රාජ්‍ය ගනුදෙනු නාස්තිය හා පිරිවැය අවම වන පරිදි ගුණාත්මක භාවය හා ලාභදායිත්වය උපරිම වන පරිදි සහ දේපළ හා වත්කම් ආරක්ෂා වන පරිදි සිදු කරන්නේදැයි සොයා බැලීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
- දෙපාර්තමේන්තුව සතු ආයතන වල හා ක්‍රියාවලි වල අවදානම් ක්ෂේත්‍ර විගණනය කිරීම හා ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු සිදු වේදැයි නිරීක්ෂණය කිරීම.
- අවස්ථාවෝචිත පරිදි විශේෂ විමර්ශන පැවැත්වීම .

3.4.5. අභ්‍යන්තර විගණනයේදී අවධානය යොමු කරනු ලබන අංශ

- මුදල් රෙගුලාසි 135 යටතේ බලය පැවරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම.
- ප්‍රසම්පාදන සැලැස්ම සහ කාල සටහන.
- අග්‍රිම ගිණුම්,නොපියවූ අග්‍රිම ඇතුළු සියළුම ගිණුම්, වැය පාලනය හා වත්කම් පාලනය .
- පෞද්ගලික ලිපි ගොනු ,නිවාඩු සම්බන්ධ ගොනු.

3.4.6 කාර්යයභාරය

- 2018 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන වාර්තා 16 ක් ඉදිරිපත් කරන ලදී. එයට පහත සඳහන් ඒකකයන් ඇතුළත් විය.
    - ප්‍රධාන කාර්යාලය
    - දිස්ත්‍රික් කාර්යාල
    - පර්යේෂණ සහ උප පර්යේෂණ මධ්‍යස්ථාන
    - මධ්‍යම පැළ තවාන්
    - 2018 වර්ෂයේ කාර්තු 04 සඳහාම විගණන හා කළමනාකරන කමිටු රැස්වීම් පවත්වන ලදී.
- විශේෂ විමර්ශන 05 ක් සිදු කරන ලදී.

සංවර්ධන
அபிவிருத்தி
Development





























4. සංවර්ධන අංශය

4.1. හැඳින්වීම

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය අපනයන කෘෂිභෝග වල අගයදාම සංවර්ධනයේ සියළුම ප්‍රවර්ධන කටයුතු වලට සහය දක්වමින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.වපසරිය ක්‍රියාත්මක කිරීම, ඵලදායිතාව වර්ධනය, පසු අස්වනු හා ගුණාත්මක නිෂ්පාදන වැඩි දියුණු කිරීම සහ සහතිකකරණය, මානව සම්පත් සංවර්ධනය සහ රැකියා අවස්ථා නිර්මාණය කිරීම ඇතුළත් 2018 වර්ෂයේ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම මෙම අංශය විසින් වසර පුරාවට ඉටු කරන ලදි.

දිස්ත්‍රික් කාර්යාලයන්හි පහසු කළමණාකරණය සඳහා වෙන් වූ සංවර්ධන වැඩසටහන් හා එක් එක් වැඩසටහන සඳහා දිස්ත්‍රික්ක දෙකක් පවරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ i පන්තියේ අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුගේ සහය ඇතිව ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ අධි ශ්‍රේණියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරයෙකු විසින් මෙම අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම් සහ සේවාවන් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ තෙත් හා අතරමැදි කලාපය ඉලක්කගත කර ඇති නමුත් මෑතකදී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් එහි ආවරණපථය සාම්ප්‍රදායික නොවන දිස්ත්‍රික්ක තුළට ද පතුරුවා හැර ඇත. නම් වශයෙන් ගාල්ල, මාතර, හම්බන්තොට, කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, මොණරාගල, බදුල්ල, කුරුණෑගල, අම්පාර, අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක පුරා විහිදී ඇති දිස්ත්‍රික් කාර්යාල 17 ක් මෙම අංශය සතුව පවතියි. සංවර්ධන සැලැස්ම දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාවට නැංවීම සඳහා සංවර්ධන අංශයේ දිස්ත්‍රික්ක මට්ටමේ රාජකාරි කටයුතු ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ii / iii පන්තියේ සහකාර අධ්‍යක්ෂ වරුන්ට පවරා ඇත. සංවර්ධන සැලැස්ම ක්ෂේත්‍ර මට්ටමෙන් ක්‍රියාවට නැංවීමේ සඳහා පර්යේෂණ හා සංවර්ධන නිලධාරින් හා සංවර්ධන නිලධාරින්ගේ සහය ඇතිව ශ්‍රී ලංකා තාක්ෂණවේදී සේවයේ ව්‍යාප්ති නිලධාරින් විසින් ඉටු කරනු ලැබේ. පුහුණු කිරීමේ කාර්යය සඳහා මෙම අංශය සතුව සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයක් මාතලේ පිහිටා ඇත. මීට අමතරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා ප්‍රවර්ධන කටයුතු සඳහා සහය දක්වනු වස් මාධ්‍ය ඒකකයක් සහ අලෙවිකරණ කටයුතු කෙරෙහි පහසුකම් සැලසීම සඳහා ව්‍යාපාර උපදේශන අංශයක් සංවර්ධන අංශය සතුව ඇත.

4.2. සංවර්ධන වැඩසටහන

සිය දැක්ම හා මෙහෙවර පෙරදැරිව 2018 වර්ෂයේ සංවර්ධන සැලැස්ම සකස් කර ඇති අතර එය ප්‍රධන වැඩසටහන් 05 කින් සමන්විත වේ. සියළුම වැඩසටහන් 100% ක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් මත ක්‍රියාවට නංවන ලදි.

වගුව .4.2.1. සංවර්ධන වැඩසටහන 2018

වැඩසටහන	මූල්‍යමය ඉලක්කය, රු.මි.
1. බෝග සංවර්ධන වැඩසටහන	163.7
2. ඵලදායිතා සංවර්ධන සහ ගෙවතු සංවර්ධන වැඩසටහන	247.92
3. බෝග අගය එකතු කිරීමේ වැඩසටහන	28.5
4. ජන මාධ්‍ය වැඩසටහන	35.1
5. ශක්‍යතා සංවර්ධනය	6.57
6. පරිපාලනය	18.00
එකතුව	500.00

4.2.1. අපනයන කෘෂිබෝග සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ පාරිසරික ආරක්ෂණය පෙරදැරි කර ගනිමින් රටට හා අපනයන කෘෂි භෝග පාර්ශවිකයන් හට ඉහළ ආදායමක් ලබා දීමේ අරමුණින් අපනයන කෘෂිබෝග වපසරිය ඉහළ නැංවීමයි.

4.2.1.1. පැළ නිෂ්පාදන වැඩසටහන

සාර්ථක වගාවක මූලික අවශ්‍යතාවයක් වනුයේ ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ නිරෝගී සහ ගුණාත්මක පැළයකි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව මධ්‍යම පැළ තවාන් 10ක් සහ කලින් සඳහන් කර ඇති දිස්ත්‍රික්කයන්හි වාර්ෂිකව ලියාපදිංචි කරන ලද පුද්ගලික පැළ තවාන් පිහිටුවා ඇත.

වගුව.4.2.1.1.1 2018 වර්ෂයේ පැළ අවශ්‍යතාවය

දිස්ත්‍රික්කය	ගම්මිරිස්	කුරුඳු	පැණිරි	කෝපි	සාදික්කා	කරාබු	කරඳමුංගු	කොකෝවා	පුඩක්	ගොරකා	ඉඟුරු (කි.ග්‍රෑ.)	කෑන(කි.ග්‍රෑ.)	එකතුව
කොලඹ	75,000	150,000			1,500				10,000		5,545		236,500
ගම්පහ	310,000	200,000							50,000				560,000
කළුතර	245,000	1,000,000			500				80,000		7,935		1,325,500
ගාල්ල	240,000	4,000,000							1,800		15,173		4,241,800
මාතර	160,000	2,500,000							1,800				2,661,800
හම්බන්කොට	200,000	1,800,000	135,000		1,500	210			115,000		240	200	2,251,710
මහනුවර	350,000	35,000		5,000	6,500	600		600	25,000	10	555	5,480	422,710
මාතලේ	225,000	210,000		6,000	3,000	1,500		10,000	80,000				535,500
නුවරඑළිය	160,000	0		50,000	100	2,000	1,700		20,000	10			233,810
කුරුණෑගල	450,000	250,000			3,000			5,000	40,000	175			748,175
කෑගල්ල	445,000	440,000			3,000	2,000			30,000		2,319	330	920,000
රත්නපුර	475,000	3,600,000			140				250,000	315	6,575		4,325,455
බදුල්ල	230,000	105,000	285,000	20,000		2,000			30,000				672,000
මොණරාගල	260,000	160,000			40			20,000	70,000		145	1,985	510,040
අම්පාර	55,000	30,000							50,000		1,765	350	135,000
අනුරාධපුර	30,000	40,000							35,000				105,000
පොළොන්නරුව	80,000	0							35,000				115,000
එකතුව	3,990,000	14,520,000	420,000	81,000	19,280	8,310	1,700	35,600	923,600	510	40,252	8,345	20,000,000

සියළු වගාකරුවන් හට ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය සැපයීමේ අරමුණින් මෙම කාර්යය සඳහා පත් කරනු ලැබූ ප්‍රවීණයන් කණ්ඩායමක් විසින් මෙහෙයවනු ලබන පැළ සංවර්ධන වැඩසටහනක් සංවර්ධන අංශය විසින් දියත් කරනු ලබයි.

වගුව.4.2.1.2. අපනයන කෘෂිබෝග රෝපණ ද්‍රව්‍ය මිල ගණන් -2018

බෝගය	රෝපන ද්‍රව්‍ය	මිල (රු.)	බීජ ද්‍රව්‍ය	මිල (රු.)
කුරුඳු	පැළ 5ක් සහිත බඳුනක්	13.00	බීජ කිලෝ ග්‍රෑමයක්	150.00
ගම්මිරිස්	පැළයක්	23.00	පුරුක් ඡේදක 3ක් සහිත දඩු කැබැල්ලක්	0.20
කරාබු	විශාල පැළයක්	70.00	-	-
සාදික්කා	බීජපැළයක් (විශාල)	100.00	එක් බීජයක්	10.00
සාදික්කා	බද්ධ පැළයක්	180.00	-	-
කරඳමුංගු	සාමාන්‍ය මොරෙයියෙක්	10.00	-	-
කරඳමුංගු	පටක රෝපිත මොරෙයියෙක්	50.00	-	-
වැනිලා	මීටර 1 ක් දිග දඩු කැබැල්ලක්	5.00	-	-
පුවක්	පැළයක්	13.00	බීජයක්	2.00
කොකෝවා	පැළයක්	14.00	ගෙඩියක්	20.00
කෝපි	පැළයක්	14.00	ඉඳුණු නැවුම් කෝපි බීජ කිලෝ එකක්, පාච්මන්ට්, වියළි කෝපි බීජ කිලෝ එකක්	80.00 150.00
පැහිරි	මොරෙයියෙක්	2.00		
සේර	මොරෙයියෙක්	2.00		
ගොරකා	බීජ පැළයක්	70.00		
ගොරකා	බද්ධ පැළයක්	120.00		
කිතුල්	විශාල පැළයක්	45.00		
කිතුල්	කුඩා පැළයක්	12.00		
ඉඟුරු	-		බීජ ඉඟුරු කිලෝ ග්‍රෑමයක්	100.00
කහ	-		බීජ කහ කිලෝ ග්‍රෑමයක්	40.00

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යම පැළ තවාන් උසස් ගුණාත්මක බවින් යුක්ත රෝපණ ද්‍රව්‍ය සපයන අතර විද්‍යාත්මකව දියුණු වූ පැළ තවාන් ශිල්ප ක්‍රම දියුණුව පැළ තවාන් ශිල්ප ක්‍රම හඳුන්වා දෙනු ලබයි. 4.2.1.3 වගුවේ පෙන්නුම් කර ඇති ආකාරයට මධ්‍යම පැළ තවාන් ශක්තිමත් කිරීමේ අරමුණින් 2018 වර්ෂයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදු කර ඇත.

වගුව .4. 2.1.3. - 2018 වර්ෂය තුළ මධ්‍යම පැළ තවාන් වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම්

මධ්‍යම පැළ තවානේ නම	**සම්පූර්ණ කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්**
වල්පිට, වෙන්නෝරුව, හොළොන්ගොල්ල, ගස්නාව, මාපලාන,බිලැක්වෝටර්, මාතලේ, මිද්දෙණිය.	නව සෙවණ දැල් ඉදිකිරීම (07) සහ පවත්නා සෙවන දැල් ගෘහ අළුත්වැඩියා කිරීම. (28)
මාපලාන - මාතර	පවත්නා ළිඳ ගැඹුරු කිරීම සහ නව වතුර ටැංකියක් ස්ථාපනය කිරීම.
ගස්නාව - කෑගල්ල	වතුර පොම්ප පිහිටුවීම සහ තෙකලා බලශක්ති සැපයුම

වගුව .4.2.1.4 - 2018 වර්ෂයේ මධ්‍යම පැළ තවාන් වල පැල නිෂ්පාදනය

පැළ තවාන	ගම්මිරිස්	කුරුඳු	කෝපි	කුඩක්	කරාබු	සාදික්කා	ගොරකා	කොකෝවා	කරඳමුංගා	සාදික්කා (බෑල්)	ගොරකා (බෑල්)	මුදුන්පිඤ්ඤ	පඳුරු ගම්මිරිස්	මිටි ඉඟුල්	වෙනත්	එකතුව
ගස්නාව	33,496	125,660	-	22,095	315	2,983	2,340	-	-	607	817	700	300	400		189,713
සෙරපිස්	151,000	100,000	-	14,340	-	2,000	-	4,000	-	-	-	3,650	-	-		274,990
හොලොන්ගොල්ල	88,000	110,000	-	11,000	36	865	-	4,000	-	-	80	3,200	-	-	1,900	219,081
වෙන්නෝරුව	62,000	100,000	-	18,000	-	-	500	4,000	-	-	-	1,400	-	-	-	185,900
මිද්දෙණිය	12,439	10,600	-	450	-	-	-	-	-	-	-	-	-	-	200	23,689
මාතලේ	100,000	25,000	1,335	30,547	-	1,405	-	12,500	-	-	-	-	-	-	-	170,787
වල්පිට	95,700	128,500	-	19,100	135	-	75	-	4,620	-	-	1,175	577	-	1,915	251,797
මාපලාන	11,073	240,000	-	-	-	650	-	-	-	-	-	135	-	-	2,400	254,258
මුල්හාල්කැලේ	20,335	-	34,500	2,700	350	-	-	-	-	-	-	-	-	-	-	57,885
බිලැක්වෝටර්	25,298	-	25,514	5,500	-	1,325	750	-	-	-	-	516	-	-	-	58,903
එකතුව	599,341	839,760	61,349	123,732	836	9,228	3,665	24,500	4,620	607	897	10,776	877	400	6,415	1,687,003

ගුණාත්මක අපනයන කෘෂි භෝග කෙරෙහි ළඟාවීම ඉහළ නැංවීම සඳහා දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරි මණ්ඩලය විසින් 2018 වර්ෂය තුළ ලියාපදිංචි පැල තවාන් 584ක් ස්ථාපිත කරන ලදි. සෙවණ දැල් ගෘහ ස්ථාපනය කිරීම හා ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති ස්ථාපනය වැනි යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ අරමුණින් පැල තවාන් කරුවන් සඳහා නිපුණතා සංවර්ධන පුහුණු පාඨමාලා පැවැත්වූ අතර පැළ තවාන් සඳහා ආයෝජන අනුග්‍රාහක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

වගුව.4.2.1.5. 2018 වර්ෂයේ ලියාපදිංචිව ඇති ක්‍රියාකාරී පැළ තවාන්

දිස්ත්‍රික්කය	පැළ තවාන් ගණන
කොළඹ	19
ගම්පහ	31
කළුතර	44
ගාල්ල	71
මාතර	81
හම්බන්තොට	32
මහනුවර	75
මාතලේ	57
නුවරඑළිය	38
කුරුණෑගල	40
කෑගල්ල	52
රත්නපුර	77
බදුල්ල	54
මොණරාගල	79
අම්පාර	39
අනුරාධපුර	27
පොළොන්නරුව	38
එකතුව	854

ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධතියක් ස්ථාපනය කර ගැනීම සඳහා පැල තවාන් කරුවෙකුට රු. 50000.00 ක් දක්වා මූල්‍යමය ආධාරයක් ලබා දුන් අතර එය ස්ථාපනය කිරීමේ පිරිවැයෙන් 50% කි. නව සෙවණ දැල් ගෘහයක් සඳහා රුපියල් 150000.00 ක මූල්‍යමය ආධාරයක් වාරික දෙකකින් ලබා දුන් අතර එයින් 50%ක් පැල නිකුත් කරන අවස්ථාවේ දී නැවත අයකරගනු ලැබිණි. (මෙම වැඩසටහන සඳහා අරමුදල් සපයනු ලැබුවේ භාණ්ඩාගාරය මඟිනි)

වගුව .4.2.1.6. ලියාපදිංචි පැළ තවාන් වල යටිතල පහසුකම් සංවර්ධනය – 2018

දිස්ත්‍රික්කය	සෙවණ දැල් ගෘහ	ක්ෂුද්‍ර වාර්මාර්ග පද්ධති
කොළඹ	1	-
ගම්පහ	1	1
කළුතර	1	6
ගාල්ල	1	5
මාතර	3	5
හම්බන්තොට	2	3
මහනුවර	5	1
මාතලේ	4	-
නුවරඑළිය	3	-
කුරුණෑගල	7	-
කෑගල්ල	4	5
රත්නපුර	5	3
බදුල්ල	2	-
මොණරාගල	4	1
අම්පාර	2	-
අනුරාධපුර	-	-
පොලොන්නරුව	2	-
එකතුව	47	30

2018 වර්ෂයේ දිස්ත්‍රික්ක තුල ලියාපදිංචි පැල තවාන් වලින් නිකුත් කරන ලද පැළ ගණන් පහත දැක්වේ.

වගුව .4.2.1. 7. 2018 වර්ෂයේ ලියාපදිංචි පැළ තවාන් වලින් නිකුත් කළ පැළ

දිස්ත්‍රික්කය	නිකුත් කළ පැළ සංඛ්‍යාව
කොළඹ	239,969
ගම්පහ	375,483
කළුතර	1,241,231
ගාල්ල	4,146,242
මාතර	2,569,970
හම්බන්තොට	1,941,300
මහනුවර	348,941
මාතලේ	456,519
නුවරඑළිය	131,983
කුරුණෑගල	478,494
කෑගල්ල	751,780
රත්නපුර	4,319,014
බදුල්ල	474,060
මොණරාගල	461,680
අම්පාර	106,797
අනුරාධපුර	1,710
පොළොන්නරුව	35,369
එකතුව	18,080,542

වගුව.4.2.1.8. දිස්ත්‍රික්ක අනුව 2018 වර්ෂයේ සමස්ථ පැළ නිකුතුව

දිස්ත්‍රික්කය	ගම්මිරිස්	කුරුඳු	පැණිපිර	කොකෝ	සාදික්කා	කරාබු	කරදඹුංඉ	කොංකෝඩා	පුවක්	ගොරකා	ඉඟුරු(කිලෝ.)	කහ(කිලෝ.)	එකතුව
කොළඹ	72,404	154,075			1,300				13,490		5,545		241,269
ගම්පහ	304,341	203,350							42,403				550,094
කළුතර	240,398	994,800			237				73,980		7,935		1,309,415
ගාල්ල	244,762	3,932,560							1,220		15,173		4,178,542
මාතර	160,316	2,509,096							1,140				2,670,552
හම්බන්තොට	199,195	1,724,900	125,560		1,000	245			110,090		240	200	2,160,990
මහනුවර	345,348	37,600		4,710	6,441	586		525	22,611	3	555	5,480	417,824
මාතලේ	227,209	212,500		5,400	2,560	1,406		8,087	70,566				527,728
නුවරඑළිය	157,560			42,561	47	1,862	2,000		16,843	10			220,883
කුරුණෑගල	450,430	245,500			2,407			5,490	34,766	146			738,739
කෑගල්ල	440,901	434,350			2,840	2,023			20,330		2,319	330	900,444
රත්නපුර	470,275	3,597,600			148				238,605	200	6,575		4,306,828
බදුල්ල	232,485	99,600	274,400	16,310		1,795			28,310				652,900
මොණරාගල	267,905	130,900			45			16,200	62,040		145	1,985	477,090
අම්පාර	49,247	21,750							43,230		1,765	350	114,227
අනුරාධපුර	28,651	32,720							20,340				81,711
පොළොන්නරුව	77,213								27,390				104,603
එකතුව	3,968,640	14,331,301	399,960	68,981	17,025	7,917	2,000	30,302	827,354	359	40,252	8,345	19,627,881

4.2.1.2 නව වගා වැඩසටහන

මෙය අපනයන කෘෂි බෝග වගා වපසරිය ව්‍යාප්ත කිරීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද ප්‍රධාන වැඩසටහන් වලින් එකකි. පාංශු සහ ජල අවක්‍රමණය කර ගැනීම සඳහා වගා කරුවන් බිම් සැකසීමේ දී යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කළ යුතු වේ. ගම්මිරිස් , කුරුඳු , පැහිරි සහ කෝපි වගාවන් සඳහා වගාකරුවන් විසින් රෝපණ ද්‍රව්‍ය සඳහා වූ පිරිවැයෙන් 50% ක් පමණ ගෙවිය යුතු වන අතර සාදික්කා , කොකෝවා, කරාඹු සහ කරඳමුංගු පැළ 100% ක් කිසිදු අය කිරීමකින් තොරව නිකුත් කරනු ලබයි.

වගුව.4.2.1.2.1 2018 වර්ෂයේ නව වගා වැඩසටහනේ ආයෝජන උපකාර යෝජනා ක්‍රමය

බෝගය	පැළ ප්‍රමාණය (හෙ. 1 සඳහා)	පැළ සඳහා මුළු වටිනාකම (රුපියල්)	පැළ සඳහා දෙපාර්තමේන්තු ආයෝජනය (රුපියල්)	පැළ සඳහා ගොවියන්ගේ ආයෝජනය (රුපියල්)
කුරුඳු	9,000	117,000	58,500	58,500
ගම්මිරිස්	1,700	39,100	19,550	19,550
ඇරබිකා කෝපි	3,000	42,000	21,000	21,000
රොබස්ටා කෝපි	1,600	22,400	11,200	11,200
පැහිරි	28,000	56,000	28,000	28,000
සාදික්කා	250	25,000	25,000	-
කරඳමුංගු	2,000	20,000	2,000	-
කරාඹු	250	17,500	17,500	-
කොකෝවා(රබර් සමඟ)	10,000	14,000	14,000	-

2018 වර්ෂය සඳහා නව වගා හෙක්ටයාර 1030ක ප්‍රමාණයක් ඉලක්කගත කරන ලද අතර එම ඉලක්කය සාර්ථකව සපුරා ගන්නා ලදි. දිස්ත්‍රික්ක අනුව ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

වගුව.4.2.1.2.2. 2018 නව වගා වැඩසටහනේ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	කුරුඳු	ගම්මිරිස්	සාගිර	කෝපි	සාදික්කා	කරාබු	කොකෝඩා	කරදමුංගු	එකතුව
කොළඹ	11.70	4.60							16.30
කළුතර	74.10	7.70							81.80
ගම්පහ	18.55	20.90							39.45
ගාල්ල	139.79	1.98							141.77
මාතර	141.20	5.45							146.65
හම්බන්තොට	89.40	6.20	2.00						97.60
මහනුවර	4.11	41.00		1.30	5.5	1.8			53.71
මාතලේ	23.50	38.19		1.80	4	2.8	2.5		72.79
නුවරඑළිය	0.00	13.80		3.20		1.9		1.00	19.90
කෑගල්ල	39.40	36.40				6.80			82.60
රත්නපුර	88.35	31.15							119.50
බදුල්ල	7.60	38.70	9.80	1.60		1.60			59.30
මොණරාගල	7.40	43.08					16.20		66.68
කුරුණෑගල	18.70	41.00			5.40		3.00		68.10
අම්පාර	0.40	8.70							9.10
අනුරාධපුර	1.10	1.30							2.40
පොළොන්නරුව	0.00	2.90							2.90
එකතුව	665.30	343.05	11.80	7.90	14.90	14.90	21.70	1.00	1080.55

4.2.2. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන යටතේ '' පවතින ගම්මිරිස් සහ කුරුඳු වගාවන්හි ඵලදායිතාව ඉහළ නැංවීම'' සහ ''ධනසවිය ගෙවතු වගා සංවර්ධන වැඩසටහන'' යන උප වැඩසටහන් 02 දියත් කෙරිණි.

4.2.2.1: ගම්මිරිස් සහ කුරුඳු වගාවන්හි ඵලදායිතා වර්ධනය

2020 වර්ෂයේ දී අපනයන කෘෂිහෝග අපනයෙන් උපයන විදේශ විනිමය ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියනය සීමාවට ළඟාවීමේ වැදගත්කම සලකා බෝග ඵලදායිතාවට ප්‍රමුඛ භූමිකාවක් ලබා දෙන ලදි. 50% ආයෝජන ආධාර ක්‍රමය යටතේ පාළු පිහිටුවීම සඳහා රෝපණ ද්‍රව්‍ය සැපයීමෙන් සහ නියඟයෙන් සිදුවන අනතුරු අවම කිරීම සඳහා ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති සැපයීමෙන් සහ දැනුවත්භාවය වැඩිදියුණු

කිරීමෙන් අපනයන කෘෂිබෝග වගාකරුවන්ට සිය ගම්මිරිස් සහ කුරුඳු වගාවන්හි ඵලදායිතාවය වර්ධනය කර ගැනීම සඳහා සහයෝගය ලබා දීමේ අරමුණින් 2018 වර්ෂයේ දී ඵලදායිතා වර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

ගොවි පුහුණු පන්ති මඟින් වගාකරුවන්ට ගම්මිරිස් සහ කුරුඳුවල ඵලදායිතා වර්ධන සහ කෘෂිකාර්මික පුරුදු (GAP) සහ නිෂ්පාදන පුරුදු (GMP) පිළිබඳ විද්‍යාත්මක දැනුමක් ලබාදෙන ලදි. මේ අරමුණින් ව්‍යාප්ති කාර්ය මණ්ඩලයට දියුණු පුහුණු උපකරණ සපයනු ලැබිණි. අපනයන කෘෂිබෝග වගා ප්‍රදේශවල බහුල පාංශු ආම්ලිකතා ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය පාංශු නියැදි පරීක්ෂාව සහ පාංශු පෝෂණ කළමණාකරණය සඳහා ව්‍යාප්ති නිලධාරින් පී.එච්. (PH) වාචික භාවිතා කරන ලදි.

එක් වහලක් යට ව්‍යාප්ති සහ වෙනත් කෘෂි සේවා සැපයීම සඳහා ගම්මිරිස් සහ කුරුඳු වල ඵලදායිතා වර්ධනය පිළිබඳ ගොවි සායන, මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්වලට අවස්ථාව උදා කර ගැණිනි. මෙම වැඩසටහන් ගොවීන්ගේ සහ කෘෂිකර්මයට සම්බන්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල ක්‍රියාශීලී සහභාගීත්වය සහිතව ඉහළ විභව්‍යතාවයකින් යුතු ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලදි. පලිබෝධ සහ රෝග, පැළෑටි, පෝෂණ වැනි ක්ෂේත්‍ර ගැටළු නිරාකරණය කරගැනීම සඳහා පර්යේෂණ විශේෂඥයින්ගේ සේවය එහිදී ලබාගත හැකිවිය. එය පාංශු නියැදි සහ අපනයන කෘෂි බෝග නිෂ්පාදන වල ගුණාත්මකභාවය පරීක්ෂා කර ගැනීමට අවශ්‍ය පහසුකම් ගොවීන්ට ලබා දෙනු ලැබිණි. පෞද්ගලික අංශය නියෝජනය වූයේ පොහොර, කෘෂී රසායන, පලිබෝධ කළමනාකරණ සහ ක්ෂුද්‍ර වාරිමාර්ග වැනි ක්ෂේත්‍ර මඟින්ය.

වගුව .4.2.2.1. ඵලදායිතා වර්ධන වැඩසටහනේ ප්‍රගතිය- 2018

දිස්ත්‍රික්කය	පාළු සිටුවීම						ගොවි සායන		ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති
	ගම්මිරිස්	හිඟුන් කරන ලද පැළ	කුරුඳු	හිඟුන් කරන ලද පැළ	එකතුව (හෙක්.)	හිඟුන් කරන ලද මුළු පැළ සංඛ්‍යාව	සංඛ්‍යාව	සහභාගිත්වය	
කොළඹ	1.4	680	6.7	15375	8.1	16055	1	258	
ගම්පහ	12.8	3790	7.5	9750	20.3	13540	1	436	9
කළුතර	1	400	15.2	18800	16.2	19200	1	260	
ගාල්ල	0		168.5	84360	168.5	84360	1	232	
මාතර	0		41.2	39023	41.2	39023	1	409	
හම්බන්තොට	0		31.2	44500	31.2	44500	1	226	5
මහනුවර	1.2	640	0		1.2	640	1	247	
මාතලේ	40.6	12460	0.6	1000	41.2	13460	1	395	
නුවරඑළිය	2	860	0		2	860	1	267	1
කුරුණෑගල	21.2	11500			21.2	11500	1	300	4
කෑගල්ල	7	3510	4	10750	11	14260	1	381	1
රත්නපුර	2.8	1770	7.2	12950	10	14720	1	300	2
බදුල්ල	10.9	4025	2.1	3200	13	7225	1	320	
මොණරාගල	4.9	3430	0		4.9	3430	1	265	1
අම්පාර					0	0			
අනුරාධපුර					0	0			1
පොළොන්නරුව					0	0	1	436	2
එකතුව	104.4	42385	277.5	224333	381.9	266718	15	4,474	26

4.2.2.2. "ධනසවිය" අපනයන කෘෂිබෝග පදනම් වූ ගෙවතු වගා වැඩසටහන

මෙම වැඩසටහන ආරම්භ කරන ලද්දේ අපනයන කෘෂිකාර්මික බෝග ප්‍රමුඛ වූ ගෙවතු ස්ථාපනය කිරීම සඳහා කාන්තාවන්ට සහය දැක්වීම මඟින් ඔවුන්ගේ ආර්ථිකය ඉහළ නැංවීම උදෙසාය.මෙහි ඉලක්කය වූයේ කාන්තාවන්ගේ ක්‍රියාශීලී සහභාගීත්වයෙන් පොකුරු ගම්මාන ප්‍රවේශයක් තුලින් කුඩා පරිමාණ අපනයන කෘෂිභෝග අංශයේ සමස්ථ වර්ධනයකි.අපනයන කෘෂිබෝග මත පදනම් වූ ගෙවතු වගා නිෂ්පාදනය ජාතික ආර්ථිකයට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෙවතු වගාවන්හි අපනයන කෘෂිබෝගයන්හි සංයුතිය 4.2.2.2.1 වගුව දැක්වේ.

වගුව: 4.2.2.2.1. අපනයන කෘෂිභෝග පදනම් වූ ගෙවතුවල බෝග සංයුතිය – 2018

ගෙවතු වර්ගය	ගම්මිරිස්	කුරුඳු	පුවක්	සාදික්කා	කරාඹු	කෝපි	පැණිරි	ගොරකා	කහ	ඉඟුරු	සාමාන්‍යය
ගම්මිරිස්	30-80	-	-	-		-	-	-	-	-	ගම්මිරිස් -40
කුරුඳු	-	300-500	-	-	-	-	-	-	-	-	කුරුඳු -500
සාදික්කා	-	-	-	(3-10)	-	-	-	-	-	-	සාදික්කා- 5
කරාඹු	-	-	-		(3_10)	-	-	-	-	-	කරාඹු - 5
පුවක්	-	-	(50-100)	-	-	-	-	-	-	-	පුවක් -80
කෝපි /ගම්මිරිස්	(0-10)	-	-	-	-	(50-100)	-	-	-	-	කෝපි -60 / ගම්මිරිස් -10
පැණිරි	-	-	-	-	-	-	100	-	-	-	පැණිරි - 1000
ගොරකා	-	-	-	-	-	-	-	5	-	-	ගොරකා - 5
කහ	-	-	-	-	-	-	-	-	30	-	කහ -30kg
ඉඟුරු	-	-	-	-	-	-	-	-	-	40	ඉඟුරු - 40 kg

බෝග සංයුතිය තෝරාගනු ලැබුවේ ප්‍රතිලාභීන්ගේ කැමැත්ත මෙන්ම ප්‍රදේශයේ දේශගුණික යෝග්‍යතාවයද පදනම් කරගෙනය. සියළුම ප්‍රතිලාභීනියන්ට ගෙවතු වගාවේ යහපත් කෘෂිකාර්මික පුරුදු (GAP) සහ ඔවුන් දැනට පවත්වාගෙන යන ගෙවතු වල ඵලදායිතා වර්ධනය පිළිබඳව පුහුණු කරන ලදි.

මෙම ධනසවිය වැඩසටහන 2016 වර්ෂයේ දී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙනු ලැබුවේ ගෙවතු 50000ක් ඇති කිරීම ඉලක්ක කරගෙනය. 2017 වර්ෂයේ දී ගෙවතු 140904 ක් ඇති කරන ලදි. 2018 වර්ෂයේ දී ගෙවතු 121302 ක් ඉලක්කගත කර ගැනුණු අතර ගෙවතු 125910 ක් සාර්ථකව සම්පූර්ණ කරන ලදි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරින් සහ සංවර්ධන නිලධාරින් විසින් මෙම ඉලක්කය සාර්ථකව සම්පූර්ණ කරගෙන ඇත.

වගුව .4.2.2.2.2. ධනසවිය ගෙවතු සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය -2018

දිස්ත්‍රික්කය	ස්ථාපිත ගෙවතු											
	ගම්මිරිස්	කුරුඳු	සාදික්කා	කරාඹු	පුවක්	පැණිරි	ගොරකා	ගම්මිරිස් සමඟ පුවක් /කෝපි	කොකෝඩා	කහ	ඉඟුරු	එකතුව
කොළඹ	1,695	53	424		42						142	2,356
ගම්පහ	6,738	33			43						0	6,814
කළුතර	6,604	580	77		108			736			194	8,299
ගාල්ල	5,743	4,517			5						435	10,700
මාතර	4,321	1,973			26							6,320
හම්බන්තොට	2,401	1,700	200	49	51	71		3739		10	12	8,233
මහනුවර	8,730	1	1159	38	138			13		16	146	10,241
මාතලේ	5,723	-	0		0	0	0	0		0	0	5,723
නුවරඑළිය	4,059	-	4	334	7			665				5,069
කුරුණෑගල/ පුත්තලම	12,502	158	255		123		63	508	63			13,672
කෑගල්ල	10,781	121	753	88	179					11	68	12,001
රත්නපුර	12,971	5,525	30		599		1	1793			165	21,084
බදුල්ල	4,884	56		279	146			230				5,595
මොණරාගල	4,971	126	14		96					4	56	5,267
අම්පාර	975	36			562					58	9	1,640
අනුරාධපුර	839	28			27							894
පොළොන්නරුව	1,944	-			6			52				2,002
එකතුව	95,881	14,907	2,916	788	2,158	71	64	7,736	63	99	1,227	125,910

වගුව: 4.2.2.2.3: ධනසවිය ගෙවතු සංවර්ධන වැඩසටහනේ පැළ නිකුත් කිරීම් -2018

දිස්ත්‍රික්කය	ගම්මිරිස්	කුරුළු	පැණිරි	ඉඟුරු	සාදික්කා	කරාබු	කරඳමුංගු	කොකෝවා	පුවක්	ගොරකා	එකතුව
කොළඹ	63,904	33,400			1,300				7,380		105,984
ගම්පහ	263,536	18,750							32,678		314,964
කළුතර	226,908	309,100			237				13,715		549,960
ගාල්ල	240,887	2,558,350							1,220		2,800,457
මාතර	151,051	1,196,273							1,140		1,348,464
හම්බන්තොට	188,655	875,800	71,000		1,000	245			91,495		1,228,195
මහනුවර	275,008	600		810	5,066	136		525	10,096	3	292,244
මාතලේ	148,780	1,000			1,560	706		7,000	43,960		203,006
නුවරඑළිය	133,240			32,961	47	1,387			3,575	10	171,220
කුරුණෑගල/ පුත්තලම	365,815	77,200			1,057			2,190	11,466	146	457,874
කෑගල්ල	375,515	69,000	-	-	2,840	323	-	-	15,080	-	462,758
රත්නපුර	415,550	2,789,500			148				164,960	200	3,370,358
බදුල්ල	162,670	28,000		11,510		1,395			8,810		212,385
මොණරාගල	196,415	64,300			45				42,820		303,580
අම්පාර	34,457	18,150							28,840		81,447
අනුරාධපුර	27,291	22,820							11,030		61,141
පොළොන්නරුව	70,753								2,090		72,843
එකතුව	3,340,435	8,062,243	71,000	45,281	13,300	4,192	-	9,715	490,355	359	12,036,880

4.2.3. බෝග අගය එකතු කිරීමේ වැඩසටහන

අපනයන කෘෂිබෝගයන්ට අගය එකතු කිරීම තුළින් විදේශ ආදායම ඉහළ නැංවීම සහ නව වෙළෙඳපොළ සොයාගැනීම මෙම වැඩසටහනේ අරමුණයි. මෙම වැඩසටහන අතුරු වැඩසටහන් දෙකකින් සමන්විත විය. මෙම අංශයේ ව්‍යාපාර උපදේශන ඒකකය මඟින් මෙම අතුරු වැඩසටහන් යුගලය ක්‍රියාත්මක කරන ලදි.

4.2.3.1. ගුණාත්මක සංවර්ධනය

ගොවීන්ට තම නිෂ්පාදිත අපනයන කෘෂි භෝගයන්හි ගුණාත්මක තත්ත්වය මැන බැලීමට සහය දීම සඳහා ව්‍යාප්ති නිලධාරීන් හට ගුණාත්මක මැනුම් උපකරණ සපයන ලදි.

4.2.3.2. කාබනික ගම්මාන ස්ථාපනය කිරීම.

කාබනික අපනයන කෘෂි බෝග සඳහා ජාත්‍යන්තර වෙළඳපොලෙහි වැඩිවන ඉල්ලුම සපුරා ගැනීම සඳහා කාබනික සහතිකකරණය ලබා ගැනීමට පහසුකම් සලසනු වස් කාබනික ගම්මාන ඇති කිරීම මෙම වැඩසටහන යටතේ ක්‍රියාවට නංවන ලදි. මෙම කාර්යය සඳහා ඇතැම් අපනයන කෘෂි බෝග වගාවන් කාබනික වගාවන් බවට පරිවර්තනය කරන ලදි. කාබනික ගොවිතැනෙහි ලක්ෂණ පිළිබඳව වගාකරුවන් පුහුණු කරන ලද අතර ජාත්‍යන්තරව පිළිගැනුණු කාබනික සහතිකය ලබා ගැනීම වෙනුවෙන් සහතිකකරණය සඳහා වැය වන වියදමින් 50%ක් ලබා දෙමින් ගොවි සංවිධානයන්ට සහය විය.

වගුව .4.2.3.2.1.කාබනික ගම්මාන වැඩසටහනේ ප්‍රගතිය– 2018

දිස්ත්‍රික්කය	ප්‍රධාන භෝගය/ භෝග	පළමු වාරිකය (2018)		දෙවන වාරිකය (2017ඉතිරි කොටස)	
		ප්‍රතිලාභීන්	හෙක්	ප්‍රතිලාභීන්	හෙක්
කළුතර	කුරුඳු	11	4.4	75	23.2
මහනුවර	ගම්මිරිස්/ සාදික්කා/ කරාඹු	6	3.8	159	43.3
මාතලේ	ගම්මිරිස්/ සාදික්කා/ කරාඹු	41	17.3	78	75
කුරුණෑගල	ගම්මිරිස්	57	20	83	35
නුවරඑළිය	ගම්මිරිස්	61	14.5	15	4
ගම්පහ	ගම්මිරිස්	9	10.2	23	13
කෑගල්ල	/ ගම්මිරිස් / කරාඹු	32	10.9	35	12.4
බදුල්ල	ගම්මිරිස්	64	33	56	17.9
රත්නපුර	ගම්මිරිස්/ කුරුඳු	41	10.8	36	9.35
එකතුව		322	124.9	560	233.15

4.2.3.3. යහපත් කෘෂිකාර්මික පුරුදු (GAP) සහ යහපත් නිෂ්පාදන පුරුදු (GMP) ජනප්‍රිය කරවීම.

පුහුණු කිරීම මඟින් අපනයන කෘෂිබෝග පාර්ශවකරුවන්ගේ යහපත් කෘෂිකාර්මික පුරුදු (GAP) සහ යහපත් නිෂ්පාදන පුරුදු(GMP) පිළිබඳ අවබෝධය මෙම වැඩසටහන යටතේ වර්ධනය කරන ලදි.පවතින පසු අස්වනු පිරි සැකසුම් මධ්‍යස්ථාන වල ප්‍රමිතිය ඉහළ නැංවීමේ අරමුණින් අපේක්ෂිත මට්ටමට සරිලන සේ තමන්ගේ පිරි සැකසුම් ක්‍රමවේදයන් වැඩිදියුණු කර ගැනීම සඳහා එම මධ්‍යස්ථාන හිමියන් දිරි ගන්වන ලදි. ඉහත වැඩසටහන යටතේ යහපත් නිෂ්පාදන පුරුදු වලට අදාල ප්‍රමිතීන්ට ගැලපෙන අයුරින් පිරි සැකසුම් මධ්‍යස්ථාන 03 ක් වැඩිදියුණු කරවන ලදි.

4.2.3.4. පසු අස්වනු යන්ත්‍රෝපකරණ හා පිරිසැකසුම් ක්‍රමවේද භාවිතය වැනි උචිත තාක්ෂණය භාවිතයෙන් අස්වනු ප්‍රශස්තිකරණය.

ආයෝජන අනුග්‍රාහකත්වය මඟින් අපනයන කෘෂි බෝගයන්හි අවසාන නිෂ්පාදිතයේ ගුණාත්මක බව වර්ධනය කිරීම හා එම පද්ධතියේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම උදෙසා උසස් ප්‍රමිතියෙන් යුක්ත යන්ත්‍රෝපකරණ මිල දී ගැනීමට ගොවියන්ට උපකාර කළ අතර පිරිසැකසුම් මධ්‍යස්ථාන පිහිටුවන ලදි.මල නොබැඳෙන වානේ වලින් තැනූ පිරිසැකසුම් ඒකක සඳහා පමණක් මෙම ආයෝජන සහනය ලබා දෙන ලදි. ජාත්‍යන්තර ආහාර ප්‍රමිතීන් හා සම සමව සිටීමට දිරිගැන්වීම උදෙසා ඔවුනට අත දීමක් වශයෙන් මෙම පියවර ගන්නා ලදි.

වගුව. 4.2.3.4.1. උචිත තාක්ෂණය භාවිතයෙන් අස්වනු ප්‍රශස්තිකරණයේ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	පිරි සැකසුම් ඒකක					
	යන්ත්‍රෝපකරණ			පිරි සැකසුම් මධ්‍යස්ථාන		
	වියළනයන් (බහුබෝග)	කෝපි පල්පය	තෙල් ආසවන ඒකක	කුරුඳු පිරිසැකසුම් මධ්‍යස්ථාන		කෝපි පිරිසැකසුම් මධ්‍යස්ථාන
				මධ්‍යම	කුඩා	කුඩා
මහනුවර	2					
මාතලේ	1					
නුවරඑළිය		1				1
කුරුණෑගල					1	
ගාල්ල	1		9	1	5	
මාතර			4	1	4	
හම්බන්තොට				1	1	
බදුල්ල			1	1		
මොණරාගල						
කෑගල්ල						
රත්නපුර			1		3	
කොළඹ						
කළුතර			1	2	4	
ගම්පහ	4			1	1	
එකතුව	8	1	16	7	19	1

4.2.3.5. වෙලෙඳ ප්‍රවර්ධනය

අපනයන කෘෂිකාර්මික බෝග සහ ඒවායේ වැදගත්කකම මෙන්ම වෙළඳාමේ වර්තමාන වර්ධනයන් පිළිබඳව ජනතා අවබෝධය ඉහළ නැංවීමේ අරමුණින් 2018 වර්ෂයේ මහා පරිමාණ වැඩසටහන් 02ක් දියත් කෙරිණි. මාතර ප්‍රදේශයේ කුරුඳු සතියක් ප්‍රකාශයට පත් කෙරුණු අතර මීට සමගාමීව වාර්තාගත ප්‍රේක්ෂකයන් සංඛ්‍යාවක් සහභාගී වූ ප්‍රදර්ශනයක් ද පැවැත්විණි. කුරුඳු ගොවි සමාජවල සහභාගීත්වයෙන් ගාල්ලේ පිහිටි සීනිගම දේවාලයේ වාර්ෂික නැවුම් කුරුඳු මංගල්‍යය සාර්ථකව පවත්වන ලදි.

වගුව.4.2.3.5.1. කුරුඳු සතියේ ප්‍රගතිය

දිනය	ස්ථානය	වැඩසටහන/ක්‍රියාකාරකම	සහභාගී වූවන් ගණන
2018.05.07	පල්ලෙබැද්ද / රත්නපුර	සතිපොළෙහි පැවැත් වූ කුරුඳු වගා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	552
2018.05.07	කඹුරුපිටිය	කුරුඳු ඵලදායිතා සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍ර දින සංවර්ධන වැඩසටහන	53
2018.05.07	ඇත්කඳුර (ගාල්ල)	ක්ෂේත්‍ර දින සංවර්ධන වැඩසහටන	86
2018.05.08	හඳුගල (හම්බන්තොට)	ක්ෂේත්‍ර දින සංවර්ධන වැඩසහටන	110
2018.05.08	අගලවත්ත (කළුතර)	කාබනික කුරුඳු පිළිබඳව ක්ෂේත්‍ර දින වැඩසටහන	79
2018.05.08	අලුත්වෙල (ගාල්ල)	කුරුඳු ඵලදායිතා සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍ර දින සංවර්ධන වැඩසටහන	46
2018.05.08	දෙහියන්දර (මාතර)	සතිපොළෙහි පැවැත් වූ කුරුඳු වගා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	202
2018.05.08	කොළොන්න (රත්නපුර)	ගොවි සායන වැඩසටහන	104
2018.05.09	කුරුඳු පර්යේෂණ කාර්යාලය (මාතර)	කුරුඳු සම්බන්ධව ප්‍රාදේශීය තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම රැස්වීම.	80
2018.05.10	මාතර	කුරුඳු වගාකිරීම , පිරිසැකසුම, සහ අගය එකතු කිරීම පිළිබඳ ප්‍රදර්ශනය	905
2018.05.11	මාතර	කුරුඳු වගාකිරීම පිරිසැකසුම සහ අගය එකතු කිරීම පිළිබඳ ප්‍රදර්ශනය	1557

4.2.4. ජනමාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන

4.2.4.1 ජනමාධ්‍ය වැඩසටහන

මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වනුයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියළුම පර්යේෂණ ක්‍රියාකාරකම් , ප්‍රවර්ධනය සහ නවතම විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සහ ප්‍රදර්ශන මාර්ගයෙන් අපනයන කෘෂිබෝග පාර්ශවකරුවන් වෙත ප්‍රචාරණය කිරීමයි. සියළු පහසුකම් වලින් සුසැදි මාධ්‍ය සහ සන්නිවේදන ඒකකයක් සහ සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් මෙම අංශය සතුවේ. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටිය බොහෝ ප්‍රදර්ශන වලදී එහි ඇති කලාත්මක බව හා තොරතු රු විස්තර කරන ආකාරය හේතුවෙන් සම්මානයට පාත්‍ර වී තිබේ.

වගුව.4.2.4.1. ජනමාධ්‍ය වැඩසටහනේ ප්‍රගතිය

මාධ්‍යය	ක්‍රියාකාරකම්	ප්‍රගතිය(වැඩසටහන් ගණන)
මුද්‍රිත මාධ්‍යය	සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් මුද්‍රිත අත්පත්‍රිකා කුළුබඩු අංශය කෙරෙහි වැඩි කැමැත්තක් දක්වන්නා වූ මහජනතාව අතර බෙදා දීම.	296,189
	ජාතික මට්ටමෙන් පවත්වන ලද විශේෂ ප්‍රදර්ශන සහ වෙනත් උත්සව අවස්ථාවන්හිදි විශාල පුවරු නිර්මාණය කර ප්‍රදර්ශනය කරන ලදි.	70
	සෑම සිකුරාදා දිනකම දිනමිණ. ජාතික පුවත්පතෙහි අපනයන කෘෂිබෝගයන්හි සාමාන්‍ය මිල ගණන් පළ කරන ලදි.	51
විද්‍යුත් මාධ්‍ය - රූපවාහිනිය	සෑම මසකම දෙවන සහ හතරවන සිකුරාදා දිනයන්හි ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ "සැඟවුණු කහවණු" වැඩසටහන විකාශනය වීම.	24
	සෑම මසකම පළමු හා තුන්වන දිනයන්හි ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ පෙ.ව. 7.15 ට "රන්මසු උයන" වැඩසටහන නිෂ්පාදනය නොට විකාශනය කිරීම.	08
	සෑම මසකම පළමුවන ඉරිදා දිනයෙහි පස්වරු 9.30 ට පමණ චැනල් අයි නාලිකාව ඔස්සේ "කුළුබඩු සහරාව"වාර්තාමය වැඩසටහනක් විකාශනය කිරීම.	07
විද්‍යුත් මාධ්‍ය ගුවන් විදුලිය	රස ජනනී වැඩසටහන සෑම සෙනසුරාදා දිනයකම ප.ව .4 00 ට කඳුරට සේවය (fm 107.3)ඔස්සේ ද ප.ව. 04.30 ට රුහුණු සේවය (fm 107.3), වෙළඳ සේවය (fm 94.3) රජරට සේවය (fm 107.3) වයඹ සේවය (fm 90.1) ඔස්සේ ද එකවර විකාශනය කිරීම..	49
	"සෑම ඉරිදා දිනකම ප.ව. 08.00 ට ITN සේවය ඔස්සේ රස මංජරී වැඩසටහන විකාශනය කිරීම.	43
	සෑම මසකම පළමු හා තුන්වන බ්‍රහස්පතින්දා දිනයන්හි පෙව 10.00 ට කෘෂි fm වෙබ් ගුවන් විදුලි වැඩසටහන වෙබ් විකාශනය කිරීම.	24
ප්‍රදර්ශන (ජාතික මට්ටම)	ප්‍රදර්ශන කුටි නිර්මාණය සහ සවි කිරීම.	15

4.2.4.2 කුළුබඩු උද්‍යාන ව්‍යාපෘතිය

මාතලේ පර්යේෂණ මධ්‍යස්ථාන පරිශ්‍රයේ දී අපනයන කෘෂි බෝග වගා කිරීමේ විද්‍යාත්මක ක්‍රමවේදයන් ආදර්ශනය කිරීමට සහ දේශීය ජනතාව හා විදේශීය සංචාරකයන්ගේ ආකර්ශණය ලබා ගැනීම පිණිස කුළුබඩු උද්‍යානයක් ප්‍රතිස්ථාපනය කිරීම.

4.2.5. ශක්‍යතා සංවර්ධන වැඩසටහන

4.2.5.1. ගොවියන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම.

ඉලක්කගත නිෂ්පාදන ඵලදායිතාව හා අවසානයේ දී ඉහළ ආදායමක් අත්කර ගැනීම සඳහා ගොවීන් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහ යහපත් කළමණාකරණ පිළිවෙත් පිළිබඳ විද්‍යාත්මක දැනුමෙන් සන්නද්ධ කළ යුතුය. ක්ෂේත්‍ර මට්ටමෙන් මෙම වගකීම ඉටු කිරීමේ කාර්යය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්යය මණ්ඩලයට පවරනු ලැබ ඇත. ගොවි පුහුණු පන්ති හා ක්ෂේත්‍ර දින හරහා ඔවුහු අපනයන කෘෂි බෝගයන්හි සියළුම අංශ පිළිබඳව සියළු තාක්ෂණික දැනුම වගාකරුවන්ට හා වෙනත් අපනයන කෘෂි බෝග අංශයේ නියැලි සිටින පුද්ගලයන්ට බෙදා හරිති. දිස්ත්‍රික්ක වලින් ලබාගත් සනාථ කරන ලද දත්ත වලින් ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවකගේ සහභාගීත්වය තහවුරු වේ.

වගුව .4.2.5.1.1. 2018 වර්ෂය තුළ පවත්වන ලද ගොවි පුහුණු වැඩසටහන් වල සහ ක්ෂේත්‍ර දිනවල ප්‍රගතිය

දිස්ත්‍රික්කය	පුහුණු පන්ති				ක්ෂේත්‍ර දින				ධනසවිය			
	යහපත් කෘෂිකාර්මික පුරුදු හා යහපත් කළමනාකරණ පුරුදු				යහපත් කෘෂිකාර්මික පුරුදු හා යහපත් කළමනාකරණ පුරුදු							
	පුහුණු වැඩසටහන් සංඛ්‍යාව		ප්‍රතිලාභීන් සංඛ්‍යාව		පුහුණු වැඩසටහන් සංඛ්‍යාව		ප්‍රතිලාභීන් සංඛ්‍යාව		පුහුණු වැඩසටහන් සංඛ්‍යාව		ප්‍රතිලා භීන් සංඛ්‍යාව	
	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
කොළඹ	30	33	600	727	6	6	120	168	48	67	1440	1364
ගම්පහ	190	191	5700	4879	44	41	1350	1175	170	199	7200	7504
කළුතර	125	103	3559	2818	16	15	320	471	110	156	4400	4405
ගාල්ල	220	136	4400	4275	7	15	140	639	150	234	6000	7678
මාතර	30	34	700	1237	10	8	250	462	130	136	6944	5048
හම්බන්තොට	55	43	1000	1417	15	12	0	701	105	162	11250	8081
මහනුවර	175	210	3480	6573	4	31	120	1314	120	190	3600	6419
මාතලේ	113	116	3390	2930	11	17	220	378	191	185	5760	4820
නුවරඑළිය	62	60	1550	1968	35	49	875	1424	134	136	4020	4648
කුරුණෑගල	210	155	4200	4592	4	15	80	356	260	283	8800	10349
කෑගල්ල	45	76	800	2122	7	20	140	804	300	321	1200	10636
රත්නපුර	77	98	2200	3315	22	37	660	1098	220	313	13200	13127
බදුල්ල	120	136	2200	3369	30	32	600	887	220	223	6000	6250
මොණරාගල	90	57	2000	1305	20	14	400	329	100	88	4000	2447
අම්පාර	12	15	280	376	7	5	140	207	70	82	3000	3505
අනුරාධපුර	20	10	400	446	4	0	120	0	40	57	1400	2648
පොළොන්නරුව	8	8	240	359	4	2	80	130	100	76	3000	2493
එකතුව	1593	1493	36924	43096	248	323	5655	10588	2488	2944	92014	102259

4. 2.5.2 මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානය

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවාස්ථ පුහුණු මධස්ථානයේ දී දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ මෙන්ම වෙනත් රාජ්‍ය සහ පෞද්ගලික සංවිධානවල නිලධාරින්ගේ හැකියාවන් සහ වෘත්තිය නිපුණතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. තව ද අපනයන කෘෂිබෝග අගය දාමයේ බොහෝ පාර්ශවකරුවන් ද 2018 වර්ෂය තුළ දී පුහුණු කෙරිණි. (වගුව 4.2.5.2.1)

වගුව.4.2.5.2.1. මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත් වූ පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන්	මුළු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරින් පුහුණු කිරීම	15	492
වෙනත් ආයතනවල ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල පුහුණු කිරීම	7	381
ව්‍යවසායකත්ව පුහුණුව	11	496
වෙනත් ආයතන(විශ්ව විද්‍යාල, කෘෂිකර්ම විද්‍යාල, මහවැලි අධිකාරිය, ආරක්ෂක අමාත්‍යාංශය)	20	679
සමුළු , වැඩමුළු	13	526
එකතුව	66	2,574

4.2.6. වෙනත් වැඩසටහන්

4.2.6.1. බිම්මල් වගා වැඩසටහන

මෙම වැඩසටහන ආරම්භ කරන ලද්දේ බිම්මල් වගාව සම්බන්ධයෙන් තාක්ෂණය අත් කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසා දීම මඟින් හා බිම්මල් ගෘහ නිර්මාණය කිරීම සඳහා ආයෝජන සහය ලබා දීම මඟින් ග්‍රාමීය ජනතාවගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම පිණිසය. මෙම වැඩසටහන ආරම්භ කිරීම සහ අරමුදල් සැපයීම ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය මඟින් සිදු කළ අතර ව්‍යාප්ති නිලධාරින් විසින් ක්‍රියාවට නංවන ලදි. ඉහත වැඩසටහන යටතේ බිම්මල් ගෘහ 09ක් පමණ නිර්මාණය කරන ලදි.

4.2.6.2. අන්නාසි වගා වැඩසටහන

මෙම වැඩසටහන ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් අරමුදල් යොදවා ආරම්භ කරන ලද්දේ අන්නාසි වල අපනයන පරිමාව සහ ඉන් උපයන ආදායම ඉහළ නැංවීමට සහ වගාකරුවන් හට ආදායමක් නිර්මාණය කර දීමේ අරමුණින් ය. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ත කාර්ය මණ්ඩලය විසින් එය ක්‍රියාත්මක කළ අතර ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් අරමුදල් සපයන ලදි. මෙම වැඩසටහන කුරුණෑගල, ගම්පහ සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි දියත් කරනු ලැබූ අතර හෙක්ටයාර 128.08 ක ප්‍රමාණයක ප්‍රතිලාභීන් 129 ක් සමඟ අන්නාසි වගා කරන ලදි.

4.2.6.3. ගංවතුරින් සිදු වූ හානි සඳහා වන්දි ගෙවීමේ විස්තර - 2017

ගාල්ල , මාතර , කළුතර, හම්බන්ටෙ සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි 2017 වර්ෂයේ බොහෝ කුරුඳු හා ගම්මිරිස් වගාවන් , අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ තවාන් සහ පිරිසැකසුම් මධ්‍යස්ථාන උග්‍ර ගංවතුර හේතුවෙන් හානියට පත්විය. හානියට පත් වගාවන් සඳහා නොමිලේ වගා ද්‍රව්‍ය සපයන ලදි. තවද අපනයන කෘෂිබෝග හානියට පත් සියළුම ගොවියන්ට , පැළ තවාන් කරුවන්ට සහ පිරිසැකසුම් කරුවන් හට රුපියල් මිලියන 19.2 ක වන්දියක් පිරිනමන ලදි. කුඩා කර්මාන්ත අමාත්‍යාංශය මඟින් මේ සඳහා අරමුදල් සපයන ලදි.

වගුව.4.2.6.3.1 ගංවතුරින් සිදු වූ හානි සඳහා වන්දි ගෙවීමේ විස්තර

දිස්ත්‍රික්කය	වගාව		පැළ තවාන්		පිරිසැකසුම් මධ්‍යස්ථාන		පාළු පැළ සිටුවීම සඳහා පැළ නිකුතුව		එකතුව
	අංකය	වන්දිය, රු	අංකය	වන්දිය රු	අංකය	වන්දිය රු	ප්‍රතිලාභීන්	පැළ වල වටිනාකම රු	
කළුතර	40	1,229,050.0	3	582,400.0			34	571,343.0	2,382,830.0
රත්නපුර	48	1,298,100.0	6	739,800.0					2,037,906.0
ගාල්ල	371	7,560,850.0	6	735,500.0			404	2,740,850.0	11,037,610.0
මාතර	71	982,150.0	13	1,301,300.0	1	75,000.0	398	521,885.0	2,880,747.0
හම්බන්තොට			4	3,144,600.0					944,600.0
එකතුව	530	11,070,150.0	32	6,503,600.0	1	75,000.0	836	3,834,078.0	19,283,693.0

4.2.6.4. දුම්කොළ වෙනුවට ආදේශක බෝගයක් ලෙස ගම්මිරිස් වගාව හඳුන්වා දීම.

ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන යටතේ දුම්කොළ වෙනුවට ගම්මිරිස් වගා කිරීමේ වැඩසටහන ජනාධිපති ලේකම් කාර්යාලයේ මූල්‍ය අනුග්‍රහයෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සාර්ථකව ක්‍රියාවට නංවන ලදි. ජනාධිපතිතුමාගේ මතින් තොර රටක් යන සංකල්පය හා සමගාමීව නිර්මාණය වුණු මෙම වැඩසටහන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර හා මැදදුම්බර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල පවත්වනලදි. දුම්කොළ වගාකරුවන්ගේ අවබෝධය පිණිස පුහුණු වැඩසටහන් කීපයක් සංවිධානය කරන ලද අතර ගම්මිරිස් වගාව සඳහා ගොවියන් හට වැය කිරීමට සිදු වූ සැබෑ පිරිවැය මත පදනම් ව තෝරා ගත් ගොවීන් හට 50% ක මුදලක් ලබා දෙන ලදි. මීට අමතරව තෝරාගත් ගොවියන් හට ගුණාත්මක බව සහතික කරන ලද රෝපණ ද්‍රව්‍ය බෙදා දුන් අතර බිම් සැකසීම සහ වගා කිරීම ඇතුළත් ගම්මිරිස් වගාව සම්බන්ධ රෝපණ පුරුදු ආසන්නව නිරීක්ෂණය කරන ලදි. එසේම ගම්මිරිස් වගාවට දේශගුණික වෙනස්කම් වල බලපෑම අඩුකිරීම යන පරමාර්ථය මුල් කොට ගෙන ඉහත සඳහන් තෝරා ගත් ගොවීන් හට ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති හඳුන්වා දෙන ලදි. තවදුරටත් තද නියං තත්ත්වයවන් හි දී භාවිත කිරීම සඳහා ජලය රැස්කර තබා ගැනීමට සෑම ගම්මිරිස් වගා බිමකටම ප්ලාස්ටික් ජල ටැංකි නොමිලේ ලබා දෙන ලදි. රුපියල් මිලියන 17.99 ක ප්‍රතිපාදන ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා දුන් අතර අවසානයේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 17.58 කි.

වගුව.4.2.6.4. 1.දුම්කොළ වෙනුවට ආදේශක බෝගයක් ලෙස ගම්මිරිස් වගාව හඳුන්වා දීම.

ක්‍රියාකාරකම	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**	**මූල්‍ය ප්‍රගතිය රු .මිලියන**
ගොවි පුහුණු	185	0.17
මූල්‍ය ආධාර	185	12.42
ජල ටැංකි	300	2.50
කාන්දු ජල සම්පාදනය	13	1.70
ක්ෂේත්‍ර දින වැඩසටහන්		0.02
උපකරණ මිලදී ගැනීම		0.32
පරිපාලන වියදම්		0.41
එකතුව		17.58

පර්යේෂණ
ஆராய்ச்சி
Reaserch















5. පර්යේෂණ අංශය

5.1 පර්යේෂණ අංශයේ තාක්ෂණික ක්‍රියාකාරිත්වය හා සංවිධානය

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන පර්යේෂණ අංශයට අපනයන කෘෂිකර්ම භෝග පිළිබඳව පර්යේෂණ ඒකකය, ආර්ථික පර්යේෂණ ඒකකය හා පැලෑටි සංරක්ෂණ ඒකකය යන ප්‍රධාන ඒකක තුනක් අයත් වේ. අපනයන කෘෂි භෝග වල නිෂ්පාදනය, ඵලදායීතාවය හා ගුණාත්මක භාවය වැඩි දියුණු කරනු පිණිස ගොවීන්ගේ ගැටළු විසඳීම සඳහා මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය හා උප පර්යේෂණ මධ්‍යස්ථාන හයක් විසින් යෝග්‍ය තාක්ෂණය සංවර්ධනය කිරීමෙහි ලා අඛණ්ඩව නියැළී සිටියි. මෙම පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටා ඇති ස්ථාන හා ඒවා මගින් සිදු කෙරෙන කාර්යන් පහතින් දැක්වේ.

- මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, මාතලේ - අපනයන කෘෂි භෝග පිළිබඳ බහුවිධ පර්යේෂණ කටයුතු (කුරුඳු, සිට්‍රොනෙල්ලා හා බුලත් පිළිබඳ හැර)
- ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, පලොල්පිටිය, මාතර - කුරුඳු හා සිට්‍රොනෙල්ලා පිළිබඳ බහුවිධ පර්යේෂණ කටයුතු හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- බුලත් සහ අතුරුවගා පර්යේෂණ මධ්‍යස්ථානය, නාරම්මල - පොල් සහ බුලත් සමඟ අපනයන කෘෂි භෝග අතුරුවගාව පිළිබඳ පර්යේෂණ කටයුතු.
- පටක රෝපණ විද්‍යාගාරය හා පැල තවාන, වල්පිට - පටක රෝපණ පර්යේෂණ හා ශාක ප්‍රචාරණය සහ පැළ නිෂ්පාදනය.
- උප පර්යේෂණ මධ්‍යස්ථානය, කුන්ඩසාලේ - ප්‍රධාන ලෙස කොකෝවා, කිතුල්, ඉඟුරු, සහ කහ පිළිබඳ බහුවිධ පර්යේෂණ කටයුතු.
- උප පර්යේෂණ මධ්‍යස්ථානය, නිල්ලඹ -විවිධ වගා පද්ධති පිළිබඳ පර්යේෂණ
- උප පර්යේෂණ මධ්‍යස්ථානය, දැල්පිටිය - කාබනික වගාව සහ කුළුබඩු උද්‍යානය.
- ආර්ථික පර්යේෂණ ඒකකය, ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය - ආර්ථික විද්‍යා සහ අලෙවිකරණය පිළිබඳ පර්යේෂණ.

ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානය සහ පැළෑටි ආරක්ෂණ ඒකකය, මාතලේ අධ්‍යක්ෂ (පර්යේෂණ) යටතේ ක්‍රියාත්මක වේ. කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය සහ බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයද අධ්‍යක්ෂ (පර්යේෂණ)වරුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර, අනෙක් උප පර්යේෂණ මධ්‍යස්ථාන අදාල පර්යේෂණ නිලධාරීන් යටතේ පාලනය වේ.

ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානයේ හා අනෙකුත් උප පර්යේෂණ මධ්‍යස්ථානයන්හි 2018 වසරේ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය, බෝගය හා අංශයට අදාලව පහත පරිදි වේ.

5.2 : 2018 වර්ෂය තුළ අපනයන කෘෂි බෝග සම්බන්ධව පර්යේෂණ වල ප්‍රගතිය

5.2.1 : කුරුඳු

ශෂ්‍ය විද්‍යා හා බෝග වැඩි දියුණු කිරීම

“ පීරිස් කුරුඳු“ වල ඉහළ ගුණාත්මක ලක්ෂණ තෝරාගත් කුරුඳු ප්‍රභේදයන් (ශ්‍රී ගැමුණු හා ශ්‍රී විජය) සමග ඇගයීමට ලක් කිරීම සහ සැසැඳීම

අනාගතයේදී කුරුඳු ප්‍රභේද වැඩි දියුණු කිරීමේ වැඩසටහන් සඳහා යොදාගැනීමට ඉහළ ගුණාත්මක ලක්ෂණ සහිත සත්‍ය කුරුඳු දර්ශයන් හඳුනාගැනීම වෙනුවෙන් වගාකරුවන් සතු විවිධ උසස් කුරුඳු දර්ශයන්, ඇගයීම සහ වරණය කිරීම සිදුකරන ලදී. මෙම අධ්‍යනයේදී ගුණාත්මකභාවයෙන් වැඩි දර්ශයක් වශයෙන් හඳුනාගත්, ගාල්ල දිස්ත්‍රික්කයේ කුරුඳු වගාකරුවන් “ පීරිස් කුරුඳු“ ලෙස නම්කොට ඇති දර්ශය විවිධ ස්ථාන වලින් එකතුකරගෙන විත් කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය තුල ස්ථාපනය කරන ලදී. නමුත් පරපරාගණය හේතුවෙන් එම දර්ශයේ නුමුහුම් පරම්පරාවක් පවත්වාගැනීමට අපහසු විය. මෙතෙක් සිදුකර ඇති ඇගයීම්වලට අනුව තෝරාගත් දර්ශ හතරකින් A1 දර්ශය, ශ්‍රී ගැමුණු හා ශ්‍රී විජය ප්‍රභේදයන්ට සාපේක්ෂව වැඩි වියළි පොතු අස්වැන්නක් (එක් කඳකින් 182 g ක්), ඉහල වර්ධන විලාශයක්, අඩු රෝග සහ පලිබෝධ හානියක් (<10%) සහ දිගු පුරුක් සහිත කැපී පෙනෙන සෘජු කඳක් පෙන්නුම් කළේය.

නිර්දේශිත ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමවේද යටතේ තෝරාගත් දෙමුහුම් පැළ ගුණනය කිරීම සහ ඒවායේ ගුණාත්මක බව, වර්ධනය හා අස්වැන්න ඇගයීම

උසස් ලක්ෂණ සහිත නව ප්‍රභේද නිපදවීම හරහා කුරුඳු නිෂ්පාදිතය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩි දියුණු කිරීමේ අරමුණෙන් දෙමුහුම් පැළ 46 ක් නිපදවා ක්ෂේත්‍රයේ ස්ථාපනය කරන ලදී. එම පැළ ඇගයීමට ලක්කිරීමෙන් උසස් ලක්ෂණ (වැඩි පොතු අස්වැන්න, පළිබෝධ සහ රෝග වල අඩු තීව්‍රතාව) සහිත පැළ 10 ක් තෝරාගන්නා ලදී. තවදුරටත් ඇගයීමට ලක් කිරීම සඳහා නිර්දේශිත ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමවේද යටතේ එම තෝරාගත් දෙමුහුම් පැළ වර්ධක ප්‍රචාරණය කිරීම ආරම්භකොට ඇත.

වැලිමය වයනය සහිත කුරුඳු පොතු වල රසායනික හා ද්‍රව්‍යමය සංයුතිය හඳුනාගැනීම

ප්‍රමිතියෙන් යුතු පැළ ලෙස ශ්‍රී ගැමුණු හා ශ්‍රී විජය ප්‍රභේද සලකමින්, ඒවාට සංසන්දනාත්මකව වැලිමය කුරුඳුවල කදේ විවිධ මේරීම් මට්ටම්වලදී පොත්තේ පටක හරස්කඩ අන්වීක්ෂය යටතේ නිරීක්ෂනය කිරීම හා බලපෑමට ලක්වූ පොතු සාම්පල්වල සමස්ථ මූලද්‍රව්‍ය ප්‍රමාණය නිර්ණය කිරීම සිදුකරන ලදී. අන්වීක්ෂය යටතේ නිරීක්ෂණය කළ විට ප්‍රත්‍යක්ෂ වූයේ සාමාන්‍ය පොත්තට වඩා වැලිමය වයනය සහිත පොත්තේ පටකයන්හි සෛල ස්ථර අතර මේරීමත් සමඟ වැඩිවන දුඹරු පැහැති දණ්ඩාකාර හැඩැති තැන්පත්වීම් ඇති බවයි. එමෙන්ම ශ්‍රී ගැමුණු ප්‍රභේද යට

වඩා වැලිමය වයනයෙන් යුතු පොතුවල පටකයන්ගේ වැඩි කැල්සියම් ප්‍රමාණයක් අඩංගුවන බවත් එම ප්‍රමාණය කඳේ පරිණතිය සමග සැලකිය යුතු මට්ටමින් වැඩිවන බවත් නිරීක්ෂණය විය.

පැළෑටි හෝමෝන වල විවිධ සාන්ද්‍රනයන්ගේ බලපෑම

අතු කැබලි සිටුවීම මගින් කුරුඳු ප්‍රචාරණය කිරීම කෙරෙහි පැළෑටි හෝමෝන වන Indole Butyric Acid (IBA) සහ Naphthalene Acetic Acid (NAA) වල විවිධ සාන්ද්‍රණ (0 ppm, 1000 ppm, 2000 ppm, 3000 ppm 4000 ppm, 5000 ppm) වලින් ඇතිකළ හැකි බලපෑම පරීක්ෂණයට ලක්කරණ ලදී. මෙහි ප්‍රතිපල සළකා බලන විට පෙනී ගියේ IBA සහ NAA වල 4000 ppm සහ 5000 ppm සාන්ද්‍රණ වලින් වියලි මූල බර සහ මුල් පරිමාව කෙරෙහි වඩා හොඳ බලපෑමක් ඇතිකරන බවයි. එහෙත් IBA සහ NAA වල 1000 ppm -5000 ppm පරාසයේ සාන්ද්‍රණයන්ගෙන් අතු කැබලි වල දිග, පත්‍ර සංඛ්‍යාව, වියළි අතු බර, නොනැසී පැවතීමේ හැකියාව(ජීවී ප්‍රමාණය) සහ දළුලෑම කෙරෙහි සැලකිය යුතු තරම් බලපෑමක් නොමැත. සමස්ථයක් ලෙස සියළු පරාමිති සලකා බලා, ඉහත පැළෑටි හෝමෝන සාන්ද්‍රණයන් කුරුඳු අතු කැබලි වර්ධක ප්‍රචාරණයේ සාර්ථකත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරන බව කිව හැකිය.

- පාශු හා ශාක පෝෂණය

කුරුඳු ශාකයේ වර්ධනය, අස්වැන්න සහ පාංශු පෝෂණය කෙරෙහි ග්ලිරිසීඩියා සහ ආවරණ බෝග සෑදීමේ බලපෑම

ග්ලිරිසීඩියා පේලි දෙකක් සමඟ කුරුඳු වගාකොට නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණයෙන් අඩක් යොදමින් වසර 8 කට පසු පෙන්වූ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීකත්වය (mg day-1) නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණය යොදමින් වගාකළ විට පෙන්වූ අගයට වඩා සැලකිය යුතු තරම් වැඩි විය.

පසේ මහා පෝෂක සහ ක්ෂුද්‍ර පෝෂක අධීක්ෂණය සඳහා කුරුඳු ශාකයේ දෘෂ්‍ය ලක්ෂණ හඳුනාගැනීම

පරිනත පත්‍රවල දාරයන් කහ පැහැ ගැන්වීම සහ දුඹුරු පැහැ ලප ඇති වීම කුරුඳු ශාකවල බහුල දර්ශීය ඌනතා ලක්ෂණය විය. මෙම ලක්ෂන වලින් හැඟවෙන්නේ ශාකයේ N සහ Mg මට්ටම් ප්‍රමාණවත් නොවන බවයි.

කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න සඳහා කුරුඳු කොළ පොහොර සහ අකාබනික පොහොරවල බලපෑම

කොම්පෝස්ට් රසායනික පොහොර සහ ඒවාගේ සංකළනයන්ගේ විවිධ මාත්‍රාවන් යෙදීමෙන් පසු පසෙහි රසායනික පරාමිතීන් නිරීක්ෂණය කරන ලදී. කුරුඳු වගාකරන පසට කුරුඳු කොළ පොස්ෆර් කෝම්පෝස්ට් 20t/ha/yr යෙදූ විට වැඩිම pH (5.05) අගයක්ද, නිර්දේශිත පොහොර ප්‍රමාණයන් අඩක් සමග කුරුඳු කොළ පොස්ෆර් කොම්පෝස්ට් 10t/ha/yr යෙදූ විට වැඩිම විද්‍යුත් සන්නායකතාවයක් (0.14 dsm $^{-1}$) ද, නිර්දේශිත පොහොර ප්‍රමාණය පමණක් යෙදූ විට වැඩිම සමස්ථ N ප්‍රතිශතයක්ද (0.20%) පෙන්වීය.

ආම්ලික පසේ වගාකර ඇති කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න සඳහා ඩොලමයිට්වල බලපෑම

නිර්දේශිත පොහොර ප්‍රමාණය සමග කීසරයිට් 375 Kg/ha/yr යොදා කුරුඳු වගාකළ විට, පැළ සිටුවා අවුරුදු අටකට පසු අස්වැන්න ලෙස නෙලාගන්නා කඳේ දිග, විශ්කම්භය, බර සහ පොතුවල නැවුම් බර යන අස්වනු සංරවක සඳහා ඉහළ අගයන් ලැබිණි.

කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න සඳහා සල්ෆර් අඩංගු පොහොර වල බලපෑම

සල්ෆර් 163.5 Kg ක් ලබාදෙන ඇමෝනියම් සල්ෆේට් පොහොර 657 Kg/ha යොදා වගාකර අවුරුදු දෙකකින් පසු කඳේ විශ්කම්භය (27.1 cm) සැලකියයුතු තරම් වැඩි බව වාර්තා විය.

කුරුඳු ශාකයේ වර්ධනයට අවශ්‍ය ප්‍රශස්ථ pH අගය සෙවීම

විවිධ pH අගයන් සහිත ස්ථාන වල කුරුඳු පැළ වගාකිරීමේ අරමුනෙන්, කුරුඳු පර්යේෂන මධස්ථානය තුල ස්ථාන අටක (GPS : 176340 E, 92448 N -පාංශු pH 5.91; GPS: 176389 E, 92448 N පාංශු pH 4.88; GPS 176397 E, 92516 N - පාංශු pH 4.77; GPS 176343 E, 92398 N - පාංශු pH 4.61 ; GPS 17448 E, 92413 N - පාංශු pH 4.20; GPS 176444 E, 92418 N- පාංශු pH 4.81) පාංශු pH පරීක්ෂා කරන ලදී.

කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න සඳහා ජෛව පටල (Bio film)කාබනික පොහොරවල බලපෑම

රසායනික පොහොර සමග විවිධ ජෛව පටල (Bio film) මාත්‍රාවන් යොදා මාස හයකට පසු පරීක්ෂා කළ විට එමගින් ශාකයේ වර්ධන පරාමිතීන්ගේ සැලකිය යුතු බලපෑමක් ඇති වූ බවක් නිරීක්ෂණය නොවීය.

රෝපණ ද්‍රව්‍ය වල වර්ගය සඳහා විවිධ ප්‍රමාණ වලින් යොදනු ලබන පොහොර කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි බලපෑම අධ්‍යනය

කුරඳු වල වර්ධනය හා අස්වැන්න කෙරෙහි ශාක රෝපණ ද්‍රව්‍ය වර්ගයේ සහ විවිධ කාබනික සහ රසායනික පොහොර මාත්‍රාවන්ගේ බලපෑම විමර්ශනය කිරීමට මෙම අධ්‍යනය සිදුකරන ලදී. එහිදී අනාවරණය වූයේ සිටුවා අවුරුදු දෙකකට පසු ශ්‍රී ගැමුණු, ශ්‍රී විජය ප්‍රභේදයන්ට වඩා සාමාන්‍ය බීජ පැළ සැලකියයුතු තරම් වැඩි උසකින් සහ කඳේ විශ්කම්භයකින් යුක්ත බවයි. සාමාන්‍ය බීජ පැළ වල උස වැඩිවීම ශ්‍රී විජය ප්‍රභේදයන්ට වඩා 19% ක් ද ශ්‍රී ගැමුණු ප්‍රභේදයන්ට වඩා 11% ක් ද කඳේ විශ්කම්භය වැඩි වීම ශ්‍රී ගැමුණු ප්‍රභේදයට වඩා 9% ක්ද ශ්‍රී විජය ප්‍රභේදයට වඩා 11% ක් ද ලෙස විය.

නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් විවිධ මට්ටම් වලින් යෙදීම කුරුඳු ශාකයේ වර්ධනය, අස්වැන්න ගුණාත්මක භාවයට වන බලපෑම අධ්‍යනය

නිර්දේශිත නයිට්‍රජන්(N 3) ප්‍රමාණය මෙන් එකහමාරක් යෙදූ විට සිටුවා මාස 18 කට පසු පැළ උස සහ කඳේ විශ්කම්භය සැලකියයුතු තරම් වැඩිවිය. නිර්දේශිත පොටෑසියම් ප්‍රමාණයෙන් අඩක් යෙදූ විට සැලකිය යුතු තරමින් ඉහළ පැළ උසක් සිටුවා මාස දහඅටකින් පෙන්වීය.

- පැළැටි සංරක්ෂණය

මාතර දිස්ත්‍රික්කයේ කුරුඳු වගාවේ පලිබෝධ හා රෝගවල අවකාශීය පැතිරීම විමර්ශනය කිරීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් කරන ලද අතර කොළ අංගමාරය, පොත්ත රළුවීමේ රෝගය, පෘෂ්ඨ වංශී පලිබෝධ හානි, රෝස කඳ පණු හානිය, පැල මැක්කාගේ හානිය, උඩු පැත්තේ පත්‍ර ගැටිති, යටි පැත්තේ පත්‍ර ගැටිති සහ කඳ පිළිකා යන පලිබෝධ හා රෝග වල සාමාන්‍ය ප්‍රතිශතයන් පිළිවලින් 40.3, 33.5, 16.15, 10.6, 9.8, 7.9, 7.05 සහ 4 ක් විය. එම පලිබෝධ හා රෝග වල තීව්‍රතාවය පිළිවලින් 23.6, 22.5, 9.25, 5.12, 5.05, 2.8, 3.25 හා 1 ක් විය.

කුරුඳු කොළ වල ඛනිජ පෝෂක ප්‍රමාණයන් (N, P,K, Mg, Ca සහ Fe)කුරුඳු පොත්ත රළු වීමේ රෝගය දරුණු වීමත් සමග සැළකිය යුතු ලෙස පහළ ගිය අතර රෝගී පඳුරු අවට පස් වල එම ඛනිජ ප්‍රමාණයන් වල වෙනසක් රෝග වර්ධනයත් සමග සිදු නොවීය. පොත්ත රළු වීමේ රෝගයට හේතුවන දිලීරය, කුරුඳු කඳේ ශෛලම පටකය ආක්‍රමණය කොට අවහිර කිරීමෙන් මෙය සිදු වේ.

කුරුඳු තවාන් පැළ වල පළිබෝධ හා රෝග මර්ධනය සහ ඒවායේ වර්ධනය කෙරෙහි විවිධ මුහුදු වතුර සාන්ද්‍රණයන් සමග කාබනික ද්‍රව්‍ය (ගොම සහ ගැඩවිල් පණු පොහොර) වල බලපෑම පරීක්ෂාවට ලක්කරන ලදී. 1% මුහුදු වතුර සාන්ද්‍රණය සමග කාබනික ද්‍රව්‍ය යෙදීමෙන් සැලකිය යුතු ලෙස කුරුඳු පැළ වල ඉහල වර්ධනයක් (උස) සහ පලිබෝධ සහ රෝග වල (කොළ අංහමාරය, පත්‍ර ගැටිති සහ පැළ මැක්කාගේ හානිය) සැලකිය යුතු අඩුවීමක් සිදුවිය. නමුත් මෙම සංයෝජනය පමණක් පලිබෝධ වලට හා රෝග වලට අධික ලෙස හිතකර කාලගුණික තත්වයන් යටතේ කුරුඳු තවාන් වල අධි තීව්‍රතාව සහිත පලිබෝධ හා රෝග පවතින විට ප්‍රමාණවත් නොවන අතර මේ සඳහා සීමිත ප්‍රමාණයකින් කෘෂි රසායන යොදාගැනීමේ පර්යේෂණ කටයුතු 2019 දී ආරම්භකොට ඇත.

මූලික අධ්‍යනයක් ලෙස විවිධ සංඛ්‍යාත 10 කින් යුත් අති ධ්වනි උපකරණ, කුරුඳු වගාවට හානි කරන පෘෂ්ඨ වංශී පලිබෝධකයන් පලවාහැරීම සඳහා භාවිතා කරන ලදී. කුරුඳු අංකුර වලට අඩු හානියක් සහ මොනරුන්ගේ අඩු ගහනයක් එම උපකරන භාවිතාකරන පෙදෙස් වල නිරීක්ෂණය විය. ප්‍රමාණාත්මක පරීක්ෂන කෙරෙමින් පවතී.

විවිධ ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් (උදළුගෑම වෙනුවට යන්ත්‍ර මගින් වල් කැපීම, අස්වනු නෙලීම් දෙකක් අතර අමතර නුහුර පැහීමක්, රෝස කඳ පණු හානිය පාලනයට කුරුඳු පඳුර පාමුලට පස් යෙදීම සහ කුරුඳු පොත්ත රළුවීමේ රෝගය පාලනයට බෝර්ඩෝ මිශ්‍රණය යෙදීම) සහ ඒවාගේ සංයෝජනයන් යොදා එම කුරුඳු ඉඩම් වල පලිබෝධ හා රෝග තත්වයන් සහ ඵලදායීතාව ස්ථාන දෙකකදී (යටියන සහ කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය) පරීක්ෂාවට භාජනය කරන ලදී. සියළුම ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම භාවිතාකර කුරුඳු ඉඩම්වල රෝස කඳ පණු හානි ප්‍රතිශතය (කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය සහ යටියන ක්ෂේත්‍ර වල පිලිවෙලින් 3.77% සහ 13.88 %) අඩුවෙනුත් එසේ නොකළ ක්ෂේත්‍ර වල වැඩියෙනුත් (13.55 % සහ 40.44 %) පොත්ත රළුවීමේ රෝග ප්‍රතිශතය (කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය සහ යටියන ක්ෂේත්‍ර වල පිලිවෙලින් 19.33% සහ 33.22%) අඩුවෙනුත් එසේ නොකළ ක්ෂේත්‍ර වල වැඩියෙනුත් (53.78% සහ

84%) කුරුඳු පලදාව (කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය සහ යටියන ක්ෂේත්‍ර වල පිලිවෙලින් 926.37 Kg/ ha සහ 1165.69 Kg/ ha) වැඩියෙනුත් එසේ නොකළ ක්ෂේත්‍ර වල (743.48 Kg/ ha සහ 730.48 Kg/ ha) අඩුවෙන් වාර්තා විය.

- පසු අස්වනු තාක්ෂණය

කුරුඳු කුරු කල්තබාගත හැකි කාලය කෙරෙහි (shelf life) සල්ෆර් ධුමකරණය සහ ඇසුරුම් ද්‍රව්‍ය වල බලපෑම

කුරුඳු කුරු ඇසුරුම් කොට අවුරුද්දක කාලයකට පසු, ත්‍රිත්ව ස්ථර ප්‍රොලිප්‍රොපිලින් (PET/AL/LLDPE) වලින් ඇසුරුම් කළ කුරුඳු කුරුවල සිටි කෘමීන් ප්‍රමාණය ලෝහ ආලේපිත (Metalized)ඇසුරුම් හැරුණු කොට අනෙක් ඇසුරුම් වලින් (PET/LLDPE, LDPE සහ PP)සැලකිය යුතු ලෙස වෙනස් විය. ත්‍රිත්ව ස්ථර ප්‍රොලිප්‍රොපිලින් (PET/AL/ LLDPE) ඇසුරුම් භාවිතා කළ විට අනෙක් ඇසුරුම් වලට වඩා සැලකියයුතු තරම් අඩු තෙතමන ප්‍රමාණයක් සහ ජල ක්‍රියාකාරීත්වයක් (Water Activity) පෙන්නුම් කළේය. MPET/LLDPE, PET/LLDPE සහ LDPE වලට වඩා PET/AL/LLDPE සහ PP වලින් ඇසුරුම්කළ කුරුඳු වල සැලකිය යුතු මට්ටමේ තෙල් ප්‍රමාණයක් අඩංගු විය.

මූලික පිරි සැකසුමෙන් පසු අගය දාමයේ ස්ථර අතර කුරුඳු කුරු වල ගුණාත්ම පරාමිතීන්

ගාල්ල දිස්ත්‍රික්කය තුළදී අගය දාමයේ මූලික පිරිසැකසුම් ක්‍රියාවලියෙන් අනතුරුව මට්ටම් තුනකදී (ගොවීන්,එකතුකරන්නන් සහ අපනයනකරුවන්) කුරුඳු කුරු වල ගුණාත්මක පරාමිතීන් පරීක්ෂාවට ලක් කරන ලදී.ගොවියාගේ සහ එකතු කරන්නාගේ මට්ටම් වලදී අඩංගු තෙතමන ප්‍රමාණය ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ පිරිවිතර (81: 2010) සීමාවද ඉක්මවා තිබුණි.මට්ටම් තුනේදීම කුරුඳු කුරු කෘමීන්ගෙන් සහ ක්ෂුද්‍ර ජීවීන්ගෙන් අපවිත්‍රණය වී තිබුණි.අඩුම කෘමීන් සහ ක්ෂුද්‍ර ජීවීන් සංඛ්‍යාව අපනයන කරුවාගේ මට්ටමේදී විය.

කුරඳු ලීයේ සහ කුරුටු වල තෙල් ප්‍රමාණය

කුරුඳු කුරුටු වල අඩංගු තෙල් ප්‍රමානකරණය හා එහි සංයුතිය හඳුනා ගැනීම GCMS (Gas Chromotography Mass Spectrometer) උපකරණ භාවිතෙයන් සිදු කරන ලදී.කුරුටු වල තෙල් ප්‍රතිශතය 0.08% ක් විය.කුරුඳු ලීයේ විවිධ ස්ථාන වල රසායනික සංයුතිය පහත පරිදි වේ.ලීයේ පාද කොටසේ සහ මැද කොටසේ සමාන සිනමැල්ඩිහයිඩ් ප්‍රමාණයක් (36%) තිබූ අතර අග්‍රස්ථයේ 29.61% ක් විය.ඉයුජිනෝල් ප්‍රමාණය ආසන්න වශයෙන් ස්ථාන තුනෙහිම සමාන විය.පිළිවෙලින් කුරුඳු ලීයේ පාදම,මධ්‍යස්ථය හා අග්‍රස්ථය යන ස්ථාන වල Cinnamic acetate 13.38%, 9.37% සහ 11.88% ක්ද, β-Caryophyllene 11.18%, 9.00% සහ 9.94% ක්ද, β-Linalool 9.71%, 10.87% සහ 11.32% ක්ද,

Benzyl Benzoate 0.96%, 1.05% සහ 0.94% ක්ද ලෙස අඩංගුව තිබුණි. α- Terpineol ප්‍රමාණය ස්ථාන තුනෙහිම සුළු හෝ වැඩි වශයෙන් සමාන විය.

කුරුඳු ඔලියොරෙසින් භාවිතයෙන් නිපද වූ සුප් කැටයක් හඳුන්වා දීම

කුරුඳු සුප් කැට සකසා දෙවරක් රස පරීක්ෂාවන් සිදු කරන ලදී.මාතර පැවති කුරුඳු සතියේදී 2018 මැයි 11 දින 90 දෙනෙකුගේ පිරිසක්ද, BMICH හි පැවති INCO ප්‍රදර්ශනයේදී 2018 ජූනි 22,23 සහ 24 දිනයන්හිදී 526 දෙනෙකුගේ පිරිසක්ද මේ සඳහා යොදා ගැනිණි. ඔවුන්ගෙන් 75% දෙනෙකු සුප් කැටය ඉතා සතුටු දායක ලෙසද 23% දෙනෙකු සතුටුදායක ලෙසද අදහස් දැක්වීය.

කුරුඳු වල දියවැඩියාවට එරෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව සංසංදනාත්මක අධ්‍යනය

ශ්‍රී ගැමුණු හා ශ්‍රී විජය ප්‍රභේදයන්ගෙන් සකසා ගත් කුරුඳු පානය, විවිධ වයස් මට්ටම් වලට අයත් තෝරාගත් පිරිසකට ලබා දී ඔවුන්ගේ රුධිර ග්ලූකෝස් මට්ටම් පරීක්ෂා කරන ලදී. ප්‍රතිඵල වලට අනුව කුරඳු පානය දින 14 ක් පානය කිරීමෙන් පසු රුධිර ග්ලූකෝස් මට්ටම අඩු වූ දියවැඩියාව රහිත අයගේ ප්‍රතිශතය ශ්‍රී ගැමුණු හා ශ්‍රී විජය සඳහා පිළිවෙලින් 90% ක් සහ 86% ක් විය.එය දියවැඩියාව සහිත අය සඳහා ශ්‍රී ගැමුණු හා ශ්‍රී විජය ප්‍රභේද දෙකේදීම 100% ක් විය.

කුරුඳු ඔලියොරෙසින් භාවිතයෙන් නිපද වූ අයිස් ක්‍රීම් හඳුන්වා දීම

කුරුඳු රසැති අයිස් ක්‍රීම් නිපදවා රස පරීක්ෂාවක් සිදු කරන ලදී. සහභාගී වූවන්ගෙන් 98% ක් පැවසූයේ ඉතා සතුටුදායක බව වන අතර බහුතරයකගේ අදහස වූයේ කුරුඳු අයිස් ක්‍රීම් හොඳ අගය එකතු කළ නිෂ්පාදනයක් බවයි. අයිස් ක්‍රීම් වල වර්ණය ලෙස තරමක දුඹුරු පැහැයක් වඩා ප්‍රියමනාප වනු ඇති බවටද අදහස් පල විය.

කුරුඳු වල මූලික පිරිසැකසුම් ක්‍රියාවලියේදී උග්‍ර උපද්‍රව (Critical hazards) හඳුනා ගැනීම සහ උපද්‍රව මඟින් සිදුවන අපවිත්‍රණය අඩු කිරීමෙන් මූලික පිරිසැකසුම් ක්‍රියාවලියේ ගුණාත්මක බව වැඩි කිරීම

අධ්‍යනයට අනුව කුරුඳු කුරු වල සුලභම දිලීර විශේෂය වූයේ *Penicillium spp.* සහ *Aspergillus spp.* විශේෂයන්ය.මීට අමතරව කුරුඳු වගා කරන සියලු ප්‍රදේශයන්ගේ කුරුඳු කුරු වල Mucor, පාංශු දිලීරය තිබිණි. තෙතමන මට්ටම දිලීර වර්ධනයට අනුපාතිකය. භෞතික අපවිත්‍ර කාරක ලෙස මිය ගිය කෘමීන්, කෘමි කොටස්, හිස කෙස්, කුරුටු, වැලි, දූවිලි, කෙදිමය මුල් සහ කෘමීන්ගේ මළපහ හඳුනා ගැනිණි. කුරුඳු කුරු සැකසීමේදී නොසැලකිලිමත් බව හෝ නිසි පහසුකම් හා පිරිසිදු කම නොමැති බව, කුරුඳු කුරු වල ජෛව සහ භෞතීය අපවිත්‍රණය කෙරෙහි සෘජුවම බලපායි. මූලික සාම්පල හා සකසන ලද සාම්පල අතර Ni හැර වෙනත් රසායනික ද්‍රව්‍යයන්ගේ සැලකිය යුතු වෙනසක් පෙන්නුම් නොකළ බැවින් එම ප්‍රතිඵල

අනුව මූලික පිරිසැකසුම් ක්‍රියාවලියේදී රසායනික අපවිත්‍රණයක් වී නොමැති බව කිව හැකිය. නමුත් ජෛව සහ භෞතීය අපවිත්‍රණයක් මූලික පිරිසැකසුම් පියවර වලින් සිදු වෙයි.

කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන වල ඖෂධීය ගුණාංග අධ්‍යනය කිරීම

ඖෂධ නිෂ්පාදනයේදී අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගැනීමේදී කුරුඳු පොතු ප්‍රමිතිගත කිරීමේ අරමුණෙන් ගාල්ල, මාතර, මාතලේ සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වලින් එකතු කර ගන්නා ලද කුරුඳු සාම්පල සඳහා රසායනික විශ්ලේෂණයක් සිදු කිරීම අරඹන ලදී. කුරුඳු තෙල් ඔලියොරෙසින් සහ රසායනික සංයුතිය ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින්, එම කුරුඳු වලින් නිපදවන ඖෂධ නිෂ්පාදන වල ගුණාත්මයද ඒ අනුව වෙනස් වනු ඇත. එබැවින් අමුද්‍රව්‍ය ප්‍රමිතිගත කිරීම ඉතා වැදගත් වේ.

දකුණු පළාත තුළ විවිධ කෘෂි පාරිසරික කලාප යටතේ සත්‍ය කුරුඳු වල අස්වනු සහ ගුණාත්මක තත්වයන් අධ්‍යනය කිරීම

හම්බන්තොට දිස්ත්‍රික්කය DL5,ILlb සහ WL2a ලෙස කෘෂි පාරිසරික කලාප තුනකින් සමන්විත වෙයි. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ කුරුඳු වල අස්වනු සහ ගුණාත්මක ලක්ෂණ ඇගයීමේදී කඳේ දිග, කඳේ වට ප්‍රමාණය, වියළි පොතු බර සහ පොත්තේ තෙල් ප්‍රමාණය ILlb සහ WL2a කලාප වලට වඩා DL5 කලාපයේදී සැලකිය යුතු ලෙස වැඩිය. කුරුඳු කොළ තෙල් ප්‍රමාණය DL5 සහ ILlb කලාප වලට වඩා WL2a හි සැලකිය යුතු ලෙස අඩුය.කලාප අතර වියළි කොළ බරෙහි සැලකිය යුතු වෙනසක් නැත. කෙසේ නමුත් අඩු වර්ධන වේගය හේතුවෙන් DL5 කලාපයෙහි පැළ වල වයස අන් කලාපයන්ට වඩා වැඩිය. තවද වියළි කාලයේදී ජල සම්පාදනයද කොට ඇත.මේ හේතුවෙන් කලාප අතර පෙන්නුම් කොට ඇති ඉහත විචලනයන් පාරිසරික විචලනයන් නොවීමටද ඉඩ ඇත.

5.2.2. ගම්මිරිස්

- ශෂ්‍ය විද්‍යා හා බෝග ප්‍රවර්ධන

විවිධ කෘෂි විද්‍යාත්මක කලාප යටතේ ශාකමය වර්ධනය, මල් හටගැනීම, ඵල හටගැනීම සහ ගම්මිරිස්වල අස්වැන්න පිළිබඳ අධ්‍යනය.

ලැබුණු වර්ෂාපතන ප්‍රමාණය ගම්මිරිස් මල් පිපීම ආරම්භ කිරීම මත සැලකිය යුතු බලපෑමක් ඇත. මල් පිපීම ආරම්භ වීම මිලි මීටර 100 ට වඩා ඉහළින් වැසි ඇති ඉහළ මට්ටම් සමඟ හොඳින් බැඳී පැවතුනි.

අත්හදා බැලීම්වල භාවිතා කරන ලද ප්‍රභේද අතරින් දෙමුහුන් පැනියුර්-1 මල් ආරම්භය අනුව වැසි සමඟ ඉතා සංවේදී වේ.

පුවක් (*Areca catechu*) + ගම්මිරිස් (*Piper nigrum* L.) පද්ධතියේ අස්වැන්න මත ක්ෂුද්‍ර ජල සම්පාදනයේ බලපෑම.

ගම්මිරිස් වගාව පිළිබඳ ප්‍රධාන ගැටළුවක් වන්නේ, ආධාර ගස් හැසිරවීම සඳහා ශ්‍රම වියදමය. එබැවින් ගම්මිරිස් සඳහා ආධාරක ගසක් ලෙස පුවක් භාවිතා කිරීම හොඳ වගා පද්ධතියක් විය හැකිය. ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමය යටතේ පුවක් + ගම්මිරිස් ක්‍රමයේ ඵලදාව විශ්ලේෂණය කිරීම සඳහා මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදී. විවිධාකාර ජල සම්පාදන මට්ටම් පහක් (ලීටර් 25, 20, 15, 10 ක් හා ජල සම්පාදන රහිතව) භාවිතා කරන ලදී. ගම්මිරිස් වර්ධනය පිළිබඳ ක්ෂුද්‍ර ජල සම්පාදනයේ බලපෑම සොයා ගැනීම සඳහා දත්ත වර්ෂය පුරා එකතු කරන ලදී. පළමු ප්‍රතිකාරය (දිනකට ලීටර් 25 ක්) වෙනත් ප්‍රතිකාර වලට වඩා වැඩි වර්ධන අගයක් පෙන්වා ඇත. ජල සම්පාදන නොයෙදූ ගම්මිරිස් පැළ වල අඩු ශාඛා ගණනක් පෙන්නුම් කරන ලද අතර මුදුන් රිකිලි සහ හරස් අතු ශාඛා ගණන ලීටර් 25 ක් යෙදූ ගම්මිරිස් පැළ වල ඉහළ අගයක් ගනී.

ගම්මිරිස්වල (*Piper nigrum* L.) වියනෙහි වර්ධනය සඳහා විවිධ අතු කැබැලි වර්ග වලින් හටගත් රෝපණ ද්‍රව්‍යයේ බලපෑම

2018 දී නිල්ලඹ පර්යේෂණ ක්ෂේත්‍රයේ රැස් කරන ලද දත්තවලින් පෙන්නුම් කෙරෙන්නේ වැඩිම හරස් අතු සංඛ්‍යාවක්, වැලක උපරිම උස සහ වැඩිම ගම්මිරිස් කරල් සංඛ්‍යාවක් දක්නට ඇත්තේ පාවැල් වල බවයි. කෙසේ වෙතත්, මාතලේ පර්යේෂණ ක්ෂේත්‍රයේ රැස් කරන ලද දත්ත වලට අනුව වැඩිම හරස් අතු සහ කරල් ප්‍රමාණයන් පෙන්වා ඇත්තේ මුදුන් රිකිලි වලිනි. වැලක සාමාන්‍ය උස මුදුන් රිකිලි සහ පාවැල් යන දෙවර්ගයේම සමාන අගයක් ගනී. මෙම සියලු පරාමිතීන්ගෙන් අඩුම අගයක් හරස් අතු සහ බඳින ලද හරස් අතු පෙන්වා ඇත.

ගම්මිරිස් (*Piper nigrum* L.) වල ආධාරක ශාක මාර්ගයෙන් ගම්මිරිස් වගාවේ සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම

වඩා යෝග්‍ය ජීව ආධාරක සහ වඩා හොඳ බෝග කළමනාකරණ ක්‍රම හරහා ගම්මිරිස් ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මෙම පර්යේෂණ ආරම්භ කරන ලදී.

එරබදු හා ගන්සූරිය (355cm, 344cm) හි ඉහළම සාමාන්‍ය වැල් උස පෙන්නුම් කරන අතර, ග්ලිරිසීඩියා සහ කොට්ට ආධාරකයන්හි උස අඩු අගයක් ගනී (335cm, 315cm). ග්ලිරිසීඩියා - 228, එරබදු - 202,

ගන්සූරිය - 153, කොට්ට - 95) කරල් පිරීමේ අනුපාතය එරබදු,කොට්ට සහ ග්ලිරිසීඩියා වල සමාන වේ 70%). ගන්සූරිය කරල් පිරීමේ අනුපාතය 65% ක් පෙන්නුම් කරයි.

ගම්මිරිස්හි (*Piper nigrum* L.) මල් හා ගෙඩි ඇතිවීම මත පාංශු තෙතමනයේ බලපෑම

අවම ජල සැපයුමක් ඇති අවස්ථාවේදී ගම්මිරිස්වල හරස් අතු අඩු නමුත් උස පැළ ඇති කරයි. වියළි කාලපරිච්ඡේදය වැඩි වන විටදී මුළු කරල් සංඛ්‍යාව වැඩිවිය.

අලුතින් හඳුන්වාදුන් ගම්මිරිස් ප්‍රභේද (ඩිංගිරල) සහ දේශීය (එම්-12) වරණයන්වල මල් සහ කරල් හට ගැනීම අධ්‍යනය කිරීම

විවිධ ගම්මිරිස් වගාවන් සිටුවීම මාතලේ සහ නිල්ලඹ යන ක්ෂේත්‍රයන්හි සිදු කරන ලදී. පැළෑටි වර්ධනයේ මුල් දත්ත රැස්කරනු ලැබුවේ නියඟ තත්වයන් යටතේය. ඩිංගිරාල සහ MB - 12 වර්ගවල පැවැත්මේ අනුපාතය සොයා ගැනීම සඳහා නිරීක්ෂණ සිදු කරන ලදි. ඩිංගිරාල (87.2%) නියං කාලවලදී MB-12 (61.3%) වඩා වැඩි පැවැත්මේ අනුපාතයක් පෙන්නුම් කරන ලදී.

- **පැලෑටි සංරක්ෂණය**

ගම්මිරිස් නව ප්‍රභේද සඳහා කෘමි හානි ඇගයීම

පැළ තවන් කාලයේදී පැල මැක්කන් සහ අවුලකපෝරා කුරුමිනියන්ගේ හානිය ඉහල මට්ටමක පවතින අතර පාලනය සඳහා තවානේ සනීපරක්ෂාව ඉහල නැංවීම සහ යහපත් තවාන් කලමනාකරන ක්‍රමවේදයන් අනුගමනය කිරීම සුදුසු වේ.

ෆයිටොප්තොරා කැප්සිසි (*Phytophthora capsici*) දිලීරය රෝග කාරක වන ගම්මිරිස් ක්ෂණික මැලවීමේ රෝගය තිරසාර ලෙස කළමනාකරණය **කිරීමේ හැකියාව**

ගම්මිරිස් බෝගයට ක්ෂණික මැලවීමේ රෝගය හෙවත් පාදස්ථ කුණුවීමේ රෝගය ඇති කිරීමට කාරක වන, පස මගින් බෝවන ප්‍රධාන ව්‍යාධිජනකයෙක් ලෙස ෆයිටොප්තොරා කැප්සිසි හඳුන්වා දිය හැක. මෙම දිලීරය පාලනය සඳහා ගම්මිරිස් වගා කරන ප්‍රදේශ වල විවිධ රසායනික නිර්දේශයන් භාවිතා වන අතර ශ්‍රී ලංකාවේ රෙඩොක්සිල් රසායනිකය (64% මැන්කොසෙබ්, 8% මෙටලැක්සිල්) යෙදීම නිර්දේශ කර ඇත. මෙම රෝගය තිරසාර ලෙස කළමණාකරනය **කිරීමේ** හැකියාව මෙම පර්යේෂණයේදී අධ්‍යයනය කරන ලදී. මෙහිදී ප්‍රතිකාරක වශයෙන් රෙඩොක්සිල්, ට්‍රයිකොඩර්මා ඇස්පෙරෙල්ලම් ආමුකුලනය කරන ලද ගොම පොහොර, ට්‍රයිකොඩර්මා ඇස්පෙරෙල්ලම් ආමුකුලනය නොකරන ලද ගොම පොහොර සහ පාලකයක් යොදා ගන්නා ලදී. වසර දෙකක කාලයක් පර්යේෂණය සිදුකරන ලද අතර ට්‍රයිකොඩර්මා ඇස්පෙරෙල්ලම් ආමුකුලනය කරන ලද ගොම පොහොර යොදන ලද ගම්මිරිස් වැල්වල ක්ෂණික

මැලවීමේ රෝගය සුවිශේෂී අඩුවීමක් (3.3%) දක්නට ලැබුණි. රෙඩොක්සිල් යොදන ලද ශාකවල රෝග තත්ත්වය ක්ෂණිකව අඩුවීමක් සිදුවුව ද අධ්‍යයන කාලය පුරාම එම ශාකවල රෝග ලක්ෂණ වරින් වර නැවත හටගැනීම නිරීක්ෂණය කරන ලදී. කිසිදු ප්‍රතිකර්මයක් නොකරන ලද ශාකවල රෝග තත්ත්වය සුවිශේෂී ඉහළ අගයකින් වාර්තා විය. ට්‍රයිකොඩර්මා ඇස්පෙරෙල්ලම් ආමුකුලනය කරන ලද ගොම පොහොර යෙදීම මගින් ගම්මිරිස් ක්ෂණික මැලවීමේ රෝගය තිරසාර ලෙස කළමණාකරනය සිදුකල හැකි බව පර්යේෂණ ප්‍රථිපල මගින් තහවුරු විය. වර්තමාන රසායනික නිර්දේශය ප්‍රථිපලදායක වන්නේ කෙටිකාලීනව පමණක් වන අතර රෝගය නැවත මතුවන අවස්ථාවන් හිදී නැවත නැවතත් රසායනික ද්‍රව්‍ය යෙදීමට සිදුවේ.

ක්ෂේත්‍රයේ සහ තවාන්වල භාවිතා කිරිම සඳහා වාණිජ නිෂ්පාදනයක් ලෙස ට්‍රයිකොඩර්මා දිලීරය භාවිතා කිරීම

ට්‍රයිකොඩර්මා වාණිජ නිෂ්පාදනයේ මාධ්‍ය ලෙස සුවඳ විලවුන් කර්මාන්තයේදි යොදා ගන්නා ටැල්ක් පවුඩර් භාවිතා කිරීමේ හැකියාව මෙහිදි විමසා බලන ලදී. සිදුකරන ලද පර්යේෂණ වල ප්‍රතිඵලවලට අනුව අදාල මාධ්‍යයේ මෙම දිලීරය මාස තුනක පමණ කාලයක් ජීවි තත්වයේ පවත්වා ගත හැක. අදාල මාධ්‍යයේ ටැල්ක් පවුඩර් ග්‍රෑම් 1 ක ට්‍රයිකොඩර්මා බීජානු සාන්ද්‍රනය $1.21x\ 10^8$ ප්‍රමාණයක් විය.

පාංශු ක්ෂද්‍රජීවී ගහණය ඉහළ මට්ටමක පවත්වා ගැනීම මගින් ගම්මිරිස් වගාවේ ක්ෂණික මැලවීමේ රෝගය පාලනය කිරීමේ හැකියාව විමසා බැලීම

පර්යේෂණාගාරය තුල සිදුකරන ලද මූලික පරීක්ෂණ වලට අනුව තෝරා ගන්නා ලද ක්ෂේත්‍රයේ පස ෆයිටොප්තොරා කැප්සිසි නැමති රෝග කාරක දිලීරය මගින් ආසාදනය වී ඇති බව තහවුරු විය . මූලික අවස්ථාවේදි අදාල **ක්ෂේත්‍රයේ** ක්ෂණික මැලවීමේ රෝගයට පාත්‍ර වූ ගම්මිරිස් වැල්වල ප්‍රතිශතය 4.59 ක් විය. ක්ෂේත්‍රයේ ස්වභාවිකව දක්නට ලැබෙන ක්ෂුද්‍ර ජීවින් හඳුනාගැනිම සඳහා පස් සාම්පල විශ්ලේෂණය කිරීමේ කටයුතු සිදුකරන ලදි.

වටපණුවන් ආසාධනය වීම හේතුවෙන්, ගම්මිරිස් වගාව සඳහා වැළඳන සෙමෙන් මැළවීමේ රෝගය පහසුවෙන් හඳුනාගැනීම සඳහා දර්ශකයන් හඳුනා ගැනීම හා හානිය පාලනය සඳහා භාවිතා කලහැකි විවිධ පාලන ක්‍රම වල කාර්යක්ෂමතාවය ඇගයීම.

මෙම පර්යේෂණ ව්‍යාපෘතිය 2018 වර්ෂයේ මැද භාගයේදී ගම්මිරිස් වගාව සඳහා වටපණුවන් හානි කිරීම නිසා ඇතිවන සෙමෙන් මැළවීමේ රෝගය හඳුනා ගැනීම සඳහා දර්ශකයන් නිර්ණය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලදි. මෙම කාලසීමාවේදී වටපණුවන් ආසාධිත පසෙන් සහ මුල් වලින් වෙන්කර ගැනීම සහ ඔවුන් හඳුනා ගැනීමට අදාල මූලික අධ්‍යන කටයුතු සිදුකරන ලදි. මෙම පර්යේෂණයට අදාල ක්ෂේත්‍ර ආදර්ශණයට අදාල තවාන් පැල මේ වනවිට සකසා ඇත.

- **පසු අස්වනු තාක්ෂණය**

ගම්මිරිස් සඳහා හරිතාගාර වියලන සැළසුම් කිරීම, සකස් කිරීම හා ඇගැයීම

පසු අස්වනු තාක්ෂණ අංශයේ අස්වැන්න වියලීම සඳහා සකස් කර ඇති කමත ආශ්‍රිතව මෙම හරිතාගාර වියලනය ස්ථාපිත කර ඇත. වියලනය අඩි 20ක් දිගින් සහ අඩි 10ක් පළලින් යුක්ත වේ. 3" × 2" විශාලත්වය සහිත තැටි 36ක් පමණ මෙය තුල ඇති යකඩ ව්‍යුහය මත ඇසිරීමේ පහසුකම් ඇත. ගම්මිරිස් වියළීමේ පරීක්ෂාවන් 2ක් ක්‍රියාත්මක කර ඇති අතර මෙහි වියළීමේ උපරිම උෂ්ණත්වය 45^0C පමණ වේ. ඉහත පරීක්ෂාවන් දෙකේදී උණු වතුර ප්‍රතිකාරය කරන ලද ගම්මිරිස් වියලීම සඳහා ගත වූ කාලය පිලිවෙලින් පැය 13ක් හා පැය 16ක් වේ. වියලනයේ ධාරිතාවය ගම්මිරිස් 130 – 140 kg ක් පමණ වේ.

ගම්මිරිස් තොග ගබඩා කිරීම සඳහා සුදුසු ඇසුරුමක් නිර්ණය කිරීම

2017 ඔක්තෝම්බර් මස ගම්මිරිස් තොග ගබඩා කිරීම සඳහා සුදුසු ඇසුරුමක් නිර්ණය කිරීමේ පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. මෙහිදී පහත අයුරින් ඇසුරුම් 4ක් පරීක්ෂාවට ලක් කරන ලදී.

T1 - වියන ලද පොලිප්‍රොපිලින් බෑගය

T 2 - වියන ලද පොලිප්‍රොපිලින් බෑගය තුල අඩු ඝණත්ව පොලිඑතිලින් බෑගය (300 ගේජ්)

T 3 - වියන ලද පොලිප්‍රොපිලින් බෑගය තුල ලැමිනේට් කරන ලද පොලිප්‍රොපිලින් බෑගය

T 4 - වියන ලද පොලිප්‍රොපිලින් බෑගය තුල පොලිප්‍රොපිලින් බෑගය

කාමර උෂ්ණත්වයේ සහ වායුගොලීය පීඩනය යටතේ ගම්මිරිස් කිලෝ 5 බැගින් වෙන වෙනම මෙම බෑග් තුල ගබඩා කරන ලදී. මාස් පතා මෙම ගම්මිරිස් වල තෙතමන ප්‍රතිශතය, බරෙහි අඩුවීම, තෙල් ප්‍රතිශතය, ඔලියෝරෙසින් ප්‍රතිශතය සහ වර්ණය තත්ත්ව පරීක්ෂාවට ලක් කරන ලදී. මෙම පරීක්ෂණය තවදුරටත් ක්‍රියාත්මක වේ.

කළු ගම්මිරිස් සකස් කිරීමේදී උණු වතුර ප්‍රතිකාරය මගින් සිදුවන බලපෑම

කාමර උෂ්ණත්වයේදී සහ වායුගෝලීය පීඩනයේදී අමු ගම්මිරිස් නියැදි කිහිපයක් භාවිත කර එක් එක් සාම්පල් සඳහා කාල පරාසය වෙනස් කරමින් උණු වතුර ප්‍රතිකාරය ලබා දෙන ලදී.මෙම අමු ගම්මිරිස් නියැදි වියලීම සඳහා ගතවන කාලය, තෙතමන ප්‍රතිශතය සහ වර්ණය පරීක්ෂා කරන ලදී. මෙහිදී බිම්මල් බදුන් ගත මාධ්‍ය ජීවානුහරණය සඳහා භාවිතා කරන හුමාල උදුන මූලාකෘතිය ලෙස යොදා ගෙන ගම්මිරිස් උණු වතුර ප්‍රතිකාරය සඳහා හුමාල උඳුනක් වරකාපොල නිවි එවරස්ට් ආයතනය මගින් නිෂ්පාදනය කරන ලදී.

- **ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනනය**

කළු ගම්මිරිස් බහු මුහුණත් වගා කිරීමේ ව්‍යාපෘතිය

කළු ගම්මිරිස්හි විවිධාකාර ප්‍රභේද වගා කිරීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලද අතර පැනියුර් 1 සහ UD-21 සියළු ප්‍රදේශ වලට සුදුසු බව සොයාගන්නා ලදී. අස්වැන්න පිළිබඳ දත්ත වලට අනුව මිද්දෙණිය ප්‍රදේශයේදී KWW-12, UD-21, MB-12 සහ Wasanagama යන වර්ග 4 පිළිවෙලින් වාර්ෂිකව වැලකින් ග්‍රෑම් 4696.7, 4460, 3622 සහ 3363.3 යන අස්වනු ලබාදෙන ලදි. මාතලේ ප්‍රදේශයේ අස්වනු දත්ත අනාවරණය කර ඇත්තේ, UD-21, Panniyur-1, and KWW-10 ප්‍රභේදයන් වසරකට වැලකට වියළි ගම්මිරිස් කිලෝග්‍රෑම් 2 කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා දෙන බවය. නිල්ලඹේ ප්‍රදේශයේදී පැනියුර්-1, DM.-7, Wasanagama සහ KWW-12 ප්‍රභේද පිළිවෙළින් වාර්ෂික අස්වැන්න වැලකට ග්‍රෑම් 1937.3, 1887.1, 1752, 1477.9 ලෙස ලැබී ඇත. මිද්දෙණිය සහ මාතලේ යන ප්‍රදේශ වලදී UD-21 සහ MB-12 ප්‍රභේදයන් හොඳින් අස්වනු ලබාදුන් අතර KWW-12 ද මිද්දෙණිය ප්‍රදේශයේදී හොඳින් අස්වැන්න ලබාදුනි.

දේශීය ගම්මිරිස් වරණයන් දේශීය වශයෙන් ඇගයීම

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ දේශීය වරණ වලින් කලාපීය තත්වයන්ට අනුවර්තනය වූ උසස් අස්වැන්නක් ලබා දෙන සුපිරි වරණ හඳුනා ගැනීමයි. කොළොන්න, බඩල්කුඹුර, රත්තොට, බදුල්ල සහ මිද්දෙණිය යන දිස්ත්‍රික්ක වල ක්ෂේත්‍රයන් පර්යේෂණ කටයුතු සඳහා තෝරා ගනු ලැබිණි. කොළොන්න, රත්තොට හා බඩල්කුඹුර යන ප්‍රදේශවල ගම්මිරිස් පැළ ස්ථාපිත කර ඇත. 2018 දී රත්තොට සහ බඩල්කුඹුර යන ප්‍රදේශවල පිහිටුවා ඇති ක්ෂේත්‍රයන්හි වර්ධනය පිළිබඳ දත්ත රැස්කර ඇත.

ශ්‍රී ලංකාව තුළ ගම්මිරිස් විශේෂ එකතු කිරීම, ලක්ෂණ, සංරක්ෂණය සහ භාවිතය

දැනට ගම්මිරිස් වර්ග 10 ක් එකතු කර ඇත. මොණරාගල ප්‍රදේශයෙන් තවත් ප්‍රභේද දෙකක් ගෙන ඇති අතර, දඬු කැබලි සිටුවීම අනාගත ගුණනය කිරීම සහ හඳුනා ගැනීම සඳහා රෝපණය කරන ලදී. පසු අස්වනු තාක්ෂණ අංශය රසායනික විශ්ලේෂණය සඳහා සහයෝගය ලබා දී ඇත. සියලුම සාම්පලවල රසායනික විශ්ලේෂණය සම්පූර්ණ කරන ලද අතර, ගම්මිරිස් හි වල් දර්ශ 6 ක තෙල්, ඔලියොරෙසින් හා පයිපරීන් නිර්ණය කරන ලදී.

අලුතින් නිර්දේශ කරන ලද ගම්මිරිස් දෙමුහුම් යොදා ගනිමින් මව් උද්‍යාන පිහිටුවීම

මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ අලුතින් නිකුත් කරන ලද ඩිංගිරාල, බූටෑවේරාල සහ කොහුකුඹුරේරාල යන ප්‍රභේද වල මව් ශාක උද්‍යාන පිහිටුවීමයි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යම පැල තවාන් තුළ මව් ශාක උද්‍යාන පිහිටුවා ඇත. හොලොන්ගොල්ල, සෙරපිස්, වෙන්නෝරුව සහ වල්පිට තවාන් වලදී ඒවා මිලදී ගත හැකිය.

- පාංශු හා ශාක පෝෂණ

ගම්මිරිස් වගාවක වර්ධනය සහ පලදාව ඉහල නැංවීමට නයිට්‍රජන් පොහොර ප්‍රභවයේ බලපෑම පරීක්ෂා කිරීම

ප්‍රතිපලවලට අනුව ගම්මිරිස් සඳහා දැනට නිර්දේශිත පොහොර මිශ්‍රණයෙන් අඩක් එහි නයිට්‍රජන් ප්‍රභවය ලෙස ඇමෝනියම් සල්ෆේට් භාවිතා කර අවුරුද්දකට පැළයකට ග්ලිරිසිඩියා කොළ පොහොර කිලෝග්‍රෑම් 10 ක් සමග යෙදුවිට ගම්මිරිස් අස්වැන්නේ සැලකියයුතු වැඩිවීමක් සිදුවේ.

ගම්මිරිස් බෝගයේ වර්ධනය පාංශු ලක්ෂණ හා අස්වැන්න කෙරෙහි ආවරණ බෝග වල බලපෑම.

ශ්‍රී ලංකාවේ ගම්මිරිස් ක්ෂේත්‍ර වල පාංශු ලක්ෂණ, වර්ධනය හා අස්වැන්න වැඩිකිරීම සඳහා යොදා ගතහැකි ආවරණ බෝග හඳුනා ගැනීම සඳහා මෙම පර්යේෂණය ආරම්භ කරන ලදි.

මේ සඳහා යොදාගන්නා ලද ආවරණ බෝග වන්නේ වල් රටකජු (*Arachis pintoi*),ඩෙස්මෝඩියම් (*Desmodium ovalifolium*) හා මුකුණා (*Mucuna bracteata*) යන ඒවායි. මෙතෙක් කරන ලද පර්යේෂණ වලින් වල් රටකජු (*Arachis pintoi*) හා ඩෙස්මෝඩියම් (*Desmodium ovalifolium*) යන ආවරණ බෝග ගම්මිරිස් වගාවේ පාංශු ලක්ෂණ දියුණු කිරීමටත්, වර්ධනය හා අස්වැන්න වැඩි කිරීමටත් හේතුවන බව තහවුරුවී ඇත. මෙම පර්යේෂණය තව දුරටත් සිදුකරනු ලැබේ.

ගම්මිරිස් සෙමින් මැලවීමේ තත්වය සිදුවීම සඳහා විවිධ පාංශු තෙතමන තත්ව යටතේ දිලීරක මූල වල බලපෑම.

මාතලේ රතු දුඹුරු ලැටෝසොලික් පසේ වැඩුණු ගම්මිරිස් වැල් බොහෝමයක් දේශීය දිලීරක මූල විශේෂයක් මගින් ආසාදනය වී ඇති බව, පසේ තිබුණු ඉහල දිලීරක මූල බීජානු ඝනත්වය සහ ගම්මිරිස් මුල් සෛල තුල දක්නට ලැබුණු ආබස්කියුල සහ වෙසිකල නම් විශේෂ ව්‍යූහ මගින් තහවුරු විය. එම දිලීරක මූල විශේෂය ග්ලෝමස් නම් විශේෂය ඇතුලත් වන ග්ලොමරෙස් නම් ගණයට අයත් බවද පෙනීයයි.

ගම්මිරිස් සඳහා භූමියේ යෝග්‍යතාවය වර්ගීකරණය කිරීම.

මෙම පර්යේෂණය 2018 වර්ශයේදී NARP ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලද අතර, මෙමගින් ගම්මිරිස් සඳහා සුදුසු පාංශු ලක්ෂණ වර්ගීකරණයක් සිදුකිරීමට බලාපොරොත්තු වේ. දැනට රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, ගොඩකවෙළ හා කොළොන්න යන ප්‍රදේශවල පාංශු විශ්ලේෂණය නිමකර ඇත.

තිරසාර වගාවක් සඳහා අස්වැන්න නෙලා ගැනීමෙන් පසු ඉවතලන ගම්මිරිස් (*Piper nigrum* L) නටු පරිසර හිතකාමී ලෙස ප්‍රතිචක්‍රීකරණය කිරීම මගින් කොම්පෝස්ට් සෑදීම.

ගම්මිරිස් නටු යොදාගෙන වට්ටෝරු අනුව කොම්පෝස්ට් සෑදීම සිදු කෙරී ඇති අතර දැනට අවසන් නිෂ්පාදනයේ ගුණාත්මකභාවය, කෘෂි රසායනික ලක්ෂණ, ඇගයීම සිදු කරනු ලැබේ. සැදූ කොම්පෝස්ට් වල පෛව විද්‍යාත්මක ලක්ෂණ විශ්ලේෂණය ව්‍යාධිජනක අංශය මගින් සිදු කරනු ලැබේ.

වියළි කලාපයේ වගාකරන ලද "ඩිංගිරාල" ගම්මිරිස් ප්‍රභේදය අකාබනික පොහොර සඳහා දක්වන ප්‍රතිචාර හා ලෙඩ රෝග වලට දක්වන ප්‍රතිරෝධය අධ්‍යනය කිරීම.

මෙම පර්යේෂණය 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, මේ වන විට සාර්ථකව ක්ෂේත්‍ර ස්ථාපණය කර ඇත. ක්ෂේත්‍ර ස්ථාපණ ප්‍රතිශතය 90%ක් හා මධ්‍යස්ථ උස අඩි 5ක් 6ක් පමණ වේ. නමුත් මෙහි පාර්ශවික අතු වල වර්ධනය තරමක් දුර්වලය.

- **කායික විද්‍යා හා පැළ නිෂ්පාදනය**

ගම්මිරිස් පැළ නිෂ්පාදනය සඳහා කොහුබත් කැට විවිධ පොහොර සංයෝග සමග භාවිතා කිරීමේ හැකියාව අධ්‍යනය කිරීම.

පිඩනයට ලක් කල 60×120 mm ප්‍රමාණයේ කොහුබත් කැට වල විවිධ ඇල්බට් පොහොර සාන්ද්‍රන සමග ගම්මිරිස් සිටුවීම අධ්‍යනය කරන අතර මේ සඳහා වෙනස් වූ ඇල්බට් සාන්ද්‍රණ 8 ක් යොදා ගැණින. එයින් 20ml ක් එක් පැළයකට ලැබෙන පරිදි සිටුවා මාස 2 න් හා මාස 3 න් යොදයි. පැළයේ උස හා පත්‍ර සංඛ්‍යාව සති 2 න් දෙකට මනින ලදී. ඊට අමතරව මුල්වල දිග, වායව කොටසේ බර මුල්වල බර හා ඒ අතර අනුපාතය මාස 31/2 දී මැන ගන්නා ලදී.
කිසිදු ප්‍රතිකර්මයන් අතරේ සැලකිය යුතු ලෙස වෙනසක් නොතිබූ අතර 12.5 , 25 , 50 gl^{-1} යන ඇල්බට් සාන්ද්‍රණ යෙදූ පැළ වල ඉහළ උසක් දක්නට ලැබුණි.

25 gl^{-1} ඇල්බට් සාන්ද්‍ර ද්‍රාවනය යෙදූ ප්‍රතිකර්මය අඩු වියදම් සහිත වන බැවින් එම ප්‍රතිකර්මය භාවිතා කල හැක.

ගම්මිරිස් මුදුන් රිකිළි, හරස් අතු සහ ධාවක දඬු යොදා ගනිමින් සාදාගත් පැළ වල වර්ධනය හා අස්වැන්න පිළිබඳ ක්ෂේත්‍ර සැසඳීම.

ගම්මිරිස් පැළ නිෂ්පාදනය සඳහා මුදුන් රිකිළි, හරස් අතු හා ධාවක වල සාර්ථකත්වය සෙවීමේ අරමුණින් කළ මෙම පර්යේෂණයේ මුදුන් රිකිළි යොදාගනිමින් සාදාගත් පැළ ක්ෂේත්‍රයේ වැඩි ස්ථාපන ප්‍රතිශතයක්

පෙන්වූ අතර ඉහළ වර්ධනය මට්ටමක හා වැඩි හරස් අතු ප්‍රමාණයක් මෙන්ම ඉහළ අස්වැන්නක් ලබා දෙයි.

පටකරෝපිත ගම්මිරිස් පැළ හා දඬු මඟින් නිෂ්පාදිත ගම්මිරිස් පැළ ක්ෂේත්‍රයේ වර්ධනය හා අස්වැන්න සැසඳීම.

පටකරෝපිත ගම්මිරිස් පැළ ක්ෂේත්‍රයේ සිටුවීමේ යෝග්‍යතාවය සෙවීමේ අරමුණ ඇතිව ආරම්භ කල මෙම පර්යේෂණයේ මේ දක්වා ප්‍රතිඵලය වූයේ දඬු මඟින් ලබාගන්නා පැළ මෙන්ම පටකරෝපිත පැළද ක්ෂේත්‍රයේ සාර්ථකත්වයක් පෙන්වන බවයි.

5.2.3. කොකෝවා

- **ශෂ්‍ය විද්‍යා හා බෝග ප්‍රවර්ධන**

මාතලේ දිස්ත්‍රික්කයේ කොකෝවා (*Theobroma cacao.* L) වගා කර ඇති මුල් කැබලි වල ක්ෂේත්‍ර කාර්යසාධනය ඇගයීම

උඩරට බද්ධ වූ කොකෝවා (***Theobroma cacao.*L)** පැළැටිය වන **Na32 x ICS1 (Chopon Scion)** වලින් ඉහළම ස්ථාපිත අනුපාතය **(91.6%)** ඇති අතර මාතලේ දිස්ත්‍රික්කය **(58.3%)** ඉතා පහළ අගයක් ගනී. **Wk2 (Wykumbara -2)** හි ස්ථාපිත අනුපාතය **(83.3%)** සියළුම පැතිරුම් තාක්ෂණ ක්‍රම ඔස්සේ විවිධ වර්ගවල මුල්වල ඇති මුල් කැබලි වල ස්ථාපිත අනුපාතය **58.3%** කි.

කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පොල් අතරේ වවනු ලබන කොකෝවා වල ඵලදයිතාවය වැඩිකරලීමේ අධ්‍යනය

w 5/5 සහ IBRS I යන කොකෝවා බීජ පැළ සහ බද්ධ පැළ අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ සහ ඉබ්බාගමුව පොල් වත්තක සිටුවන ලදී. වර්ධක නිර්ණායක ලෙස ශාකයේ උස ,හරස් අතු සංඛ්‍යාව,සහ කඳේ විෂ්කම්භය මනිනු ලබයි.වර්ධක නිර්ණායකයන්ට අනුව සිටුවන ලද කොකෝවා ප්‍රභේද දෙකෙන් හරස් අතු වැඩි සංඛ්‍යාවක් ඇත්තේ බද්ධ කරන ලද පැල වල අතර W5/5 බද්ධ පැළ IBRS I බද්ධ පැළ වලට වඩා වැඩි උසක් පෙන්නුම් කරයි.

- **ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනනය**

විවිධ දේශගුණික කලාප සඳහා විවිධ කොකෝවා වරණ ඇගයීම (මාතලේ, බඩල්කුඹුර)

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ විවිධ කෘෂි දේශගුණික කලාප සඳහා ගැලපෙන කොකෝවා වරණ හඳුනා ගැනීමයි. බඩල්කුඹුර පර්යේෂණ ක්ෂේත්‍රයේදී විවිධ කොකෝවා වරණ **10** ක් යොදාගෙන ඇති

අතර **168** වන වරණය ගෙඩි **27** ක ඉහළ අස්වැන්නක් ලබාදී ඇත. මාතලේ පර්යේෂණ ක්ෂේත්‍රයේ අස්වැන්න තවම සිදු කර නොමැති අතර ක්ෂේත්‍ර නඩත්තුව සිදු වෙමින් පවතී.

දැනට පවත්නා කොකෝවා (*Theobroma cacao* L.) වල ලක්ෂණ තීරණය කිරීම සහ ක්ලෝනීය උද්‍යානයක් පිහිටුවීම

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ක්ලෝනීය උද්‍යානයක් ස්ථාපනය කිරීමයි. මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේ මෙම ක්ෂේත්‍රය නඩත්තු කරනු ලැබේ. පර්යේෂණය 2019 දී අවසන් කිරීමට නියමිතය

- **පාංශු හා ශාක පෝෂණ**

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සමග සමෝදානික ශාක පෝෂක කළමනාකරණය මගින් කොකෝවා වගාවක පලදායීතාවය ඉහල නැංවීම

රබර් වගාවක අතුර වගාවක් ලෙස මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටි නක්කලත්, අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි පදියතලාවත් වගාකර මේ වනවිට වයස අවුරුදු 7 ක් පමණවන කොකෝවා ශාක හොඳින් වර්ධනය වී පලදරන අවධියට පත්ව ඇති අතර සාර්ථකව කොකෝවා වගා කිරීමට එම ප්‍රදේශවල ඇති යෝග්‍යතාව පැහැදිලිකරයි. එලෙසම කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි නාරම්මල සහ මාවතගම ප්‍රදේශ වල පොල් අතර වගාකළ කොකෝවාද සාර්ථකව වර්ධනය වී පලදරන අවධියේ පවතී.

කොකෝවා වගාවක පාංශු තත්ව ඉහලනැංවීමට දිරාපත් කොකෝවා ලෙලිවලට හිතකර ජෛව සංගටක එකතුකර පාංශු සකසනයක් ගොඩනැංවීම

දිරාපත් කොකෝවා ලෙලි වලින් හදුනාගෙන වෙන්කරගත් හිතකර පාංශු ක්ෂුද්‍රජීවීන් ගුණනය කර නැවත දිරාපත් කොකෝ ලෙලි කොම්පෝස්ට් වලට අමුකුලනය කලද සාර්ථක නොවිණි. එබැවින් ගබඩා කළ බැක්ටීරියා සහ දිලීර වෙනත් මාධ්‍ය තුල වගාකිරීම සඳහා තව දුරටත් නඩත්තුකරන ලදී.

5.2.4. කෝපි

- **ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනනය**

කටිමෝර් කෝපි වගාවන් ඇගයීම

මෙම පර්යේෂණයේ පරමාර්ථය ඉහළ ඵලදාවක් සහිත, රෝග, පළිබෝධ සහ නියහයට ප්‍රතිරෝධී ශාක හඳුනා ගැනීමයි. **ප්‍රභේද 5ක ශාක** 820 ක් සහිතව ක්ෂේත්‍රය රෝපණය කර ඇත. කටිමූර්, S9 4/5, S9 4/2,

HTD සහ S4711 ප්‍රභේද පහකි. 2018 දී ලබාගත් දත්ත වලට අනුව කටිමූර් අනෙක් ඒවාට වඩා වැඩි අස්වැන්නක් ලබා දී ඇත.

ශ්‍රී ලංකාවේ කෝපි සඳහා භූගෝලීය දර්ශකය ප්‍රතිස්ථාපනය කිරීම

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ භූගෝලීය ප්‍රදේශ අනුව ශ්‍රී ලංකාවේ කෝපි වල ඉහළ අස්වනු ප්‍රභේද හඳුනාගැනීමයි. **භූගෝලීය දර්ශකය ප්‍රතිස්ථාපනය කිරීම** ඇරබිකා කෝපි සඳහා සිදු කෙරේ. කොත්මලේ, ඇටිපොල, පන්විල, මාතලේ පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රදේශ වල ක්ෂේත්‍ර පිහිටුවා ඇත.

අස්වැන්න, ගුණාත්මකභාවය සහ ප්‍රධාන පලිබෝධ හා රෝග වලට ප්‍රතිරෝධී බව සඳහා ඇරබිකා කෝපි අගැයීම

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ප්‍රධාන පලිබෝධ සහ රෝගවලට ඔරොත්තු දෙන ඇරබිකා කෝපි සොයා ගැනීමයි. මාතලේ පර්යේෂණ මධ්‍යස්ථානයේ පිහිටා ඇති ක්ෂේත්‍රයේ පැළ සංඛ්‍යාව 322 කි. 2009 වර්ෂයේ දී ක්ෂේත්‍ර රෝපණය කිරීම සිදු කර ඇත. 2014 වර්ෂයේදී දත්ත එක්රැස් කිරීම ආරම්භ කර ඇත. 2018 දී එකතු කරන ලද දත්ත වලට අනුව වසරකට 3.5 kg ට වැඩි අස්වැන්නක් S9 ප්‍රභේදය ලබා දී ඇත.

- **පැලෑටි සංරක්ෂණය**

කෝපි දෙමුහුම් ප්‍රභේද සඳහා ඇතිවූ කෘමි හානිය

ලක් පැරකුම් ප්‍රභේදය සඳහා සේනා දළඹු විශේෂයක ගේ (*Spodoptera* sp.) හානියක් ප්‍රථම වරට වාර්තා විය.

කෝපි බදරි ගුල්ලා පාලනය සඳහා *Beauveria brassiana* දිලීරය භාවිතා කිරීම.

බීජානු සාන්ද්‍රනය මිලි ලීටරයට 1 *10^8 වූ ද්‍රාවනය එක් අත්තකට මිලි ලීටර් පහක් වන ලෙසට කෝපි ගෙඩි හටගන්න කාලයෙදී ඉසින ලදී. වර්ධනය මාස 1 සිට 5 දක්වා කාලය තුලදී, කෝපි ගෙඩි මතුපිට දිලීරය වර්ධනය වීම නිරීක්ෂනය කල විට සෑම මාසයකම සමාන මට්ටමක පැවතුනි.

කෝපි බදරි ගුල්ලා පාලනය සඳහා ජෛවීය කාරකයන් විමර්ශනය කිරීම

හයිමෙනොප්ටෙරා ගෝත්‍රයට සහ ඉයුලොපිඩේ පවුලට අයත් එක් ජෛව පරපෝෂිතයෙක් වන *Phymastichus coffea* Lasalle. පර්යේෂනාගාරය තුලදී හඳුනා ගන්නා ලදී.

කෝපි බදරි ගුල්ලා පාලනය සඳහා උගුලක් නිර්මාණය කිරීම

ඇරබිකා වර්ගයට අයත් HDT ප්‍රභේදය සඳහා බදරි ගුල්ලාගේ හානිය විද්‍යාත්මකව ඉහල මට්ටමක පවතින අතර, ලක් පැරකුම් දෙමුහුම් ප්‍රභේදය සඳහා වන හානිය HDT ප්‍රභේදයට වඩා අඩු මට්ටමක පවතී.

- **පාංශු හා ශාක පෝෂණ**

කාබනික ඇරබිකා කෝපි වගාවකට උපායමාර්ග

පවතින දත්තවලට අනුව පැලයකට ගොම පොහොර කිලෝග්‍රෑම් 10 ක් යෙදීම කාබනික කෝපි වගාවක් සඳහා නිර්දේශ කළ හැක.

- **පසු අස්වනු තාක්ෂණය**

සුළු පරිමාණ කෝපි රෝස්ටරය (කෝපි බැදීමේ යන්ත්‍රය)

කුඩා ප්‍රමාණයේ කෝපි රෝස්ට් කිරීමේ යන්ත්‍රයක් වශයෙන් නිර්මාණය කොට සංවර්ධනය කර ඇත. මෙම කෝපි රෝස්ටරයේ කෝපි ගැටෙන සියළු කොටස් මළ නොබැඳෙන වානේ (stainless steel) වලින් සාදා ඇති අතර එය ආහාර ගුණාත්මය තහවුරු කිරීමට වැදගත් වෙයි. වරකට කෝපි කි. ග්‍රෑ. 5-8 ප්‍රමාණයක් බැද ගැනීමට හැකියාව ඇත. මෙහි මූලික පරික්ෂණ සිදු කොට ඇති අතර විවිධ කෝපි රෝස්ට් කිරීම සඳහා වඩාත් සුදුසු කාල හා උෂ්ණත්ව පරාසයන් ගැන වැඩි දුරටත් අධ්‍යයනය කරමින් ඇත.

මෙම යන්ත්‍රයෙන් කෝපි පැය 1-1.5 අතර කාලයකින් බැදගැනීමේ හැකියාව ඇත. මෙම යන්ත්‍රයේ උෂ්ණත්වය හා බැඳෙන කාලය සුදුසු පරිදි වෙනස් කිරීමෙන් අවශ්‍ය පරිදි කෝපි බැද ගැනීමට හැකියාව ඇත. විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකින් හට හඳුන්වා දිය හැකි මෙම යන්ත්‍රය මගින් කෝපි පමණක් නොව කුළු බඩු මිශ්‍රණ, කජු, රට කජු, කොකෝවා ආදී විවිධ කෘෂි නිෂ්පාදන බැදගැනීමේ හැකියාව ඇත.

ඇරබිකා හා රොබස්ටා කෝපි වරණවල අඩංගු කැෆේන් ප්‍රමාණයන් නිර්ණය කිරීම.

මෙම පර්යේෂණය සිදු කරන ලද්දේ සමාන ජානමය ලක්ෂණ සහිත නමුත් විවිධ කාලගුණික තත්ව යටතේ වගා කර සකස් කරන ලද කෝපිවල රසායනික සංයුතිය නිර්ණය කිරීමටයි. ඒ අනුව බ්‍රසිලියානු, කොලොම්බියානු, ඉතියොපියානු, ලාංකික කෝපි, S9 කෝපි, HDT කෝපි හා කටිමූර් කෝපිවල කැෆේන් ප්‍රමාණයන් පිළිවලින් 1.202,1048,1.114,1.109,1.029,0.909 හා 0.820 විය. සංවේදන පරීක්ෂණය අනුව S9 කෝපිවල නම, සුවඳ, රසය සහ සමස්ත පිළිගැනීම ඉහල විය.

5.2.5. **එනසාල් (කරඳමුංගු)**

- **ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනනය**

මහෝගනී (කිරිඇල්ල) යටතේ පහළ උන්නතාංශය සඳහා කරඳමුංගු වරණ ඇගයීම

අවිස්සාවේල්ල ප්‍රදේශය තුළ ප්‍රතිකාර 9 ක් ඇත. ප්‍රධාන අරමුණ වන්නේ අතුරු බෝගයක් ලෙස මහෝගනි සමඟ වගා කළ හැකි කරඳමුංගු ප්‍රභේද සොයාගැනීමයි.

ජලසම්පාදනය යටතේ අඩු උන්නතාංශයේ කරඳමුංගු ප්‍රභේද පිළිබඳ ක්ෂේත්‍ර අධීක්ෂණය

ජලසම්පාදනය යටතේ අඩු උන්නතාංශවල කරඳමුංගු වර්ග පිළිබඳ ක්ෂේත්‍ර තක්සේරු කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. නිල්ලඹේ උප පර්යේෂණ මධ්‍යස්ථානයේ පර්යේෂණ ක්ෂේත්‍රයක් පිහිටුවා ඇත.

5.2.6. කරාඹු

- **කායික විද්‍යා හා පැළ නිෂ්පාදනය**

මල් පිපීම උත්තේජනය කිරීම සඳහා ශාක වර්ධක හෝමෝන භාවිතය

පහත සඳහන් හෝමෝන තුන විවිධ සාන්ද්‍රණ වලින් මේ සඳහා යොදාගත් අතර, කරාඹු ශාකය කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීය.

එත්රල් - (100 ppm, 300 ppm, 500 ppm, 700 ppm)

තයෝයූරියා - (100 ppm, 300 ppm, 500 ppm, 700 ppm)

පැක්ලෝබියුට්‍රසාල් - (100 ppm, 300 ppm, 500 ppm, 700 ppm)

- **පැලෑටි සංරක්ෂණය**

මැදරට කලාපයේ කරාඹු වගාව සඳහා වාර්තාවී ඇති පත්‍ර පතන රෝගය කලමනාකරණය කිරීම.

කරාඹු පත්‍ර පතන රෝගයේ රෝග කාරකයින් ලෙස හඳුනාගෙන තිබූ සිලින්ඩ්‍රෝක්ලේඩියම් දිළිර විශේෂයට රූප විද්‍යාත්මකව සමාන දිළිර විශේෂ දෙක ජාන තාක්ෂණය භාවිතා කර වෙන්කර හඳුනා ගැනීම සඳහා ,කොළඹ 05 කිරිමණ්ඩල මාවතේ පිහිටි ආසිරි විද්‍යාගාරය වෙත භාරදෙන ලදි. එහිදී 285 rNA ජාන තාක්ෂණය භාවිතා කර ඉහත සඳහන් දිළිර විශේෂ දෙක සිලින්ඩ්‍රෝක්ලේඩියම් රෙටියුඩි සහ කැලොනෙට්‍රියා විශේෂය ලෙස හඳුනා ගන්නා ලදි. තවද ව්‍යාධිජනක පරීක්ෂාවේදී කැලොනෙට්‍රියා දිළිර විශේෂය මඟින් කරාඹු පත්‍ර අංගමාරය රෝගී තත්වයත්, සිලින්ඩ්‍රෝක්ලේඩියම් රෙටියුඩි දිළිරය මඟින් කරාඹු පත්‍ර පුල්ලි රෝගයත් ඇතිවන බව තහවුරු කරගන්නා ලද අතර, මෙම දිළිරයන් දෙකම එකවර කරාඹු ශාකයට ආසාධනය වීම හේතුවෙන් පත්‍ර පතන රෝගය වැඩි තීව්‍රතාවයකින් වාර්තාවන බව සොයාගන්නා ලදි.

- **පසු අස්වනු තාක්ෂණය**

මාතලේ ප්‍රදේශයේ වගාකරනු ලබන කරාබු බෝගයන්හි කරාබු මල්, කරාබු නටු සහ කොළ වල අඩංගු අත්‍යවශ්‍ය තෙල්, රසායනිකසංයුතිය, ඛනිජ හා ඛනිජ සංයුතිය, (*Syzygium aromaticum* L., *Eugenia caryophyllata* thunb) **පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණ**

කරාඹු නැටි (*Syzigium aromaticum* L., *Eugenia caryophyllata* Thunb) යනු ඖෂධ, රූපලාවණ්‍ය, ආහාර සහ කෘෂිකාර්මික යෙදවුම් සඳහා විශාල ශක්‍යතාවයක් ඇති ප්‍රසිද්ධ කුළු බඩුවකි. එය නිවර්තන සහ උප-නිවර්තන ප්‍රදේශ වල බහුලව වගා කෙරේ. කරාඹු මල් , නැටි හා පත්‍ර වල වාෂ්පශීලී තෙල් ප්‍රතිශතය පිළිවෙළින් 18.739, 7.870, සහ 7.564 වේ. කරාඹු මල් , නැටි හා පත්‍ර වල වාෂ්පශීලී නොවන ඊතර් නිස්සාරණ ප්‍රතිශතය පිළිවෙලින් 22.682, 8.893 සහ 5.229 වේ. ගෑස් ක්‍රොමැටොග්‍රැෆික් විශ්ලේෂණයට අනුව මාතලේ වගා කරන ලද කරාඹු වල කරාඹු මල් , නැටි හා පත්‍ර තෙල් වල ඊයුජිනෝල් අන්තර්ගතය 69.9672%, 81.5781%, 85.5558% ලෙසින් හෙළි විය. නමුත් සමස්ත ලෙස ගත් කල කරාඹු මල් වල ඉයුජිනෝල් අන්තර්ගතය සහ ඉයුජීනෝල් ඇසිටේට් 80% ක් අඩංගුව ඇත. නිර්දේශය වන්නේ කරාඹු, කරාඹු මල් පමණක් නොව නැටි හා පත්‍රද තෙල් නිස්සාරණය සඳහා යොදා ගත හැකිය.

5.2.7. ඉඟුරු

- **ශෂ්‍ය විද්‍යා හා බෝග ප්‍රවර්ධන**

දේශීය ඉඟුරු බෝගයේ වර්ධනය සහ අස්වැන්න සඳහා විවිධ වසුන් වර්ග වල බලපෑම සෙවීම

දේශීය ඉඟුරු සඳහා වඩාත් සුදුසු වසුන් වර්ග සෙවීම සඳහා පර්යේෂණයක් නාරම්මල අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ දී සිදුකරන ලදී. පිදුරු (පාත්තියට කි.ග්‍රෑ 1.5), ග්ලිරිසීඩියා කොල (පාත්තියට කි.ග්‍රෑ. 5), පොල් අතු (පාත්තියට පොල් අතු , කොහු බත් (පාත්තියට කි.ග්‍රෑ. 5.) සහ පොලිතින් යන වසුන් වර්ග 5 භාවිතයට ගන්නා ලදි. එක් ප්‍රතිකාරකයක් වසුන් නොයොදා පාලකය ලෙසට පවත්වා ගන්නා ලදී. දේශීය ඉඟුරු වල වර්ධනයට හා අස්වැන්න කෙරෙහි වඩාත්ම ධනාත්මක බලපෑමක් කරන ලද්දේ ග්ලිරිසීඩියා වසුන්වේ.දේශීය ඉඟුරු වල උපරිම අස්වැන්න (පඳුරකට ග්‍රෑම් 490) ලබාගත හැකිවූයේ ග්ලිරිසීඩියා වසුන් යෙදූ පාත්ති වලිනි.

ඉඟුරු වල වර්ධනය සහ අස්වැන්න මත විවිධ බීජ ඉඟුරු වල වයස් වල බලපෑම (*Zingiber officinale* Roscoe).

සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල මාස 10, 9, 8 මාස සහ මාස **7** ක් පැරණි බීජ සකස් කිරීම සඳහා බීජ පාත්ති පිළියෙල කර ඇත. පාත්ති 4 ක් නඩත්තු කරන අතර එහි පැවැත්මේ ප්‍රතිශතය ගණනය කරන ලදී.

ඉඟුරු හා කහ නාලස්ථ ප්‍රවාරණ ක්‍රමය මගින් විශාල ලෙස වාණිජ මට්ටමින් පැළ නිපදවා ගත හැකිය. මෙහිදී MS මධ්‍ය ලෙස භාවිතා කරන ලද අතර BAP 2mgl^{-1} ලෙසද NAA 0 .2mgl^{-1} ලෙසද ගනු ලැබිය. මුලික අත් හදා බැලීමේදී පටක රෝපිත කහ පැළ පඳුරකින් තෙතබර 2.5kg වඩා වැඩි අස්වැන්නක් ලබා ගත හැකිය. මෙම පර්යේෂණය තව දුරටත් සිදු වෙමින් පවතී

ඉඟුරු (Zingier officinal) වගාවේ වර්ධනය ගුණාත්මය හා අස්වැන්න කෙරෙහි විවිධ සෙවන ප්‍රමාණයන්ගේ බලපෑම අධ්‍යනය කිරීම

එකිනෙකට වෙනස් සෙවන ප්‍රමාණයන් *(*සෙවන ප්‍රතිශතයන්*)* හයක් යටතේ ඉඟුරු සිටුවීම සිදුකරන ලදි. ඒ අතරින් වඩාත්ම ඉහල අස්වැන්නක් *60%* සෙවන ප්‍රතිශතයක් යටතේ සිටුවන ලද ඉඟුරු පාත්ති වල වාර්තා විය. *80%* ක සෙවන ප්‍රතිශතයක් යටතේ වගාකරන ලද ඉඟුරු පාත්ති වල අස්වැන්න අඩුම අස්වැන්න වශයෙන් වාර්ථා විය.

- **පාංශු හා ශාක පෝෂණ**

පොලිසැක් මලුවල ඉඟුරු වගා කිරීම සහ එමගින් ඉඟුරු රයිසෝමයේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ඇතිවන බලපෑම

ඉඟුරු වගාව සඳහා යොදා ගැනෙන ඉඩම් සීමිත වීම, ඉඟුරු වගාව සඳහා යල්පැනගිය සම්ප්‍රදායික වගා ක්‍රම භාවිතය සහ කාබනික ද්‍රව්‍ය අඩු නිසරු පසක් වගාවට යොදා ගැනීම වැනි බාධක මගහරවා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ලෙස පොලිසැක් මලු තුල ඉඟුරු වගා කිරීමට ඇති හැකියාව පිළිබඳ ක්ෂේත්‍ර පර්යේෂණයක් මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථාන යේ දී සිදු කරන ලදී. කි.ග්‍රෑ. 25 සහ කි.ග්‍රෑ. 50 ප්‍රමාණයේ පොලිසැක් මලු මේ සඳහා භාවිතා කරන ලද අතර සිටුවීම සඳහා ග්‍රෑම් 50 සහ ග්‍රෑම් 100 ප්‍රමාණයේ ඉඟුරු බීජ අල යොදා ගැනුනි. එකිනෙකට වෙනස් බඳුන් මාධ්‍යයන් 3 ක් පර්යේෂණයේදී භාවිතා කරන ලදී. ග්‍රෑම් 100 බීජ ඉඟුරු යොදාගනිමින් කි.ග්‍රෑ. 50 පොලිසැක් මලු තුල ගොම පොහොර: කොහුබත්: මතුපිට පස්: වැලි 1:1:1:1 අනුපාතයෙන් යුත් වගා මාධ්‍යයක වගා කල බීජ ඉඟුරු වලින් වැඩිම අස්වැන්න (කි.ග්‍රෑ. 4.8), වැඩිම රිකිලි සංඛ්‍යාව (33) සහ ඉහළම ශාක උස (සෙ.මී. 89) වාර්තා විය. මෙම අගයන් අනෙකුත් සියළුම ප්‍රතිකර්ම මිශ්‍රණයන්ට වඩා සුවිශේෂී ඉහළ අගයක් පෙන්නුම් කිරීමකි. ඉහත බඳුන් මිශ්‍රණයට අඩු වියදම් විකල්පයක් ලෙස ගොම පොහොර, අර්ධ ලෙස දහනය කල දහයියා සහ මතුපිට පස් ඇතුලත් බඳුන් මිශ්‍රණය භාවිතා කල හැක.

- **පැලෑටි සංරක්ෂණය**

ඉඟුරු වගාවේ ප්‍රධාන රෝග කලමණාකරණය කිරීම.

ඉඟුරු වගාව සඳහා වාර්තාවී ඇති ප්‍රධානතම රෝගය ලෙස ඉඟුරු මෘදු කුණුවීම, බැක්ටීරියා මැළවීම සහ පත්‍ර පුල්ලි රෝගය හඳුනාගෙන ඇත. මෙම රෝගයන්හි රෝග කාරකයන් ලෙස පිළිවලින්, පීතියම් දිළීර විශේෂය, රැල්ස්ටෝනියා බැක්ටීරියා විශේෂය සහ පයිලොස්ටිකා දිළීර විශේෂය හඳුනාගෙන ඇත. මෙම ප්‍රධාන රෝග තුන පාලනය සඳහා එක් එක් බෝගයට ,වෙන් වෙන්ව වගා පිළිවෙත් , භෞතික පාලන

ක්‍රම,ජෛව විද්‍යාත්මක පාලන ක්‍රම සහ රසායණික මර්ධන ක්‍රම ඇතුලත් සමෝධානික රෝග පාලන ක්‍රමවේදයක් නිර්දේශ කරන ලදි.

ඉඟුරු පැලවීම සහ අස්වැන්න කෙරෙහි කොරපොතු කෘමීන්ගේ බලපෑම.

දෙහි කොල යොදා ගබඩා කරන ලද දේශීය ඉඟුරු සඳහා පලමු මාස තුන තුලදී කොරපොතු කෘමීන් ආසාදනය නොවුනු අතර, චීන ඉඟුරු සහ රන්ගුන් ඉඟුරු සඳහා දෙවෙනි මාසයේදීද කෘමි ආසාදනය ඇතිවිය. වල් සූරියකාන්ත සහ ගඳපාන කොල කෘමි ආසාදනය වැලැක්වීම සඳහා ප්‍රතිපල දායක නොවේ.

5.2.8 **කහ**

- **පසු අස්වනු තාක්ෂණය**

ශ්‍රී ලංකාවේ කහ වල රසායනික සංඝටක සහ ප්‍රතිඔක්සිකාරක ගුණ නිර්ණය කිරීම

මාතලේ වෙළඳපලෙන් සහ මාතලේ ගෙවතු වලින් කහ සාම්පල එකතු කරන ලදි.

නියැදි පිළියෙල කිරීමේ ක්‍රමයට අනුව කහ කුඩු පිළියෙල කරන ලදී. රසායනික සංඝටක විශ්ලේෂණය ආරම්භ කර ඇත. ඉදිරි කන්නයේ දී මාතලේ හා නාරම්මල පර්යේෂණ ස්ථානවල ඇති ජාන දර්ශ එකතුවලින් හා අම්පාර සාම්පල එකතු කිරීමට අදහස්කර ඇත. දැනටමත් එකතුකර ඇති සාම්පල වල තෙතමන අන්තර්ගතය, වර්ණය (L, a, b අගයන්) සහ කර්කියුමින් ප්‍රමාණය පිළිබඳ විෂ්ලේශණය දැනටමත් ආරම්භකර ඇත.

5.2.**9.** බුලත්

- **පාංශු සහ ශාක පෝෂණය**

බුලත් වගාවේ වර්ධනය සහ අස්වැන්න සඳහා විකල්ප පෝෂක ප්‍රභවයක් ලෙස අර්ධ වශයෙන් දහනය කරන ලද දහයියා භාවිතයේ බලපෑම අධ්‍යයනය කිරීම

බුලත් වගාව සඳහා විකල්ප පෝෂක ප්‍රභවයක් ලෙස අර්ධ වශයෙන් දහනය කරන ලද දහයියාවල බලපෑම අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී . ප්‍රතිකාර වර්ග 4 ක් මෙම පර්යේෂණය සඳහා භාවිත කරන ලදී . **T1 -** අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති බුලත් වගාවේ පොහොර නිර්දේශය,**T2-** අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොහොර නිර්දේශය + අර්ධ ලෙස දහනය කරන ලද දහයියා අඟුරු කිලෝ ග්‍රෑම් 5 , **T**3 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොහොර නිර්දේශය + මියුරේට් ඔෆ් පොටෑෂ් 100 % ප්‍රතිශතය වෙනුවට කර දහයියා අඟුරු කිලෝග්‍රෑම් 10 ක් , **T**4 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොහොර නිර්දේශය + අර්ධ ලෙස දහනය කරන ලද දහයියා

අඟුරු කිලෝ ග්‍රෑම් 5 + මියුරේට් ඔෆ් පොටෑෂ් 50 % ප්‍රතිශතය යන ප්‍රතිකාරක හතර සංසන්දනය කල අතර මෙහි **T 3** ප්‍රතිකාරකය ඉහලම අස්වැන්නක් ලබා දුන් අතර විකල්ප පෝෂක ප්‍රභවයක් ලෙස අර්ධ වශයෙන් දහනය කරන ලද දහයියා භාවිතා කළහැකි බව තහවුරු විය.

දැල් ගෘහයක් තුළ බුලත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා බඳුන් මිශ්‍රණ සංසන්දනාත්මකව ඇගයීම.

පොල් ලෙළි කැබැලි හා කොහු බත් වෙන් වෙන්ව මිශ්‍ර කරන ලද බඳුන් මිශ්‍රණ සංසන්දනාත්මකව ඇගයීමේ දී එම මිශ්‍රණ විසින් ශාක වර්ධනය වැඩි දියුණු කරන බව හඳුනා ගන්නා ලදි. පොල් ලෙළි කැබැලි අඩංගු බඳුන් මිශ්‍රණය විසින් උපරිම බුලත් රෝපණ දඬු කැබැලි සංඛ්‍යාවක් ලබාදෙන ලද අතර කොහු බත් මිශ්‍රණ බඳුන් මිශ්‍රණය ද ඊට ආසන්න රෝපණ ද්‍රව්‍යය ප්‍රමාණයක් ලබාදෙන ලදි. බඳුන් මිශ්‍රණය හා අහල් දෙකක ප්‍රමාණයේ පොල් ලෙළි කැබැලි අතර මිශ්‍රණ අනුපාතය 1.5:1 වේ.

5.2.10 සාදික්කා

- **ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනනය**

සාදික්කා වල අණුක මෙව විද්‍යාත්මක ලිංග නිර්ණය කිරීම

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මුල් අවධියේදී ශාකයේ ගැහැණු පිරිමි බව තීරණය කිරීමයි. අනාගතයේ සාදික්කා ජාන බැංකුවක් ස්ථාපිත කිරීමට අදහස් කරනු ලැබේ.

- **පැලෑටි සංරක්ෂණය**

සාදික්කා පත්‍ර පතන රෝගය කලමනාකරණය කිරීම.

අලිපේර, අඹ සහ ගස් ලබු ශාක සාදික්කා පත්‍ර පතන රෝගයේ රෝග කාරකයාගේ විකල්ප ධාරකයින් ලෙස ක්‍රියා කරන බවට සොයාගන්නා ලදි. එමෙන්ම අලිපේර නටුව අසල කුණුවීමේ රෝගය අඹ සහ ගස් ලබු ඇන්තැක්නෝස් රෝගයේ රෝග කාරකයන්ටද සාදික්කා බෝගය සඳහා පත්‍ර පතන රෝගය සෑදීමේ හැකියාව ඇති බවත්, රෝගය ඇති කිරීමේ තීව්‍රතාවයේ වෙනසක් නොමැති බවත් සොයාගන්නා ලදි. එබැවින් සාදික්කා බෝගය සමඟ අලිපේර, අඹ සහ ගස්ලබු වගාකර ඇත්නම් එම බෝගයන්හි ක්ෂේත්‍ර සනීපාරක්ෂක ක්‍රියාකාරකම් අනුගමනය කිරීම අතිරේක රෝග පාලන ක්‍රමවේදයක් ලෙස නිර්දේශ කරන ලදී.

- **කායික විද්‍යා හා පැළ නිෂ්පාදනය**

බද්ධ සාදික්කා ක්ෂේත්‍ර අධ්‍යනය

විවිධ ප්‍රදේශ වලින් තෝරාගත් වැඩි අස්වනු සහිත සාදික්කා වරණ 10 මගින් බද්ධ පැළ නිෂ්පාදනය කර එම පැළ ක්ෂේත්‍රයේ අධ්‍යනය කරන ලදි. මේ අතරින් B වරණය (දැල්පිටිය වරණය) ගස්නාව හා මාතලේ යන ප්‍රදේශ දෙකෙහිම (විවිධ කෘෂි දේශගුණික කලාප වල) සාර්ථකව ස්ථාපිත වූ අතර, වැඩිම වර්ධනයක් හා අස්වැන්නක් වාර්ථා කරන ලදි. මෙහි සාමාන්‍ය උස මීටර 6.5 සහ ශාකයේ අතු වල පැතිරීම මීටර 4.2 වන අතර, සාමාන්‍ය අස්වැන්න ගසකට ගෙඩි 235ක් විය.ගෙඩියක අමු බර ගෑම් 8.7 වූ අතර,ගෙඩියක වියලි බර ගෑම් 5.1ක් විය මේ අනුව මෙම B වරණය නව සාදික්කා ප්‍රභේදයක් ලෙස පැළ නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇත.

සාදික්කා වල වායව අතු බැඳීමෙන් ලබා ගන්නා පැළ හා බීජ පැළ පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යනය.

මේ සඳහා විවිධ උස ප්‍රමාණයන්ගෙන් යුතු දිය රිකිළි මෙන්ම හරස් අතු භාවිතා කරන ලද අතර, සාර්ථක වූ පැළ විශාල ප්‍රමාණයේ පෝච්චි වල සිටුවා ඇත. පර්යේෂණ තවදුරටත් ක්‍රියාත්මකවේ.

දේශගුණික විපර්යාස මත බද්ධ සාදික්කා වල මල් පිපීම හා ඵල හටගැනීම උත්තේජනය කිරීම.

මෙම පර්යේෂණය සඳහා බද්ධ සාදික්කා පැළ ක්ෂේත්‍රයේ සිටුවන (අඩි 10 X 10) ලද අතර, හෝමෝන යෙදීම මල් හටගන්නා අවධියේදී සිදුකල යුතුව ඇත.

- **පසු අස්වනු තාක්ෂණය**

වසාවාසි වල ස්වාභාවික වර්ණය පවත්වාගැනීම පිළිබඳ පරීක්ෂණය

වසාවාසි විවිධ ද්‍රාවණවල 70^0C උෂ්ණත්වයේ ගිල්වා උණු වතුර ප්‍රතිකාරකය කර මාස 6 ක් කළු පොලිතින් මලු වල ගබඩා කර තබා පසුව වර්ණ නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව 2.5% සෝඩියම් මෙටා බයිසල්ෆයිඩ් (SMS) ද්‍රාවණයේ මිනිත්තුවක්, 70^0C උෂ්ණත්වයේ ප්‍රතිකාර කර කළු පොලිතින් මලු වල ගබඩා කිරීමෙන් වසාවාසි වල ස්වාභාවික වර්ණක පරීරක්ෂණය කල හැක.

ශ්‍රී ලංකාවේ සාදික්කා ඇට වල රසායනික සංයුතිය හා ප්‍රතිඔක්සිකාරක ගුණ නිර්ණය කිරීම

මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යාස්ථානය,දැල්පිටිය, ගස්නෑව පර්යේෂණ මධ්‍යස්ථානයන්, මාවනැල්ල, පිළිමතලාව, කටුගස්තොට, වත්තේගම, අංකුඹුර, මැණික්හින්න යන ප්‍රදේශ වලින් සාදික්කා ලබා ගන්නා ලදී. සාදික්කා ඇට වල රසායනික සංයුති නිර්ණය කිරීමට තෙතමන ප්‍රතිශත, තෙල් ප්‍රතිශත, ඔලියෝරෙසින් ප්‍රතිශත, අළු ප්‍රතිශත නිර්ණය කිරීම සිදු කරන ලදී. එවිට ඔලියෝරෙසින් ප්‍රතිශතය ලබා ගැනීමට සුදුසුම රසායනික ක්‍රමවේදය සොයා ගැනීමට ක්‍රමවේදයන් 3ක් අනුගමනය කරන ලදී.

සාදික්කා ගෙඩි කැපීමේ උපකරණය

සාදික්කා ගෙඩි පැලීම සාම්ප්‍රදායික වශයෙන් පිහියක් භාවිතයෙන් සිදු කරනු ලබයි. මෙමගින් අතට සිදුවන අනතුරු වාගේම මේ සඳහා වැඩි කාලයක් ගතවීමද ගැටළුවකි. මෙයට පිළියමක් වශයෙන් පිහිය වෙනුවට සුදුසු උපකරණයක් නිර්මාණය සඳහා විවිධ යාන්ත්‍රික ක්‍රම කිහිපයක් පරික්ෂාවට භාජනය කොට ඇත. මෙම ක්‍රම වලින් සුදුසු ක්‍රමයක්, උපකරණයක් නිපදවීමට යොදාගනිමින් ඇත. එමගින් සාදික්කා ගෙඩි පැලීමේ ගැටළු වලට විසඳුමක් වනු ඇත.

5.2.11. **ගොරකා**

- **පැලෑටි සංරක්ෂණය**

ගොරකා කොරපොතු කෘමියා (*Ceroplastes* sp.) ගේ හානිය සඳහා ප්‍රතිරෝධී දර්ශ හඳුනා ගැනීම

විවිධ ගොරකා වර්ග, කොරපොතු කෘමියාට එරෙහිව දක්වන ප්‍රතිරෝධය ඇගයීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී. කොරපොතු කෘමිහානිය වාර්තා වූ ප්‍රදේශ වල නිරීක්ෂණය කරන ලද අවම වශයෙන් හානි වූ ගොරකා පැළ මේ සඳහා යොදා ගන්නා ලදී. විශාල වශයෙන් හානි වී තිබූ ගොරකා ශාක ආසන්නයේ තිබුණද හානිය අවම වූ ශාක නිරීක්ෂණය කරන ලදී. මෙය එකී ශාක වල භෞතික හෝ රසායනික හැඩ ගැසීමක් ලෙස තීරණය කරන ලදී. පළිබෝධයන් සඳහා ප්‍රතිරෝධී ශාක හඳුනාගෙන එම ශාක වලින් ප්‍රචාරණය සඳහා අවශ්‍ය පටක කොටස් ලබා ගන්නා ලදී. එම අනුජයන් ඒ වනවිටත් ස්ථාපනය කර තිබූ ග්‍රාහක සමඟ බද්ධ කරන ලදී. අනතුරුව එම ශාක ගොරකා කොරපොතු කෘමියාගේ හානිය සඳහා පරීක්ෂා කරන ලදී. මේ සඳහා, කෘමි ගහණ වර්ධනය, ශාකවල මෘත්‍යුතාව, ශාකයේ මධ්‍යස්ථ නිරෝගීබව, පිටි පුස් වර්ධණය, කොළ සහ නව අංකුර ඇති වීම, සහ ශාකයේ උස ආදිය පරීක්ෂා කරන ල දී. දත්ත ලබා ගැනීම සිදු කෙරෙමින් පවතින අතර, ප්‍රතිරෝධීබව දක්වන ශාක ක්ෂේත්‍ර ස්ථාපණයට හා අභිජනන කටයුතු සඳහා යොදා ගනු ඇත.

- **පසු අස්වනු තාක්ෂණය**

ගොරකා අගය එකතු කල නිෂ්පාදන සඳහා තාක්ෂණය සංවර්ධනය

වියලා සකස් කරන ලද ඉදුණු ගොරකා පලතුර ශ්‍රී ලංකාව, ඉන්දියව වැනි රටවල් වල වටිනා කුළුබඩුවක් ලෙස භාවිතා වේ. ගොරකා කුඩු, ගොරකා බීම, ගොරකා ජෑම්, ගොරකා චට්නි, ගොරකා වියලා රස කල කුඩු, ගොරකා පේස්ට් යන නිෂ්පාදන අගය එකතු කල නිෂ්පාදන ලෙස නිපදවා ඇත. සංවේදන පරීක්ෂණ හා නව්‍යකරණයන් සම්පුර්ණ කර නිෂ්පාදනයන් ප්‍රදර්ශන හා පුහුණු හරහා වෙළඳපොලටද හඳුන්වා දී ඇත.

- **ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනනය**

රසායනික ගුණ මත පදනම් වූ ගොරකා ප්‍රභේද සමීක්ෂණය හා ක්ෂේත්‍ර ජාන බැංකු පිහිටුවීම.

මෙම පර්යේෂණයේ මූලික අරමුණක් වන්නේ බද්ධ කළ ගොරකා පැළ සහිත ක්ෂේත්‍ර ජාන බැංකු ස්ථාපනය කිරීමයි. ඇතැම් පැල සඳහා බද්ධ කිරීම සිදු කර ඇත. පරිණත ග්‍රාහකයන් භාවිතා කරන විට බද්ධ කිරීමේ සාර්ථකත්ව අනුපාතය අඩුය. 10 x 8 ක පරතරය සහිත ආරක්ෂක පේළි හැර සෙසු ශාක 80 ක් පමණ සඳහා ක්ෂේත්‍රය සූදානම් වෙමින් පවතී.

- **කායික විද්‍යා හා පැළ නිෂ්පාදනය**

ශ්‍රී ලංකාවේ ඇති ගොරකා වරණ එකතු කිරීම හා වර්ධනය, අස්වැන්න හා රසායනික සංයුතිය පිලිබඳ අධ්‍යනය

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 6න් තෝරා ගන්නා ලද වැඩි අස්වනු සහිත ගොරකා වරණ එක්රැස් කර බද්ධ කරන ලද අතර ගොරකා ගෙඩිවල රසායනික සංයුතිය විශ්ලේෂණය කරන ලදි. බද්ධ කල ගොරකා වරණ 18 (පැළ 162) ක්ෂේත්‍රයේ ස්ථාපනය කරන ලද අතර වර්ධනය හා අස්වැන්න පිලිබඳ අධ්‍යනයන් වැඩිදුරටත් ක්‍රියාත්මක වෙයි.

5.2.12 වෙනත්

අපනයන කෘෂි බෝග පිලිබඳ පටක රෝපණ අධ්‍යනය

ගොරකා, වල්ලපට්ටා හා දෙමුහුන් ගම්මිරිස් ප්‍රභේද සඳහා පටක රෝපණ තාක්ෂණය යොදා ගනිමින් පැළ නිෂ්පාදනය කිරීමේ අරමුණින් මෙම පර්යේෂණය ආරම්භ කළ අතර ගම්මිරිස් 40% ක සාර්ථකත්වයක්ද, වල්ලපට්ටා 30% ක සාර්ථකත්වයක්ද පෙන්වයි.

විවිධ කෘෂි රසායන භාවිතය පිලිබඳ ගොවියන්ගේ දැනුවත්භාවය හා ඒවා භාවිතාකරන විවිධ ආකාර - ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඟුරු වගාකරුවන් පිලිබඳ සිද්ධි අධ්‍යයනයක්

රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඟුරු වගා කරන ගොවීන් අතර මෙම සිද්ධි අධ්‍යයනය කිරීමේ අරමුණ වූයේ එම ගොවීන්ගේ කෘෂි රසායණික භාවිතය පිළිබඳව තාක්ෂණික සහ සමාජීය දෘෂ්ටිකෝණයකින් විමසා බැලීමයි. මෙහිදී වගාවට හානි කරන ප්‍රධාන රෝග සහ පලිබෝධකයින්, විවිධ කෘෂි රසායණික ද්‍රව්‍ය භාවිතා කරන ප්‍රමාණය, කෘෂි රසායණික භාවිතයේදී ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම ඇතුළු හැසිරීම් විධි, කෘෂි රසායණික භාවිතය පිළිබඳව දැනුවත් වන ආකාරය සහ තීරණ ගන්නා ආකාරය යන කරුණු සම්බන්ධව විවිධ පරාමිතීන් ඔස්සේ අධ්‍යයනය සිදුකරන ලදී. මෙම අධ්‍යයනය මගින් ලබාගත් ප්‍රතිඵල අනුව රසායණික ද්‍රව්‍ය භාවිතය පිළිබඳව සැළකිල්ලට ලක් කෙරුනු කරුණු සම්බන්ධයෙන් අපේක්ෂිත මට්ටම සහ පවත්නා මට්ටම අතර වෙනස අවධාරණය කෙරුණු අතර මෙම පර්යේෂණයේ දෙවන පියවර ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමසේවා කොට්ඨාශ 60ක, ගම්මිරිස් වගාකරන ගොවි මහතුන් 80ක් සඳහා

ප්‍රශ්න මාලාවක් සහ ක්ෂේත්‍ර අධ්‍යයනයන් තුළින් මෙම තොරතුරු ලබා ගන්නා ලදී. එම දත්ත විශ්ලේෂණය කරමින් පවතී.

පාංශු ජෛව විවිධත්වය පුරෝකථනය කිරීම සඳහා සුදුසු නිර්නායක හඳුනා ගැනීම

පාංශු ජෛව විවිධත්වය හඳුනාගැනීම සඳහා සරල නිර්නායක හඳුනාගැනීම මෙම පරීක්ෂණයේ අරමුණයි. මූලික අධ්‍යන කටයුතු උඩුදුම්බර ප්‍රදේශයේ තෝරා ගන්නා ලද පරිසර පද්ධති වල සිදුකරන ලදි. මෙම ප්‍රතිඵල වලට අනුව කෘෂිකාර්මික මෙවලම් සහ කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතා කරන ඉඩම්වල පාංශු ජෛව විවිධත්වය ස්වභාවික පරිසර පද්ධතිවලට වඩා පහළ බව හඳුනා ගන්නා ලදී. ජෛව විවිධත්වය පුරෝකතනය කිරීම සඳහා නිර්නායක හඳුනාගැනීමේ පරීක්ෂණ කටයුතු මිල්ලනිය ප්‍රදේශයේ තෝරාගත් ගෙවතු වගාවල සිදුකරන ලදී. පසෙහි ලිහිල් බව, පසේ අඩංගු වැලි හා ගල් ප්‍රමාණය සහ කාබනික ද්‍රව්‍ය අඩංගු බව යන කරුණු අධ්‍යනයට ලක් කරන ලදී. කාබනික ද්‍රව්‍ය ඉහළ කලු පැහැති පසක් වීම , අඩු වැලි හා ගල් ප්‍රමාණයක් සහිත බව සහ ලිහිල් පසක් වීම යන ලක්ෂණ ජෛව විවිධත්වය පුරෝකථනය කිරීමේ නිර්නායක ලෙස හඳුනා ගත හැකි බව තහවුරු විය.

කුළුබඩු වල රසායනික, භෞතික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක තත්වයට වාෂ්ප විෂබීජහරනයෙන් ඇතිවන බලපෑම

දැනට ගම්මිරිස් වාෂ්ප විෂබීජහරණය පිළිබඳ පරීක්ෂණය සිදු කර ඇත. මෙහිදී උෂ්ණත්වය සහ විෂබිජහරණය කරන කාලය යන සාධක දෙක සලකා බලනු ලැබේ. විෂබිජහරණය කරන ලද ගම්මිරිස් වල රසායනික, භෞතික හා ක්ෂුද්‍රජීව විශ්ලේෂණය ආරම්භ කර ඇත. මෙම පරික්ෂණය තවදුරටත් ක්‍රියාත්මක වේ.

5.3. දැනට පවත්වාගෙන යනු ලබන පර්යේෂණ - 2018

5.3.1 කුරුඳු

- "පිරිස් කුරුඳු" වල ඉහළ ගුණාත්මක ලක්ෂණ තෝරාගත් කුරුඳු ප්‍රභේදයන් (ශ්‍රී ගැමුණු හා
- ශ්‍රී විජය) සමඟ ඇගයීමට ලක් කිරීම සහ සැසඳීම

- නිර්දේශිත ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමවේද යටතේ තෝරාගත් දෙමුහුම් පැළ ගුණනය කිරීම සහ ඒවායේ ගුණාත්මක බව හා අස්වැන්න ඇගයීම වර්ධනය ,
- වැලිමය වයනය සහිත කුරුඳු පොතු වල රසායනික හා ද්‍රව්‍යමය සංයුතිය හඳුනා ගැනීම

- තවාන් බඳුන් ලෙස කොහුබත් කැට (Coco peat pellets) භාවිතයේදී කුරුඳු (*Cinnamomum zeylanicum* Blume) පැළ වල වර්ධන ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනය
- කුරුඳු ශාකයේ (*Cinnamomum zeylanicum* Blume) නව රිකිළි වර්ධනය සඳහා කඳ නැමීමෙන් ඇතිවිය හැකි බලපෑම
- පොහොර යොදන අවස්ථාව කුරුඳු ශාකයේ වර්ධනයට, අස්වැන්නට සහ පොතු ගැලවීමට බලපාන අයුරු අධ්‍යයනය කිරීම
- කුරුඳු අතු කැබලි වලින් ප්‍රචාරණයේදී පැළැටි හෝමෝන වල (IBA සහ NAA) විවිධ සාන්ද්‍රණ මුල් ඇතිවීම හා වර්ධනයට බලපාන අයුරු අධ්‍යයනය කිරීම.
- කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න සඳහා කුරුඳු කොළ පොහොර සහ අකාබනික පොහොර වල බලපෑම
- ආම්ලික පසේ වගාකර ඇති කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න සඳහා ඩොලමයිට් වල බලපෑම.
- කුරුඳු ශාකයේ වර්ධනය, අස්වැන්න සහ පාංශු පෝෂණය කෙරෙහි ග්ලිරිසීඩියා සහ ආවරණ බෝග යෙදීමේ බලපෑම

- බෝග නිෂ්පාදනයට සාපේක්ෂව කුරුඳු වගා කරන පසේ පෝෂණ තත්ත්ව විශ්ලේෂණය සහ ගුණාංගිකරණය .
- කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න සඳහා සල්ෆර් අඩංගු පොහොර වල බලපෑම .

- කුරුඳු ශාකයේ වර්ධනය සඳහා අවශ්‍ය ප්‍රශස්ත pH අගය සෙවීම
- පසේ මහා පෝෂක සහ ක්ෂුද්‍ර පෝෂක අධික්ෂණය සඳහා කුරුඳු ශාකයේ දෘශ්‍ය ලක්ෂණ හඳුනාගැනීම .
- කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න සඳහා ජෛව පටල කාබනික පොහොර වල Biofilm)) බලපෑම
- රෝපණ ද්‍රව්‍යවල වර්ගය සඳහා විවිධ ප්‍රමාණ වලින් යොදන ලබන පොහොර කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි බලපෑම අධ්‍යනය
- නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් පෝෂක විවිධ මට්ටම් වලින් යෙදීම කුරුඳු ශාකයේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි බලපෑම අධ්‍යයනය කිරීම

- කුරුඳු තවාන් වල රෝග හා පළිබෝධ කළමනාකරණය සඳහා මුහුදු ජලය හා සීමිතව යොදන රසායනික පළිබෝධ නාශක හා දිලීර නාශක මගින් සිදුවන ආවරණය අධ්‍යයනය

- කුරුඳු වගාවේ පොත්ත රළු වීමේ රෝගයෙහි හේතු විද්‍යාව, රෝග ලක්ෂණ විද්‍යාව සහ පටක ව්‍යාදි විද්‍යාව අධ්‍යයනය කිරීම
- කුරුඳු රෝස කඳ පණුවාගේ පරිසර විද්‍යාව (සෘතුමය බහුලත්වය, ව්‍යාප්තිය සහ තීව්‍ර සමූහ සරණ කාල වකවානුව) අධ්‍යයනය කිරීම

- කුරුඳු පැළ මැක්කා හඳුනා ගැනීම සහ පැළ මැක්කාගේ ජීව විද්‍යාව, පරිසර විද්‍යාව සහ කළමනාකරණය අධ්‍යයනය.
- කුරුඳු වගාවේ පෘෂ්ඨ වංශික පළිබෝධකයින් කළමනාකරණය සඳහා අති ධ්වනි උපකරණ පිහිටුවීම හා ඒවායේ භාවිතය ඇගයීම.
- සුදු මුල් රෝගයේ ආසාදනය, එහි ව්‍යාධිජනකතාව සහ රෝගය තීව්‍ර කරන්නාවූ පරිසර විද්‍යාත්මක සාධක අධ්‍යයනය

- කුරුඳු තවාන් වල ජල ආතතිය, පළිබෝධ හා රෝග ඇතිවීම කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීම
- කුරුඳු වගාවේ කඳ පිළිකා තත්ත්වයෙහි ප්‍රගමන රටාව සහ අස්වනු හානිය අධ්‍යයනය කිරීම.

- කුරුඳු වගාවේ කඳ පිළිකා තත්ත්වය හටගන්නා ආකාරය අධ්‍යයනය කිරීම

- රෝග හා පළිබෝධ ප්‍රතිරෝධය සඳහා කුරුඳු ජනකප්ලාස්මය අධ්‍යයනය
- දකුණු පළාත තුල විවිධ කෘෂි පාරිසරික කලාප යටතේ සත්‍ය කුරුඳු වල අස්වනු සහ ගුණාත්මක තත්ත්වයන් අධ්‍යයනය කිරීම
- කුරුඳු කූරු කල් තබා ගත හැකි කාලය කෙරෙහි සල්ෆර් ධූමකරණය සහ ඇසුරුම් ද්‍රව්‍ය වල බලපෑම
- මුඛ හා සමේ රෝග සඳහා කුරුඳු වල පවතින ප්‍රති දිලීර නාශක හා ප්‍රති බැක්ටීරියා නාශක ක්‍රියාකාරීත්වය
- මූලික පිරිසැකසුමෙන් පසු අගය දාමයේ ස්ථර අතර කුරුඳු කූරු වල ගුණාත්මක පරාමිතීන්

- සත්‍ය කුරුඳු හා පැණිරි සගන්ධ තෙල් භාවිතයෙන් ශාකමය මදුරු විකර්ෂක සගන්ධ කූරු නිපදවීම
- කුරුඳු ඔලියොරෙසින භාවිතයෙන් සුප් කැටයක් නිපදවීම
- කුරුඳු ඔලියොරෙසින භාවිතයෙන් අයිස් ක්‍රීම් නිපදවීම

5.3.2. ගම්මිරිස්

- ගම්මිරිස් කහවීමේ ලක්ෂණය කෙරෙහි විවිධ පාංශු තෙතමන තත්ව යටතේ ආර්බස්කියුලර් මයිකොරයිසා (දිලීරක මූල) වල බලපෑම.
- ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි දේශගුණික කලාපවල කළු ගම්මිරිස් සඳහා විවිධ වාරිමාර්ග ක්‍රම ඇගයීම
- මුදුන් රිකිලි,පාවැල් සහ හරස් අතු කැබලි උණ බම්බු ක්‍රමයෙන් ප්‍රචාරණය කිරීමේදී ඒවායේ වර්ධනය ඇගයීම
- ගම්මිරිස් (*Piper nigrum* L.) වල ආධාරක ශාක මාර්ගයෙන් කළු ගම්මිරිස් වගාවේ සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම
- දේශගුණික විපර්යාස අනුවර්තනයක් ලෙස අලුතෙන් හඳුන්වාදුන් ගම්මිරිස් ප්‍රභේද (බූටෑවේරාල, ඩිංගිරාල හා කොහුකුඹුරේරාල) සපුෂ්පක හා පුෂ්පක හැසිරීම් ඒකාබද්ධ කිරීම
- අලුතින් හඳුන්වාදුන් ගම්මිරිස් ප්‍රභේද (ඩිංගිරල) සහ දේශීය (එම්-12) වල මල් සහ කරල් හට ගැනීම අධ්‍යනය කිරීම
- ගම්මිරිස්වල (*Piper nigrum* L.) වියනෙහි වර්ධනය සඳහා විවිධ අතු කැබැලි වර්ග වලින් හටගත් රෝපණ ද්‍රව්‍යයේ බලපෑම
- පුවක් (**Areca catechu) +** ගම්මිරිස් (*Piper nigrum* L.) පද්ධතියේ අස්වැන්න කාර්ය සාධනය මත ක්ෂුද්‍ර ජල සම්පාදනයේ බලපෑම.
- පඳුරු ගම්මිරිස් වල වසර පුරා මල් ඇතිවීම කෙරේ ජල සම්පාදනයේ සහ පොහොරවල බලපෑම අධ්‍යනය කිරීම
- තෝරා ගන්නා ලද ගම්මිරිස් (*Piper nigrum* L.) වගා ප්‍රභේද අතර දෙමුහුම් කිරීම මඟින් පහතරට අතරමැදි කලාපය සඳහා සුදුසු ගම්මිරිස් ප්‍රභේද ඇතිකිරීම.
- ගම්මිරිස් සඳහා සජීවී ආධාරක ද්‍රව්‍යයක් ලෙස පොල් ගස භාවිතා කිරීමේ විභවය සොයා බැලීම
- ගම්මිරිස්වල වියන් වර්ධනය හා අස්වැන්න මත විවිධ කප්පාදු මට්ටම්වල බලපෑම.
- පාංශු තෙතමනය රැකගැනීමේ සහ ශෂ්‍ය විද්‍යාත්මක පියවර භාවිතයෙන් ගම්මිරිස් ඵලදායීතාව ඉහල නැංවීම කාලගුණ විපර්යාසයන්ට අනුගත වීමේ පියවරක් ලෙස අධ්‍යනය කිරීම.

- ගම්මිරිස් සඳහා සජීවී ආධාරක ද්‍රව්‍යයක් ලෙස පොල් ගස භාවිතා කිරීමේ විභවය සොයා බැලීම
- ගම්මිරිස්වල වියන් වර්ධනය හා අස්වැන්න මත විවිධ කප්පාදු මට්ටම්වල බලපෑම.
- වටපණුවන් ආසාදනය වීම හේතුවෙන්, ගම්මිරිස් වගාව සඳහා වැළඳෙන සෙමෙන් මැළවීමේ රෝගය පහසුවෙන් හඳුනාගැනීම සඳහා දර්ශකයන් හඳුනා ගැනීම හා හානිය පාලනය සඳහා භාවිතා කලහැකි විවිධ පාලන ක්‍රම වල කාර්යක්ෂමතාවය ඇගයීම
- ක්ෂෙත්‍රයේ සහ තවාන්වල භාවිතා කිරීම සඳහා වානිජ නිෂ්පාදනයක් ලෙස ට්‍රයිකොඩර්මා දිලීරය භාවිතා කිරීම
- පාංශු ක්ෂද්‍රජීවී ගහණය ඉහළ මට්ටමක පවත්වා ගැනීම මගින් ගම්මිරිස් වගාවේ ක්ෂණික මැලවීමේ රෝගය පාලනය කිරීමේ හැකියාව විමසා බැලීම
- ගම්මිරිස් නව ප්‍රභේද සඳහා කෘමි හානි ඇගයීම
- විවිධ කාළගුණික තත්ත්ව හා සෙවණ යටතේ බහුලව වගා කෙරෙන ගම්මිරිස් (***Piper nigrum*** **L.)** දර්ශ තුනක කෘමි හා පළිබෝධ තත්ත්ව ඇති වීම
- ශ්‍රී ලංකාවේ ගම්මිරිස් සඳහා භූගෝලීය දර්ශකය ප්‍රතිස්ථාපනය කිරීම
- දේශීය ගම්මිරිස් වරණයන් දේශීය වශයෙන් ඇගයීම,එකතු කිරීම, චරිතකරනය, සංරක්ෂණය කිරීම සහ පරිහරණය කිරීම
- අලුතින් නිර්දේශ කරන ලද ගම්මිරිස් දෙමුහුම් සහිතව මව් උද්‍යාන පිහිටුවීම
- වියලි කළු ගම්මිරිස්වලින් පයිපරින් සංඝටකය වෙන්කර ගැනීමට ක්‍රමවේදයක් නිර්ණය කිරීම
- ශ්‍රී ලංකාවේ ගම්මිරිස්වල රසායනික සංයුතියේ වෙනස්කම් අධ්‍යයනය කිරීම
- ගම්මිරිස් සඳහා හරිතාගාර වියලන සැළසුම් කිරීම, සකස් කිරීම හා ඇගැයීම
- ගම්මිරිස් මුදුන් රිකිළි, හරස් අතු සහ ධාවක දඬු යොදා ගනිමින් සාදාගත් පැළ වල වර්ධනය හා අස්වැන්න පිළිබඳ ක්ෂේත්‍ර සැසඳීම.
- පටකරෝපිත ගම්මිරිස් පැළ හා දඬු මඟින් නිෂ්පාදිත ගම්මිරිස් පැළ ක්ෂේත්‍රයේ වර්ධනය හා අස්වැන්න සැසඳීම.
- මල් පිපීම උත්තේජනය කිරීම සඳහා ශාක වර්ධක හෝමෝන භාවිතය
- ගම්මිරිස් බෝගයේ වර්ධනය පාංශු ලක්ෂණ හා අස්වැන්න කෙරෙහි ආවරණ බෝග වල බලපෑම
- ගම්මිරිස් සඳහා භූමියේ යෝග්‍යතාවය වර්ගීකරණය කිරීම.
- තිරසාර වගාවක් සඳහා අස්වැන්න නෙලා ගැනීමෙන් පසු ඉවතලන ගම්මිරිස් (***Piper nigrum*** **L)** නටු පරිසර හිතකාමී ලෙස ප්‍රතිචක්‍රීකරණය කිරීම මගින් කොම්පෝස්ට් සෑදීම.

- වියළි කලාපයේ වගාකරන ලද "ඩිංගිරාල" ගම්මිරිස් ප්‍රභේදය අකාබණික පොහොර සඳහා දක්වන ප්‍රතිචාර හා ලෙඩ රෝග වලට දක්වන ප්‍රතිරෝධය අධ්‍යනය කිරීම.

5.3.3. කොකෝවා

- කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල් වගාව යටතේ කොකෝවා (***Theobroma cacao*** **L.**) ඵලදායිතාව වැඩිදියුණු කිරීම පිළිබඳ අධ්‍යනය.
- ක්ෂුද්‍ර ජල සම්පාදනය යටතේ කොකෝවා (***Theobroma cacao.*** **L**) වර්ධනය සහ අස්වැන්න කාර්ය සාධනය අධ්‍යනය කිරීම
- අපනයන කෘෂි බෝග සඳහා ගෙවතු වගා ආකෘතියක් සැකසීම
- පහතරට අන්තර්මධ්‍ය කලාපයේ පොල් සමඟ අතුරු බෝග වගාව සඳහා තෝරාගත් කොකෝවා (***Theobroma cacao*** **L**) දර්ශ ඇගයීම.
- විවිධ දේශගුණික කලාප සඳහා විවිධ කොකෝවා වරණ ඇගයීම (මාතලේ, බඩල්කුඹුර)
- පවත්නා කොකෝවා (***Theobroma cacao*** **L.**) ලක්ෂණ තීරණය කිරීම සහ ක්ලෝනීය උද්‍යානයක් පිහිටුවීම
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සමග සමෝදානික ශාක පෝෂක කළමනාකරණය මගින් කොකෝවා වගාවක ඵලදායීතාවය ඉහල නැංවීම
- කොකෝවා වගාවක පාංශු තත්ව ඉහලනැංවීමට දිරාපත් කොකෝවා ලෙලිවලට හිතකර ජෛව සංඝටක එකතුකර පාංශු සකසනයක් ගොඩනැංවීම
- මුල් ඇද්දවූ කොකෝවා අතු සිටුවා ලබාගත් පැළවල ක්ෂේත්‍ර අධ්‍යනය මාතලේ දී සිදුකිරීම

5.3.4. කෝපි

- පහතරට අන්තර්මධ්‍ය කලාපයේ පොල් ආශ්‍රිත තෝරාගත් කෝපි වගාවන් (***Coffia*** **sp.**) හි ක්‍රියාකාරීත්වය ඇගයීම.
- විද්‍යාගාර තුල කොකෝවා ප්‍රචාරණය අත්හදා බැලීම
- නිර්දේශිත බඳුන් කෝපි සඳහා ආදේශකයක් ලෙස කොකෝපීට් ඇගයීම.
- කෝපි බදරි ගුල්ලා පාලනය සඳහා ***Beauveria brassiana*** දිලිරය භාවිතා කිරීම.
- කෝපි බදරි ගුල්ලා පාලනය සඳහා ජෛවීය කාරකයන් විමර්ශනය කිරීම
- කෝපි බදරි ගුල්ලා පාලනය සඳහා උගුලක් නිර්මාණය කිරීම

- ශ්‍රී ලංකාවේ කෝපි සඳහා භූගෝලීය දර්ශකය ප්‍රතිස්ථාපනය කිරීම
- කටිමෝර් කෝපි වගාවන් ඇගයීම
- ලක් පැරකුම් කෝපි වගාව සඳහා බීජ උද්‍යාන පිහිටුවීම
- ඇරබිකා කෝපි (***Coffea arabica***), ගුණාත්මකභාවය සහ ප්‍රධාන පලිබෝධ හා රෝග වලට ප්‍රතිරෝධය දැක්වීම ඇගයීම
- පහතරට අතරමැදි කලාපයේ, පොල් වගාව තුළ, තෝරාගත් කෝපි (*Coffia* sp.) වගා ප්‍රභේද ඇගයීම.
- මාතලේ පවත්නා ස්වාභාවික සෙවන තත්ව යටතේ ඇරබිකා කෝපි වර්ධනය හා අස්වැන්න මත ශාක පුහුණු කිරීමේ ක්‍රමයෙහි බලපෑම
- ඇරබිකා කෝපි කාබනික වගාව සඳහා ක්‍රමවේදයන් සොයාබැලීම
- කුඩා පරිමාණ කෝපි බදින උපකරණය වැඩිදියුණු කිරීම

5.3.5. එනසාල් (කරඳමුංගු)

- එනසාල් පැල මැක්කාගේ හානිය සඳහා විවිධ ප්‍රභේද ඇගයීම
- මහෝගනී (කිරිඇල්ල) යටතේ පහළ උන්නතාංශය සඳහා කරඳමුංගු වරණ ඇගයීම
- කරඳමුංගු වරණ ඇඟිලි සලකුණු කිරීම
- ජලසම්පාදනය යටතේ අඩු උන්නතාංශයේ කරඳමුංගු ප්‍රභේද පිළිබඳ ක්ෂේත්‍ර අධීක්ෂණය

5.3.6. කරාඹු

- ශාක වර්ධක හෝර්මෝන භාවිතයෙන් කරාඹු මල් හටගැනීම උත්තේජනය කිරීම
- මාතලේ ප්‍රදේශයේ වගාකරනු ලබන කරාඹු බෝගයන්හි කරාඹු මල්, කරාඹු නටු සහ කොළ වල අඩංගු අත්‍යවශ්‍ය තෙල්, රසායනික සංයුතිය, ඛනිජ හා ඛනිජ සංයුතිය, (***Syzygium aromaticum*** **L.**, ***Eugenia caryophyllata*** **thunb)** පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණ

5.3.7 සාදික්කා

- වසාවාසි වල ස්වාභාවික වර්ණක පරීක්ෂණය
- ශ්‍රී ලංකාවේ සාදික්කා ඇට වල රසායනික සංයුතිය හා ප්‍රතිඔක්සිකාරක ගුණ නිර්ණය කිරීම
- සාදික්කා ගෙඩි කැපීමේ උපකරණය නිපද වීම
- සාදික්කා වල වායව අතු බැඳීමෙන් ලබා ගන්නා පැළ හා බීජ පැළ පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යනය.
- දේශගුණික විපර්යාස මත බද්ධ සාදික්කා වල මල් පිපීම හා ඵල හටගැනීම උත්තේජනය කිරීම.

- අනුක ජෛව විද්‍යාව උපයෝගී කරගැනීමෙන් සාදික්කා ගැහැණු හා පිරිමි ගස්වල වෙනස කලින් හඳුනාගැනීම.
- සාදික්කා මල් හටගැනීම, ඵල හටගැනීම හා කාළගුණික වෙනස්වීම් වලට අනුකූලව සම්මුහුර්තනය කිරීම

5.3.8. ගොරකා

- ගොරකා අගය එකතු කල නිෂ්පාදන සඳහා තාක්ෂණය සංවර්ධනය
- ශ්‍රී ලංකාවේ ඇති ගොරකා වරණ එකතු කිරීම හා වර්ධනය, අස්වැන්න හා රසායනික සංයුතිය පිළිබඳ අධ්‍යනය
- ගොරකා කොරපොතු කෘමියා (***Ceroplastes* sp.**) ගේ හානිය සඳහා ප්‍රතිරෝධී ගොරකා දර්ශ හඳුනා ගැනීම
- ගොරකා ආබද්ධයන් ගේ රසායනික සංයුතිය පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම හා ක්ෂේත්‍ර ජාන බැංකුවක් ස්ථාපනය කිරීම.

5.3.9. බුලත්

- ශ්‍රී ලංකාවේ බුලත් (*Piper betle*) ජානප්ලාස්ම එකතු කිරීම, ක්ෂේත්‍ර සංස්ථාපනය කිරීම, ඇගයීම හා සංරක්ෂණය කිරීම.
- අපනයන ගුණාත්මයේ බුලත් නිෂ්පාදනය සඳහා ප්‍රශස්ත සෙවන මට්ටම් පිළිබඳ අධ්‍යනය.
- බුලත් වගාවේ වර්ධනය සහ අස්වැන්න සඳහා විකල්ප පෝෂක ප්‍රභවයක් ලෙස අර්ධ වශයෙන් දහනය කරන ලද දහයියා භාවිතයේ බලපෑම අධ්‍යයනය කිරීම.

- බුලත් භාවිතයෙන් අගය එකතු කළ නිෂ්පාදන නිපදවීම
- බුලත් වගාවන්හි පාංශු සාරවත් බව පිළිබිඹු කිරීම.
- බුලත් වගාවේ පොහොර භාවිතය පිළිබඳව සිදු කරනු ලබන අධ්‍යයනය
- පාරම්පරික ක්‍රම මගින් බුලත් වගාවේ බැක්ටීරියා කොළ පුල්ලි රෝගය පාලනය කිරීම සඳහා අධ්‍යනය කිරීම·
- බුලත් වගාවේ පලිබෝධ සහ ඒ සඳහා සුදුසු මර්ධන ක්‍රම හඳුනාගැනීම මගින් අපනයනය සඳහා නිෂ්පාදිත බුලත්වල ගුණාත්මය ආරක්ෂා කිරීම·
- බුලත් වගාවේ තනි කණු ක්‍රමය සඳහා දෙපාර්තමේන්තු නිර්දේශිත පොහොර මිශ්‍රනය භාවිතය පිළිබඳ අධ්‍යනය කිරීම
    - දැල් ගෘහයක් තුළ බුලත් රෝපණ දඬු නිෂ්පාදනය කිරීම සඳහා විවිධ රෝපණ ක්‍රම ඇගයීම.

- බුලත් රෝපණ දඩු නිෂ්පාදනය කිරීම සඳහා විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු පොල් ලෙලි කැබලි හා කොහු බත් වෙන වෙනම අඩංගු බඳුන් මිශ්‍රණ සංසන්දනාත්මකව ඇගයීම.
- බුලත් වර්ධනය, අස්වැන්න හා ගුණාත්මය කෙරේ සම්ප්‍රදායික සුළං-මුවාවේ බලපෑම අධ්‍යනය.
- බැක්ටීරියා කොළ පුල්ලි රෝගයේ නව ප්‍රවණතා සහ හේතුකාරකයන් පිළිබඳව අධ්‍යනය කිරීම.
- බැක්ටීරියා කොළ පුල්ලි රෝගයේ සහ බුලත් වගාවේ අනෙකුත් රෝගයන්ගේ ව්‍යාප්තිය අධ්‍යනය කිරීම සහ සිතියම් ගත කිරීම.

5.3.10. ඉඟුරු

- පොල් වගාව යටතේ ඉඟුරු (***Zingiber officinale***) ජානප්ලාස්ම ඇගයීම.
- ඉඟුරු වල වර්ධනය සහ අස්වැන්න මත විවිධ බීජ ඉඟුරු වල වයස් වල බලපෑම (***Zingiber officinale* Roscoe).**
- පොලිසැක් මලුවල ඉඟුරු වගා කිරීම සහ එමගින් ඉඟුරු රයිසෝමයේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ඇතිවන බලපෑම
- *ඉඟුරු* (***Zingiber officinale***) *වගාවේ වර්ධනය ගුණාත්මය හා අස්වැන්න කෙරෙහි විවිධ සෙවන ප්‍රමාණයන්ගේ බලපෑම අධ්‍යනය කිරීම*
- පොලිසැක් බෑග තුල විවිධ බර ප්‍රමාණ වලින් යුතු රෙසෝම කැබලි සිටුවීම හා අසවැන්න පිළිබඳ සොයා බැලීම

5.3.11 කහ

- ශ්‍රී ලංකාවේ කහ වල රසායනික සංඝටක සහ ප්‍රතිඔක්සිකාරක ගුණ නිර්ණය කිරීම
- ශ්‍රී ලංකාවේ වෙළඳපොලේ පවතින කහ කුඩුවල රසායනික හා භෞතික ගුණ විශ්ලේෂණය
- කහ *(Curcuma longa L.)* වගාවේ වර්ධනය ගුණාත්මය හා අස්වැන්න කෙරෙහි විවිධ සෙවන ප්‍රමාණයන්ගේ බලපෑම අධ්‍යයනය කිරීම
- කහ *(Curcuma longa L.)* **වගාවේ වර්ධනය හා අස්වැන්න කෙරෙහි විවිධ ජල සම්පාදන ප්‍රමාණයන්ගෙන් ජල සම්පාදනය කිරීමේ බලපෑම අධ්‍යයනය කිරීම**
- කහ ජානප්ලාස්ම එක්රැස් කිරීම, ක්ෂේත්‍ර සංස්ථාපනය සහ පොල් වගාව යටතේ ඇගයීම.

5.3.12 වැනිලා

- ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාත තුල වැනිලා වගාව පුළුල්කිරීම සඳහා ඇති හැකියාව හඳුනාගැනීම

5.3.13 වෙනත්

- අපනයන කෘෂි බෝග පිළිබඳ පටක රෝපණ අධ්‍යනය (ගොරකා, වල්ලපට්ටා සහ දෙමුහුන් ගම්මිරිස්)
- අන්නාසි ක්ෂුද්‍ර ප්‍රචාරණය
- රෙසෝම භාවිතයෙන් අන්නාසි වර්ධක ප්‍රචාරණය
- අන්නාසි ගෙඩියේ කිරුළ භාවිතයෙන් වර්ධක ප්‍රචාරණය
- පාංශු ජෛව විවිධත්වය පුරෝකථනය කිරීම සඳහා සුදුසු නිර්නායක හඳුනා ගැනීම
- අපනයන කෘෂිකර්ම භෝග වගාකරන ගොවි මහතුන්ගේ පළිබෝධනාශක භාවිතය සහ ඒ පිළිබඳ දැනුවත්භාවය තාක්ෂණික හා ආර්ථිකමය අධ්‍යයනයක්.
- අපනයන කෘෂිබෝග සඳහා මාතලේ දිස්ත්‍රික්කය තුල කෙරෙන ගෙවතු වගා ආදර්ශනය
- අපනයන කෘෂි බෝගවල ඵලදායීතාවය සඳහා ආන්තික කාලගුණයේ බලපෑම
- අස්වැන්න වැඩි දේශීය ගම්මිරිස්, බද්ධ සාදික්කා සහ බද්ධ ගොරකා පැළ නිෂ්පාදනය

5.4 පර්යේෂණ අංශයේ අනෙකුත් කාර්යයන් වල වර්ධනය

5.4.1. ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ සංවර්ධන කාර්යයන්

- ශෂ්‍යවිද්‍යා අංශයේ උඩුමහලේ අධ්‍යක්ෂතුමාගේ කාර්යාල සහ කාර්යාල කටයුතු සඳහා ඉදිකිරීම නිම කිරීම
- UV දෘශ්‍ය වර්ණාවලීක්ෂය මිලදී ගැනීම.

5.4.2 අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ සංවර්ධන කාර්යයන්

2018 වර්ෂයේ නාරම්මල අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්

- ප්‍රධාන මාර්ගයට යාබද වැට ඉවත්කර නව වැටක් ස්ථාපනය කිරීම. (වියදම රු. 190,000.00)

- අඩි 12ක් පළල බිම් තීරුවක් අපනයන කෘෂි බෝග යොදා භූමි අලංකරණය සිදුකරන ලදී. (වියදම රු. 53,000.00)
- ප%ධාන පර්යේෂණාගාරයට පිටුපසින් ගොවිපල කාර්යාලයට සහ නව පර්යේෂණාගාර සඳහා ගොඩනැගිල්ලක් ඉදිකරන ලදී. (වියදම රු.7,000,000.00)
- අඩි 10ක් ගැඹුරු සහ අඩි 5ක විශ්කම්භයෙන් යුතු පල්දෝරු ටැංකියක් ස්ථාපනය කරන ලදී. (වියදම රු. 43,000.00)
- පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා නව ගේට්ටුවක් ස්ථාපනය කරන ලදී.
- බුලත් වගාවක් කිරීම සඳහා බිම් සැකසීම කරන ලදී. (වියදම රු.37,000.00)
- අධ්‍යක්ෂ (පර්යේෂණ) කාර්යාලය වෙන් කිරීම සිදුකරන ලදී.
- පොල් නැවත වගා කිරීම සඳහා අක්කර 5ක භූමියක අඩි 3X අඩි 3X අඩි 3 වලවල් 320ක් කප්පවන ලදී. (වියදම රු.64,000.00)
- ගම්මිරිස් සහ බුලත් මව් ශාක උද්‍යානයක් ඇති කිරීම සඳහා බිම් සැකසීම කරන ලදී.

5.4.3 **මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු.**

- ජාතික කුළුබඩු අරණෙහි තොරතුරු මධ්‍යස්ථානය පිහිටුවීම.
- කාර්යමණ්ඩල නිල නිවාස සඳහා පවතින මාර්ගය සංවර්ධනය කිරීම.
- නව රසායනාගාර පරිශ්‍රයේ නව වැසිකිළි සංකීර්ණයක් ස්ථාපිත කිරීම.
- පර්යේෂණ මධ්‍යස්ථාන පරිශ්‍රය වටා අඩි **3000** පමණ වැටක් ඉදිකිරීම සහ වැටවල් තවදුරටත් දිගු කිරීම සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම.
- කාර්යාල කටයුතු පහසු කිරීම සඳහා ලේඛනාගාරයක් පිහිටුවීම.
- ගම්මිරිස් ක්ෂණික මැළවීමේ රෝගය, පත්‍ර කුඩා වීමේ රෝගය, සෙමින් මැළවීමේ රෝගය සහ කරාඹු කොළ අංගමාරය යන රෝග පාලනය සඳහා පත්‍රිකා පිළියෙල කිරීම.
- ගම්මිරිස් ප්‍රවේණි ආදර්ශනය සඳහා ක්ෂේත්‍ර ස්ථාපනය කිරීම.
- පාංශු තාක්ෂණවේදී උද්‍යානය සඳහා ගල් පාලම් ඉදිකිරීම.
- නව රසායනාගාරය සඳහා නව වැසිකිලි පද්ධතියක් තැනීම.
- රසායනික ද්‍රව්‍ය සහ උපකරණ මිලදී ගැනීම - **pH** මීටරය, මන්සන් වර්ණ සටහන ආදිය.
- **BT / 01** හා **BT / 02** කාර්යමණ්ඩල නිල නිවාස සඳහා මාර්ග ඉදිකිරීම.

5.4.4 වල්පිට පටක රෝපණ පර්යේෂණ **මධ්‍යස්ථානය තුල සංවර්ධන ක්‍රියාවලිය**

- කාර්යාලීය ප්‍රතිසංස්කරණය කිරීම.
- පර්යේෂණ **මධ්‍යස්ථානය** තුල වාහන අලුත්වැඩියාව.
- අඩි 18 * 60 ප්‍රමාණයේ නව දැල් මඩු දෙකක් සැදීම.
- තවාන් කාර්යාලයේ බිම ටයිල් කිරීම.

5.4.5 කුණ්ඩසාලේ උප පර්යේෂණ මධ්‍යස්ථානය තුල පහත සඳහන් සංවර්ධන කටයුතු 2018 වර්ෂයේදී සිදුකරන ලදී.

- පර්යේෂණාගාරය වැඩි දියුණු කිරීම, කාර්යාලය හා මුර කාමරය ටයිල් කිරීම
- පැළ ගෘහ දෙකක් ඉදිකර අවසන් කරන ලදි
- වියලන කමතක් ඉදිකර අවසන් කරන ලදි
- නව පැළ ගෘහ දෙකක් ඉදිකරීමට බිම් සැකසීම සිදුකරන ලදි

5.4.5.1 **ජාතික ප්‍රදර්ශණ හා වැඩමුළු**

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව, දිස්ත්‍රික් මට්ටමින් සහ ජාතික මට්ටමින් පැවැත්වූ සියලුම ප්‍රදර්ශණ සඳහා, පසු අස්වණු තාක්ෂණික අංශය ප්‍රධාන දායකත්වයක් සැපයීය. උදා. Profood propack ප්‍රදර්ශණය, INCO- BMICH, කොළඹ.

5.4.5.2 **මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේ අනෙකුත් කටයුතු**

1. ඖෂධීය හෝ ආහාර බෝග ලෙස වැදගත් වන බෝග වර්ග 34 ක් සඳහා ශෂ්‍ය විද්‍යාත්මක දත්ත, ඒවායේ භාවිතයන් සහ අනාගත සංවර්ධනය සඳහා ශක්‍යතා පිළිබඳ විස්තර අඩංගු පොත (ඉංග්‍රීසි මාධ්‍යය) මුද්‍රණය කිරීම.

2. 2018 ඔක්තෝබර් මස **18** වන දින අපනයන කෘෂි භෝග පිළිබඳ වාර්ෂික සමුළුව ගන්නොරුව පැලෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේදී "තිරසාර බෝග වගාව මගින් ගුණාත්මක නිෂ්පාදනයක්" තේමාව යටතේ සාර්ථකව පවත්වන ලදී. එහිදී මහාචාර්ය බුද්ධි මාරඹේ මහතා විසින් සංස්කරණය කරන ලද පාංශු සහ ශාක පෝෂණ, කෘෂි විද්‍යාව හා ශාක විද්‍යාව, පශ්චාත් අස්වනු තාක්ෂණය, ආර්ථික විද්‍යාව සහ පැලෑටි සංරක්ෂණ යන අංශයන් වශයෙන් ප්‍රධාන විෂය කරුණු හතරක් යටතේ සියලු සොයා ගැනීම් අඩංගු පර්යේෂණ පත්‍රිකා **22**ක් ඉදිරිපත් කරන ලදී.

3. සේවා පුහුණු මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් වල සම්පත් දායකයින් ලෙස සහභාගී වූ අතර, අගය එකතු කිරීම කිරීමේ නිෂ්පාදන සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් කිහිපයක්ම පසු අස්වනු තාක්ෂණ අංශයේ සහභාගිත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.

4. පුහුණු වැඩ සටහන් පැවැත්වීම: අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් සඳහා, විශ්වවිද්‍යාල සිසුන් (වයඹ විශ්වවිද්‍යාලය, ඌවවෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය) විදාතා පුහුණු මධ්‍යස්ථාන මගින් සම්බන්ධීකරණය කරන ගොවි කණ්ඩායම් හා අනෙකුත් ගොවීන් සඳහා, වෙනත් සිසුන් සඳහා (පාසැල්, ගොවිපලවල්, ආදිය).

5. විශ්වවිද්‍යාල සිසුන්ගේ අවසාන අධ්‍යන ව්‍යාපෘති සඳහා බාහිර අධීක්ෂක වශයෙන් අධීක්ෂණය හා උපදෙස් ලබා දීම.

6. නාරාහේන්පිට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි සමාලෝචන කමිටු සාමාජිකයෙකු ලෙස සමාලෝචන රැස්වීම සඳහා සහභාගී විම.

7. ගොවීන්ගෙන් ලබාගත් පාංශු සාම්පල විශ්ලේෂණය කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

8. විශ්වවිද්‍යාලය, වෙනත් ආයතන හා පාසල්වල සිසුන් සඳහා ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය පිළිබඳ සහ අනෙකුත් ප්‍රයෝගික පුහුණු සැසි පැවැත්වීම.

9. බෝග සායන සහ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා සහභාගි විම.

10. පැළ නිෂ්පාදන වැඩසටහන:

2018 වසරේ දී ගම්මිරිස් පැල **5500** ක් පමණ නිෂ්පාදනය කළ අතර ගම්මිරිස් පැල **4000** ක් සහ ගම්මිරිස් අතු කැබලි **2500** ක් පර්යේෂණ කටයුතු සඳහා, මාතලේ සහකාර අධ්‍යක්ෂක කාර්යාලය, කුණ්ඩසාල උප පර්යේෂණ මධ්‍යස්ථානය, මොනරාගල ප්‍රදර්ශණය, **ASEAC 2018** ප්‍රදර්ශණය සහ පිටත ගොවීන් සඳහා නිකුත් කරන ලදී. අනාගත ශාක නිෂ්පාදන ක්‍රියාවලිය හා පර්යේෂණ කටයුතු සඳහා ඉතිරි පැල යොදා ගැනේ. පර්යේෂණ කාර්යයන් සඳහා විවිධ දිස්ත්‍රික්ක වලින් එකතු කරන ලද ශාක කොටස් උපයෝගී කර ගනිමින් ගොරකා පැළ **595** ක් පමණ බද්ධ කර ඇත.

5.4.6. උපදේශන සේවා

පර්යේෂණ සේවක මඩුල්ල විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්

ගොවීන්/ ශිෂ්‍යයන්/ නිලධාරීන් සඳහා තිහගොඩ කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්.

කාල රාමුව	පුහුණු වැඩසටහන් ගණන	සහභාගී වුවන් ගණන
දින 05	16	213
දින 02	03	93
දින 01	03	190
දින ½	02	48
එකතුව	**24**	**544**

අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය විසින් 2018 වර්ෂය තුළ දැණුම හා තාක්ෂණ පුහුණුව ලබාදුන් වැඩසටහන්

අපනයන කෘෂි බෝග සම්බන්ධව ලබාදුන් පුහුණු වැඩසටහන්	15
සහභාගීවූවන්ගේ සංඛ්‍යාව (ගොවීන්, වවන්නන්)	372
දුරකථනය හරහා උපදෙස් ලබාගත් සංඛ්‍යාව	118
අතුරුවගා පර්යේෂණ මධ්‍යස්ථානය වෙත පැමිණ උපදෙස් ලැබූවන්	103

වල්පිට පටක රෝපණ මධ්‍යස්ථානය විසින් 2018 වර්ෂය තුළ ලබාදුන් දැනුම හා තාක්ෂණ පුහුණු වැඩසටහන්

ලබාදුන් පුහුණු වැඩසටහන් ගණන	05
සහභාගී වූවන් (ගොවීන්, වවන්නන් හා සිසුන්)	178
දුරකථනය හරහා තොරතුරු ලබාගන්නා ලද පිරිස	500
පර්යේෂණ මධ්‍යස්ථානය වෙත පැමිණ උපදෙස් ලැබූවන්	750

මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේ ගොවීන් / සිසුන් / නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්

කණ්ඩායම්	**කණ්ඩායම් සංඛ්‍යාව**	**සහභාගී වූ මුළු සංඛ්‍යාව**
ගොවි කණ්ඩායම්	08	348
සරසවි සිසුන්	14	473
කාර්මික විද්‍යාලවල සිසුන්	13	423
පාසල් වලින් සිසුන්	11	1362
වෙනත් නිලධාරීන්	02	32
එකතුව	**48**	**2638**

කාර්මික පුහුණු කිරීම් (මාස **2** කට වඩා) මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේදී පවත්වන ලද උපාධි අපේක්ෂක පර්යේෂණ ව්‍යාපෘති

අංශය	උපාධි අපේක්ශක පර්යේෂණ	**In-plant training**	කාර්මික පුහුණුව
පස හා ශාක පෝෂණ අංශය	**01**		
කායික විද්‍යාව හා ශාක නිෂ්පාදන අංශය	**01**		
පසු අස්වනු තාක්ෂණ අංශය	**05**		
සියලු අංශ	**06**	**02**	
එකතුව	**07**	**06**	02

රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන්

1. ගුවන් විදුලි වැඩසටහන් **2** ක් සහ "සැහවුනු කහවනු" රූපවාහිනී වැඩසටහන් **2** ක් පටිගත කර ඇත

2. පොලි බෑග් භාවිතා කරමින් ඉහුරු වගාව සඳහා තාක්ෂණය හුවමාරු කිරීම ගුවන් විදුලි වැඩසටහන් **06** ක් සහ එක් රූපවාහිනී වැඩසටහනක් සහ **IPNM** මත සිදු කරන ලදි.

2018 වසර තුලදී නාරම්මල අතුරුවගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ නිලධාරීන් සහභාගිවූ දේශීය / විදේශීය පුහුණු වැඩසටහන් හා වැඩමුළු

01. එස්.අයි.සී.සිල්වා (සහකාර අධ්‍යක්ෂ / පර්යේෂණ) විද්‍යාත්මක ලේඛන ක්‍රමය පිලිබඳ වැඩසටහනකට සහභාගිවන ලදී. පවත්වන ලද්දේ 2018 මාර්තු 19,20 සහ 21 යන දිනයන්හිදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉබ්බාගමුව බතලේගොඩ පිහිටි වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදීය. සංවිධානය කරන ලද්දේ කොළඹ 07, ශ්‍රී ලංකා කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාව විසිනි.

02. එස්.අයි.සී.සිල්වා (සහකාර අධ්‍යක්ෂ / පර්යේෂණ), ඩී.එම්.වී.පී.දිසානායක (සහකාර අධ්‍යක්ෂ / පර්යේෂණ), ආර්.ඒ.ඩී.ඒ.ආර්.ඒ.රණසිංහ (සහකාර අධ්‍යක්ෂ / පර්යේෂණ), ඩබ්.එම්. චන්ද්‍රරත්න (පර්යේෂණ හා සංවර්ධන සහකාර), කේ.ජී.පී.ශාන්ත (පර්යේෂණ හා සංවර්ධන සහකාර), එම්.ඩී.එස්.ධර්මරත්න (සංවර්ධන නිලධාරි) කාලගුණ විපර්යාස වලට අනුගත වීම යන මාතෘකාව යටතේ වැඩමුළුවකට සහභාගිවිය. 2018 05.26 සහ 2018.05.31 යන දිනයන් වලදී මාතලේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සේවා සංස්කරණ පුහුණු ආයතනයේදී මෙය පවත්වන ලදී. අනුග්‍රහය දක්වන ලද්දේ බත්තරමුල්ලේ පිහිටි ලංකා ජලනි ආයතනයයි.

5.4.7. පලිබෝධ හා රෝග පාලනය

පැලෑටි සංරක්ෂණ සේවය

1. ගොවීන්ගේ ඉල්ලීම මත ගොවි පුහුණුව පංති **05** ක්, ක්ෂේත්‍ර දින **03** ක් සහ ක්ෂේත්‍ර චාරිකා **07** ක් පවත්වන ලද අතර ඔවුන්ගේ පැලෑටි සංරක්ෂණ ගැටළු සඳහා සුදුසු විසඳුම් ලබා දී ඇත

2. දිස්ත්‍රික්ක **09** ක ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් සංවිධානය කරන ලද බෝග සායන **09** (රත්නපුර, කෑගල්ල, බදුල්ල, මොනරාගල, ගම්පහ, කොළඹ, පොළොන්නරුව, මහනුවර) දී පළිබෝධ රෝග ගැටළු සඳහා පාර්ශවකරුවන්ට සුදුසු විසඳුම් ලබා දී ඇති අතර කෘෂි අපනයන භෝග වල මූලික පළිබෝධ හා රෝග කළමණාකරණ උපාය මාර්ග පිළිබඳ දේශන පවත්වන ලදී.

3. මොණරාගල, බණ්ඩාරවෙල ශාඛා ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශය සහ මොණරාගල වැල්ලවාය යන ස්ථානවල ගම්මිරිස් ඉක්මණින් මැළවීමේ රෝගය කළමනාකරණය කිරීම සඳහා තාක්ෂණික උපදේශන සේවා සහ නිර්දේශිත දිලීර නාශක 834,000.00 ලබා දෙන ලදී.

4. ගුවන්විදුලි වැඩසටහන් දෙක සඳහා සම්පත් දායකයෙකු ලෙස සහභාගී වීම (රසමංජරී - **ITN** එෆ්එම්) ගම්මිරිස් ඉක්මන් සහ සෙමින් මැළවීමේ රෝග සඳහා.

5. ගම්මිරිස් ක්ෂණික මැළවීමේ රෝගය, පත්‍ර කුඩා වීමේ රෝගය, සෙමින් මැළවීමේ රෝගය සහ කරාබු කොළ අංගමාරය යන රෝග පාලනය සඳහා පත්‍රිකා පිළියෙල කිරීම

6. මහනුවර, කුරුණෑගල, මාතලේ, කෑගල්ල යන දිස්ත්‍රික්ක වල පවත්වනු ලබන සාදික්කා පත්‍ර පතන රෝගය කළමනාකරණය පිළිබඳ තාක්ෂණික උපදේශන සේවාව සැපයීම සහ අධීක්ෂණය කිරීම.

7. අපගේ සෘජු දුරකථන මාර්ග ඔස්සේ මතු කරන ලද ශාක ආරක්ෂණ ගැටළු **500** කට අධික සංඛ්‍යාවක් සඳහා යෝග්‍ය විසඳුම් ලබා දී ඇත.

වගුව5.4.7.1: පැලෑටි සංරක්ෂණ සේවය යටතේ **2018** වර්ෂයේදී පවත්වන ලද ක්ෂේත්‍ර චාරිකා, පුහුණු පන්තිය සහ ක්ෂේත්‍ර දින සංඛ්‍යාව

බෝගය	රෝගය/පලිබෝධය	පුහුණු සංඛ්‍යාව	පුහුණුව සඳහා සහභාගීවූවන් සංඛ්‍යාව	ක්ෂේත්‍ර දින ගණන	ක්ෂේත්‍ර චාරිකා ගණන
කෝපි	මලකඩ රෝගය				01
ගම්මිරිස්	පත්‍ර කුඩා වීමේ රෝගය සෙමින් මැලවීම ඉක්මන් මැලවීම පත්‍ර අංගමාරය කඳ විදින්නා	03	250	03	06
අනෙකුත් අප:කෘෂි: බෝග	පසු අස්වනු හානි අවම කිරීම	02	200		
එකතුව		**05**	**450**	**03**	**07**

5.4.8 පර්යේෂණ අංශය මගින් නිකුත් කරන ලද රෝපණ ද්‍රව්‍ය.

අයිතමය	ප්‍රමාණය
ගම්මිරිස්	12000
කුරුඳු බීජ	2919
කුරුඳු අතු කැබලි	1479

5.4.9. සහයෝගිතා පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති

1. ජීවනෝපායයන් සහ දේශගුණික විපර්යාස සඳහා අනුගතවීම, ජෛව විවිධත්ව සංරක්ෂණය හා භාවිතය, ශ්‍රී ලංකාවේ කෘෂි පරිසර පද්ධතීන් තුළ ක්‍රියාත්මක කිරීම.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය

1. සීඝ්‍ර පැළ නිෂ්පාදනය සඳහා බුලත් රිකිලි වර්ධනය කිරීමට පොහොර සහ පාංශු තෙතමනයේ බලපෑම. ඩී. ඒ. වයි. වික්‍රමනායක (ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය), එච්. එම්. පී. ඒ. සුභසිංහ, එච්. ඒ. ඩබ්. එස්. ගුණතිලක, කේ. එච්. එම්. අයි.. කරුණාරත්න.
2. උසස් ගුණාත්මයේ බුලත් රිකිලි නිෂ්පාදනය සඳහා බුලත්වැලේ සාර්ථක වර්ධනය කෙරේ පැල සිටවන වල පිරවීමට සුදුසු මිශ්‍රණයන් ඇගයීම. ජී. ඩී. ඩී. පී.. කුමාරි (ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය), එච්. එම්. පී. ඒ. සුභසිංහ, ඊ. ඒ. එච්. එම්. හේරත්.
3. විවිධ පොහොර වර්ග මගින් ගම්මිරිස් වල මල් ඇතිවීම උත්තේජනය කිරීම හා අනුගාමී කරල් වර්ධනය කෙරේ බලපෑම. එම්. පී. කොළඹගේ (ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය), එච්. එම්. පී. ඒ.. සුභසිංහ, එච්. ඒ. ඩබ්. එස්. ගුණතිලක.
4. උසස් තත්වයේ රිකිලි නිෂ්පාදනය සඳහා බුලත් වැල් වර්ධනය කෙරේ විවිධ පොහොර වර්ග වල බලපෑම. එච්. එම්. එස්. එන්. හේරත් (ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය), එච්. එම්. පී. ඒ. සුභසිංහ, එච්. එම්. අයි. කේ. හේරත්
5. කාබනික පාංශු ආකලන යටතේ, ගම්මිරිස් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා කඳ රිකිලි පැලයන්හි වර්ධන සාර්ථකත්වය අධ්‍යයනය. මිස්වර් රමිස් (කැලණිය විශ්ව විද්‍යාලය), එච්. එම්. පී. ඒ. සුභසිංහ, ආර්. එම්. සී. එස්. රත්නායක.

5.4.10. 2018 වර්ෂය තුළ පර්යේෂණ අංශය විසින් උපයන ලද ආදායම්

2018 වසර තුලදී නාරම්මල අතුරුවගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය මගින් බෝග අස්වනු / තාක්ෂණික ප්‍රකාශන අලෙවියෙන් ලත් ආදායම

අයිතමය	වටිනාකම (රු)
පොල්	18,76,835. 91
බුලත් කොළ	35,961.68
බුලත් දඬු	1,20,520.00
අන්නාසි	28,481.00
කෙසෙල්	2,762.50
කුරුඳු පැල	17,550.00
තාක්ෂණික ප්‍රකාශන	41,470.00

වල්පිට පටක රෝපණ පර්යේෂණ **මධ්‍යස්ථානය මගින් 2018 වර්ෂය තුලදී උපයා ඇති අදායම**

අදායම ලැබෙන මාර්ගය (විකිණීම තුලින්)

ප්‍රමාණය	පැළ මගින්	වියළි ගම්මිරිස් කෙසෙල් සහ තැඹිලි	තාක්ෂණික ප්‍රකාශන	භාණ්ඩ වෙන්දේසියෙන්	මුළු අදායම
මුළු ප්‍රමාණය	389,8561.00	62,100.00	13,935.00	14,670.00	3,989,266.00

නියැදි පරීක්ෂාවෙන්, පැළ අලෙවියෙන් තිහගොඩ කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානයෙන් උපයාගන්නා ලද ආදායම්

සාම්පල් වර්ගය	**ප්‍රමාණය**	**ඉපැයීම් රු.**
පී. එච්. හා විද්‍යුත් සන්නායක තාව	123	12,300.00
NPK පරීක්ෂාව හා විශ්ලේෂණය	132	92,400.00
Bar පරීක්ෂාව	1	3,400.00
තෙල් ප්‍රතිශතය පරීක්ෂාව	12	9,000.00
ජල ක්‍රියාකාරීත්ව පරීක්ෂාව	68	30,600.00
සල්ෆර් පරීක්ෂාව	3	2,250.00
GCMS පරීක්ෂාව	24	72,000.00
මුළු ප්‍රමාණය	363	221,950.00

රෝපණ ද්‍රව්‍ය විකිණීමෙන් ලැබූ ආදායම

රෝපණ ද්‍රව්‍ය වර්ගය	**ප්‍රමාණය**	**ඉපැයීම රු.**
දඬු කැබලි	1,479	44,370.00
බීජ පැළ	2,919	37,947.00
එකතුව	4,398	82,317.00

5.5 අපනයන කෘෂි බෝග වල ආර්ථික හා අලෙවිකරණය සම්බන්ධ පර්යේෂණ

5.5.1 අධ්‍යයන හා සමීක්ෂණ

5.5.1.1 සාදික්කා පත්‍ර පතන රෝගය පාලනයට ගන්නා ලද ක්‍රියාමාර්ග වල සඵලතාවය ඇගයීම සඳහා වන පසු විපරම් සමීක්ෂණය.

සාදික්කා යනු ප්‍රධාන අපනයන කෘෂි බෝග 5 අතුරින් එකක් වන අතර එය ශ්‍රී ලාංකීය ආර්ථිකයට රු. මිලියන 2500 කට වැඩි විදේශ විනිමයක් වාර්ෂිකව ලභාකර දෙනු ලබයි. ශ්‍රී ලංකාවේ සමස්ථ සාදික්කා වගා වපසරිය හෙක්ටයාර 2589 ක් පමණ වේ. මෙම වගාව ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී ඇත්තේ මහනුවර දිස්ත්‍රික්කය හා ඒ අවට ප්‍රදේශ වලයි. මෑත කාලසීමාවේ දී සාදික්කා කර්මාන්තයේ සිදුවූ බිඳවැටීමට එක් හේතුවක් ලෙස සැලකනුයේ ප්‍රධාන වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ සාදික්කා වගාවන් වෙත විශාල වශයෙන් හානි පමුණු වන ලද සාදික්කා පත්‍ර පතන රෝගයයි. 2014 වර්ෂයේ දී මෙම රෝගයේ උපරිම හානියක් පෙන්නුම් කරණ ලද අතර සාදික්කා ගස් 2000 ක් පමණ සම්පූර්ණයෙන් විනාශ වී මරණයට පත් වූ බවද 15000 කට අධික ප්‍රමාණයකට රෝගය දරුණු ලෙස වැලදී ඇති බව ද වාර්තා විය.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය මගින් සිදුකරන ලද දීර්ඝ කාලීන අධ්‍යනයන්ගෙන් අනතුරුව මෙම රෝගය පාලනය සඳහා ප්‍රතිකාර ක්‍රමයක් සොයා ගන්නා ලද අතර එම නිර්දේශයන් මත පදනම්ව දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය විසින් රෝගය දරුණු ලෙස පැතිරුණු ප්‍රදේශවල රසායනික ප්‍රතිකාරක ඉසීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. රසායනික ද්‍රව්‍ය හා ඉසීමේ යන්ත්‍ර රජය විසින් නොමිලේ සපයා දුන් අතර රසායන ඉසීම සඳහා එක් එක් ග්‍රාම නිලධාරී වසම් වලින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ පුද්ගලයන් වෙත දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය විසින් පුහුණුවක්ද ලබා දෙන ලදි. ඉසීම සඳහා වැයවන ගාස්තුව / කුලිය වගාකරුවන් හට දැරීමට සිදුවිය. මෙම වැඩසටහන 2014

හා 2015 වර්ෂවල දී ක්‍රියාත්මක වූ අතර මෙම අවධියේදී රෝගය පාලනය කල හැකි මට්ටමක පැවතින . කෙසේ නමුත්,මෙම වැඩසටහන අවසන් වීමෙන් පසු එහි සඵලතාවය පිළිබඳ පසු විපරමක් සිදුකිරීම අත්‍යවශ්‍යබව හැඟි යන ලදි.

ඒ අනුව මෙම පර්යේෂණ කටයුතු 2017 වර්ෂය අග භාගයේදි ආරම්භ කරණ ලද අතර එය 2018 ජූලි මස දක්වා ක්‍රියාත්මක විය. සමීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කරන ලද්දේ මහනුවර මාතලේ,කැගල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල රසායනික ප්‍රතිකාර වලට බඳුන් වූ සාදික්කා වගාවන් වලයි .ඊට අමතරව ක්ෂේත්‍රය් දී ලැබණු තොරතුරු මත පදනම්ව තවත් වගා ක්ෂේත්‍රයන් කිහිපයක්ද සමීක්ෂණයට භාජනය කරන ලදි. ඒ අනුව වගා ක්ෂේත්‍ර 290කින් පමණ තොරතුරු එක්රැස් කරන ලදි. මේවන විට එම දත්ත පරිගණකගත කිරීම අවසන් කර ඇති අතර දත්ත විශ්ලේෂණ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවති.

5.5.1.2 උඩරට ගෙවතු වගා **(Kandyan Home Gardens)** වලට අදාලව ගම්මිරිස් තනි වගා, අතුරු බෝග වගා හා මිශ්‍ර වගා පද්ධති වල ඇති සමස්ත පරිසර පද්ධති ප්‍රතිලාභ සංසන්දනය කිරීම.

ගම්මිරිස්, කරාබු, සාදික්කා, එනසාල්, කෝපි, කොකෝවා, වැනිලා සහ පුවක් වැනි අපනයන කෘෂි බෝග රටේ මධ්‍ය ප්‍රදේශයේ මහනුවර මාතලේ,කැගල්ල වැනි දිස්ත්‍රික්ක වල ගෙවතු වගාවන් හි මිශ්‍ර බෝග පද්ධති ලෙස සාම්ප්‍රදායිකව වගා කරනු ලැබේ. මෙම සියළුම බෝග බහුවාර්ෂික වන බැවින් ඒවා බොහෝ කාලයක් අස්වනු ලබා දෙයි. එබැවින් සාම්ප්‍රදායික වශයෙන් ගොවීන් පුරුදු වී සිටියේ මෙම සියළු බෝග වෙනස් ප්‍රයෝජනවත් වාර්ෂික හා බහු වාර්ෂික බෝග හා මිශ්‍රව මනා සංකලනයක් ලෙස තම ගෙවතු වල වගා කිරීමෙන් එවායේ උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමටයි. මෙම වගා ක්‍රමය මගින් ගෙවතු හිමියන්ට දෛනික ආහාර අවශ්‍යතා සපුරා ගැනීම ඖෂධ බෝග, දැව, දීර්ගකාලීන බෝග අස්වැන්න ලබා ගැනීම මෙන්ම මනස්කාන්ත ගෙවතු වටපිටාවක් නිර්මාණය කරගැනීමට අවස්ථාව සැලසිනි. එපමණක් නොව මෙමගින් භූමියේ පාංශු පෝෂණය ඉහල නැගෙන අතර පාංශු වයනය, ව්‍යුහය, ප්‍රයෝජනවත් ක්ෂුද්‍ර ජීවීන් ආරක්ෂා කිරීම මෙන්ම පාංශු බාදනය වැලැක්වීමද සිදු විය.

1972 වර්ෂයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආධාර ක්‍රමය ආරම්භ වීමත් සමඟ අපනයන කෘෂි බෝග තනි වගා පද්ධති පිහිටුවීම ජනප්‍රිය වූ අතර මේ වන විට සැලකිය යුතු වගා වපසරියක් ප්‍රධාන වශයෙන් ගම්මිරිස් වැනි බෝග තනිවගා පද්ධති මෙම ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇත. ගම්මිරිස්, කරාබු වැනි අපනයන කෘෂි බෝග වල ආදායම ඉහල අගයක් ගන්නා බැවින් ඒවා වෙනත් වැවිලි බෝග (උදා:තේ) සමඟ අතුරු බෝග ලෙස වගා කිරීම නිර්දේශ කෙරිණි. ඉහත සියළුම විකල්ප සඳහා භූමි භාවිතය පිළිබඳ තීරණ ගැනීමේදී මූලික නිර්ණායකය ලෙස සැලකුයේ භෝග වල අස්වැන්නයි. කෙසේ නමුත් මෑතකදී

හඳුන්වා දෙන ලද සංකල්පයක් වන පරිසර පද්ධති ප්‍රවේශය (Eco – system approach) ට අනුව අපනයන කෘෂිබෝග වගා පද්ධති වල සමස්ත පරිසර පද්ධති ප්‍රතිලාභ ගණනය කිරීමේදී වගා භූමියේ ඇති සියළුම ද්‍රව්‍ය හා වගා භූමිය මඟින් ඇති කරනු ලබන සේවාවන් යන සියල්ලම සැලකිල්ලට ගනු ලැබේ.

මෙම අධ්‍යනයේ අරමුණ වන්නේ මහනුවර දිස්ත්‍රික්කයේ ගම්මිරිස් මත පදනම් වූ නිසා පද්ධති වලින් සිදු වන ස්පර්ශක හා ස්පර්ශක නොවන ප්‍රතිලාභ ගණනය කිරීම හා තක්සේරු කිරීමයි. ගම්මිරිස් තනි වගා, ගම්මිරිස් - තේ අතුරු බෝග වගා සහ ගම්මිරිස් මිශ්‍ර බෝග වගා යන වගා පද්ධතීන් තුන මෙම අධ්‍යනය සඳහා තෝරා ගන්නා ලදී. සමීක්ෂණ කටයුතු උඩුනුවර, යටිනුවර, මිනිපේ, උඩුදුම්බර හා තෙල්දෙණිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහ තුල සිදු කරණ ලද අතර ව්‍යුහාත්මක ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් තොරතුරු රැස් කරන ලද අතර එක් එක් කාණ්ඩයට අදාලව ගොවීන් 35 බැගින් සමීක්ෂණය සඳහා යොදා ගන්නා ලදී. තනි වගාවන්ට අදාල සමීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර 2018 වර්ෂය අවසාන වන විට තේ - ගම්මිරිස් අතුරු වගා වලට අදාල සමීක්ෂණ කටයුතු 70% ක් පමණ අවසන් කරන ලදී.

5.5.2. අපනයන කෘෂි බෝග වගා වපසරිය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් 2018 වර්ෂයේදී එක්රැස් කර පලකරන ලද සංඛ්‍යාලේඛන දත්ත මත පදනම්ව සකස් කරන ලද අපනයන කෘෂි බෝග වල වගා වපසරිය ඇමුණුම I මඟින් දක්වා ඇත.

5.5.3. අපනයන කෘෂි බෝග වල ඇස්තමේන්තුගත නිෂ්පාදනය

අපනයන කෘෂි බෝග වල වාර්ෂික නිෂ්පාදනය ඇස්තමේන්තුගත කරන්නේ අපනයන, විවිධ ක්ෂේත්‍ර වලට අදාලව දේශීය පරිභෝජනය (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා වලට අනුව ගෘහාශ්‍රිත පරිභෝජනය, කර්මාන්ත පරිභෝජනය හා ආහාර සේවා කර්මාන්ත වල පරිභෝජනය) සහ ආනයන යන සාධක සලකා බැලීමෙනි. තවද එහිදී, දැනට පවතින තොග හා වාර්තා නොවූ අපනයන වෙනුවෙන්ද සැලකිය යුතු ප්‍රමාණයක් වෙන් කරනු ලබයි.

එම උපකල්පන මත පදනම්ව වසර 2016 සිට 2018 දක්වා කාලසීමාව සඳහා ඇස්තමේන්තු කරන ලද අපනයන කෘෂි බෝග නිෂ්පාදනය පහත 5.5.3.1. වගුව මඟින් දක්වා ඇත.

වගුව 5.5.3.1. අපනයන කෘෂි බෝග වල ඇස්තමේන්තුගත නිෂ්පාදනය (මෙට්‍රි.ටොන්) (2016-2018)

බෝගය / වර්ෂය	2016 **	2017**	2018*
කෝපි	2,824	2,496	2,398
කොකෝවා *	650	471	654
කරාබු	1,823	6,413	1,284
කරඳමුංගු	120	113	71
කුරුඳු	18,945	22,341	23,019
ගම්මිරිස්	18,476	29,546	20,135
සාදික්කා සහ වසාවාසි	2,723	3,545	3,036
පැහිරි තෙල් *	54	42	56
බුලත්	15,040	15,549	14,013
පුවක්	13,260	11,570	12,117
ඉඟුරු (අමු) ++	23,184	16,326	14,208
කහ (අමු) ++	25,204	10,267	10,727

* වාර්ෂික අස්වනු පුරෝකථනය

** සංශෝධිත * යාවකාලික

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ අප. කෘෂි. දෙපා. දත්ත පද්ධතිය

++ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

5.5.4. 2018 වර්ෂයේ කෘෂි බෝග වල අපනයනයන පරිමාව හා ආදායම

2018 වර්ෂයේ අපනයන කෘෂි බෝග වල සමස්ථ අපනයන පරිමාව මෙට්‍රික් ටොන් 48,331.82 පමණ වන අතර එය වටිනාකමින් රු. මිලියන 64,590.51 (ඇමුණුම II). කුරුඳු හැර අනෙකුත් බොහෝ අපනයන කෘෂි බෝග වල නිෂ්පාදන පරිමාව හා ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව 2018 වසරේදී අඩුවීමක් පෙන්නුම් කරයි.

පසුගිය වසර දෙක තුලදී මෙන්ම 2018 වර්ෂයේදී ද රටේ වඩාත් වැඩි අවධානයකට බඳුන් වූ අපනයන කෘෂි බෝගය වන්නේ ගම්මිරිස් බෝගය වන අතර එය රට තුල සැලකිය යුතු දේශපාලනික පීඩනයක් ඇතිකිරීමට සමත් විය. 2018 වර්ෂය තුලදීද දේශීය ගම්මිරිස් මිල ගණන් වල අඛණ්ඩ පහත බැසීමක් පෙන්නුම් කෙරිණි. කෙසේ නමුත් මේ පසුබිම තුලදී 2018 වර්ෂයේ ශ්‍රී ලංකාව ගම්මිරිස් මෙට්‍රික් ටොන් 13,118.10ක් අපනයන කර ඇති අතර රු. මිලියන 12,074.02ක අදායමක් මෙරටට ලභා කර දී ඇත. එය

2017 වර්ෂයට සාපේක්ෂව 1.4%ක අපනයන පරිමාවේ අඩුවීමක්ද 5.4%ක ආදායමේ අඩුවීමක්ද පෙන්නුම් කරයි.

ගම්මිරිස් තෙල් වල අපනයන පරිමාව හා ආදායම සැලකීමේදී 2018 වර්ෂයේදී එය පිලිවෙලින් මෙට්‍රික් ටොන් 66.51ක් හා රු. මිලියන 308.98ක් වූ අතර 2017 වර්ෂය හා සැසඳීමේදී එය 35.8%ක අපනයන පරිමාවේ වැඩිවීමක්ද 36.2%ක් ආදායමෙහි අඩුවීමක්ද ලෙස පෙන්නුම් කරයි. ගම්මිරිස් ඔලියොරෙසින අපනයන පරිමාවද 2018 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 360ක් දක්වා පහල බැසීමක් පෙන්නුම් කරයි. අපනයන ආදායමද රු. මිලියන 2742.72 සිට රු. මිලියන 2064.59 දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි.

දශක ගණනාවක් පැවති තත්වය බිඳ හෙලමින් 2016 වර්ෂයේ සිට කුරුඳු අපනයනය අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරයි. 2018 වර්ෂයේදී අපනයන පරිමාව මෙට්‍රික් ටොන් 17,536.51 ක් වන අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 5.5%ක ඉහල යෑමකි. එය ඉතිහාසය තුල වාර්තාගත ඉහලම කුරුඳු අපනයන පරිමාව වේ. අපනයන ආදායමද 2017 වර්ෂයට සාපේක්ෂව ඉහලම කුරුඳු අපනයන පරිමාව වේ. අපනයන ආදායමද 2017 වර්ෂයට සාපේක්ෂව 12.9%කින් ඉහල ගොස් ඇති අතර එහි මුළු වටිනාකම රු. මිලියන 34,852.88කි. එමෙන්ම 2018 වර්ෂයේ සමස්ත අපනයන කෘෂි බෝග අපනයන ආදායමෙන් 54%ක් මෙරටට ලභාකරදී ඇත්තේ කුරුඳු අපනයනයයි.

කෝපි හා ඉහුරු බෝග හැර අනෙකුත් අපනයන කෘෂි බෝග වල අපනයන පරිමාවන් 2017 වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේදී අඩුවීමක් පෙන්නුම් කරයි. ඉහුරු බෝගයේ අපනයන පරිමාව හා ආදායම පිලිවෙලින් මෙට්‍රික් ටොන් 97.17ක් හා රු. මිලියන 121.96කි. එය 2017 වර්ෂයට සාපේක්ෂව 19.1%ක අපනයන පරිමාවේ වැඩිවීමක් හා 30%ක ආදායමේ ඉහල යාමක් ලෙස සටහන් වේ. කෝපි අපනයන පරිමාව හා ආදායම 2017 වසරට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමකින් ඉහල ගොස් ඇති අතර එම ඉහළයාම ප්‍රතිශතයක් ලෙස පිලිවෙලින් 71.1% හා 59.2% කි. 2018 වර්ෂයේදී කරාබු, සාදික්කා හා වැනිලා හැර අනෙකුත් සියලු අපනයන කෘෂි බෝග වල ආදායම 2017 වර්ෂයට සාපේක්ෂව පහත බැසීමක් පෙන්නුම් කරයි. වැනිලා අපනයනයේ ආදායම පසුගිය වසරට සාපේක්ෂව කැපීපෙනෙන ඉහල යාමක් පෙන්නුම් කරන අතර එය ප්‍රතිශතයක් ලෙස 2017 වසරට සාපේක්ෂව 133.6%ක වැඩි වීමකි. තවද කරාබු හා සාදික්කා අපනයන ආදායමද පසුගිය වසරට සාපේක්ෂව පිලිවෙලින් 1.1% ක හා 7% ක ඉහල නැගීමක් පෙන්නුම් කරයි.

කුරුඳු කොළ තෙල්, කරඳමුංගු තෙල්, පැහිරි තෙල්, සාදික්කා තෙල්, වසාවාසි තෙල් හා ඉහුරු තෙල් හැර අනෙකුත් සගන්ධකාරක තෙල් නිෂ්පාදන වල අපනයන පරිමාවේ හා ආදායමේ ඉහල යාමක් පෙන්නුම් කරන අතර ඒ අතරින් කැපී පෙනෙන ආදායමේ වැඩිවීමක් පෙන්නුම් කර ඇත්තේ වැනිලා තෙල් සහ

සේර තෙල් වේ. පරිමාව හා ආදායම සැලකූ විට සාපේක්ෂව කුඩා අගයන් වුවද වැනිලා සහ සේර තෙල් අපනයනය 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී සැලකිය යුතු ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. එම බෝග දෙක සඳහාම රට තුල ස්ථාපිත මහා පරිමාණ වාණිජ වගාවන් නැති පසුබිමක මෙම වර්ධනය කැපී පෙනෙන කරුණකි. 2017 වර්ෂයට සාපේක්ෂව පැහිරි හා ඉඟුරු තෙල් වල අපනයන ආදායමෙහි අඩුවීමක් පෙන්නුම් කලද, 2018 වර්ෂයේ අපනයන පරිමාව පිලිවෙලින් 7.5% හා 56.2%කින් ඉහල ගොස් ඇත. සමස්ථයක් ලෙස ගත විට 2018 වසරේදී අපනයන කෘෂි බෝග ආශ්‍රිත සගන්ධකාරක තෙල් නිෂ්පාදන වල අපනයන ආදායම 2017 වර්ෂයට සාපේක්ෂව 4.13% කින් ඉහල ගොස් ඇති අතර අපනයන පරිමාව 31%කින් පහල බැසීමක් පෙන්නුම් කරයි.

5.5.5. 2018 වර්ෂයේ ශ්‍රී ලංකාවෙන් අපනයන කෘෂි බෝග හා ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කරනු ලැබූ රටවල්

සුපුරුදු ලෙසම, 2018 වර්ෂයේදී ද ශ්‍රී ලංකාවේ කුරුඳු අපනයනයෙන් 55%කට ආසන්න ප්‍රතිශතයක් මෙක්සිකෝව විසින් මිලදීගෙන ඇති අතර ඉතිරි පරිමාවෙන් වැඩි ප්‍රතිශතයක් ලතින් ඇමරිකානු රටවල් මගින් මිලට ගෙන ඇත. ඇමරිකා එක්සත් ජනපදය මගින් 2017 වර්ෂයේදී මිලදී ගත කුරුඳු මෙට්‍රික් ටොන් 1995 ක් පරිමාව 2018 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 1827.5 දක්වා පහත බැස ඇත. 2018 වර්ෂයේදී ගම්මිරිස්, කරාබු, සාදික්කා සහ වසාවාසි වල ප්‍රධාන ගැනුම්කරු ඉන්දියාව වන අතර එම ප්‍රමාණයන් පිලිවෙලින් ගම්මිරිස් 84%, කරාබු 64%, සාදික්කා 57%ක් හා වසාවාසි 57% පමණ වේ. එමෙන්ම පුවක් නිෂ්පාදන වල සමස්ථ පරිමාවෙන් 99% ක්ද කොකෝවා නිෂ්පාදන වලින් 67%ක් (මෙට්‍රික් ටොන් 1496) ක් මිලදී ගෙන ඇත්තේ ඉන්දියාව විසිනි. ශ්‍රී ලංකාවේ බුලත් සඳහා ප්‍රධාන ගැනුම්කරු පකිස්ථානය වන අතර 2017 වර්ෂයේ මෙට්‍රික් ටොන් 5030ක් වූ පකිස්ථානය මගින් මෙරට බුලත් ආනයනය 2018 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 3858 ක් දක්වා පහත බැසීමක් පෙන්නුම් කරයි. 2018 වර්ෂයේ ශ්‍රී ලාංකීය කුරුඳු කොළ තෙල් හා පොතු තෙල්, පැහිරි තෙල්, ඉඟුරු තෙල්, සේර තෙල් සඳහා ප්‍රධාන ගැනුම්කරු වනුයේ ඇමරිකා එක්සත් ජනපදයයි. කරඳමුංගු තෙල්, කරාබු තෙල්, සාදික්කා තෙල්, ගම්මිරිස් තෙල් සහ වැනිලා තෙල් සඳහා 2018 වර්ෂයේදී ප්‍රධාන ගැනුම්කරුවන් වී ඇත්තේ ප්‍රංශය, කැනඩාව, ඉන්දියාව, සපාඤ්ඤය සහ ජර්මනිය යන රටවල්ය.

5.5.6. 2018 වර්ෂයේ අපනයන කෘෂි බෝග වල මිලෙහි හැසිරීම

පසුගිය වසරට සාපේක්ෂව 2018 වර්ෂයේදී කෝපි, කරාබු, කුරුඳු, වසාවාසි, කරඳමුංගු සහ බුලත් වල වාර්ෂික සාමාන්‍ය ගොවිපල මිල ගණන්වල ඉහල යාමක් පෙන්නුම් කරන අතර කොකෝවා, ගම්මිරිස්, සාදික්කා, පැහිරි සහ ඉඟුරු වල වාර්ෂික සාමාන්‍ය ගොවිපල මිල ගණන්වල පහල බැසීමක් පෙන්නුම්

කරයි (ඇමුණුම III). සියලුම අපනයන කෘෂි බෝග අතුරින් වඩාත් කැපිපෙනෙන මිල ඉහල යෑමක් පෙන්නුම් කරන ලද්දේ බුලත් බෝගයයි. 2017 වර්ෂයේදී බුලත් කොළ 1000ක් සඳහා රු. 1855.26ක් වූ ගොවිපල මිල 2018 වසරේදී රු. 3728.65 දක්වා සීඝ්‍ර මිල ඉහල යෑමක් වාර්තා කරන ලදී. 2017 වර්ෂයේදී කුරුඳු කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය ගොවිපල මිල රු. 1846.13 ක් වූ අතර එය 2018 වසරේදී රු. 2018.70 දක්වා ඉහල නැංවෙන ලදී. එමෙන්ම 2017 වසරේදී රු. 2502.47ක් වූ කරඳමුංගු කිලෝග්‍රෑමයක මිලද 2018 වර්ෂයේදී 2778.36 දක්වා ඉහල යෑමක් පෙන්නු කරයි. ගම්මිරිස් වල වාර්ෂික සාමාන්‍ය ගොවිපල මිල පහත බැසීම 2018 වර්ෂයේදී ද නිරීක්ෂණය වේ. මෙම ප්‍රවණතාවය 2016 වර්ෂයේ ආරම්භ වී එම වර්ෂයේ මැයි මාසයෙන් පසුව සීඝ්‍ර මිල පහත බැසීමක් පෙන්නුම් කර මේ දක්වා අඛණ්ඩව පවත එනු ලබන්නකි. ඒ අනුව 2017 වර්ෂයේ රු. 831ක් ව තිබූ ගම්මිරිස් වාර්ෂික සාමාන්‍ය ගොවිපල මිල 2018 වර්ෂයේදී රු. 586 දක්වා පහත බැසීමක් පෙන්නුම් කරයි.

"පබ්ලික් ලෙජර්" සඟරාවට අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව 2018 වසරේදී කොකෝවා, වසාවාසි, කරඳමුංගු සහ පැණිරි හැර අනෙකුත් ශ්‍රී ලාංකීය අපනයන කෘෂි බෝග සඳහා වන ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් වලද පහත බැසීමක් පෙන්නුම් කරයි.

5.5.7. 2018 වර්ෂයේ අපනයන කෘෂි බෝග වල ආනයන ප්‍රවණතා

2018 වර්ෂයේ සමස්ථ ආනයන පරිමාව 2017 වර්ෂයට සාපේක්ෂව 12%කින් ඉහල නැගීමක් නිරීක්ෂණය වේ. එනම් 2017 වර්ෂයේ මෙට්‍රික් ටොන් 13670ක් වූ සමස්ථ ආනයන පරිමාව 2018 වර්ෂයේ මෙට්‍රික් ටොන් 15,323.68ක් ලෙස වාර්තා වේ. එමෙන්ම රු. මිලියන 6769ක් වූ 2017 වර්ෂයේ ආනයන වටිනාකම 2018 වර්ෂයේදී රු. මිලියන 7,374.51ක් දක්වා ඉහල ගොස් ඇත (ඇමුණුම IV). 2018 වසරේ ප්‍රධාන වශයෙන් මෙරටට ආනයනය කරන ලද අපනයන කෘෂි බෝග වනුයේ කහ, කොකෝවා, ඉඟුරු සහ ගම්මිරිස් වේ. මූලික වශයෙන්, අගය එකතු කල නිෂ්පාදන සඳහා ආනයනය කරන ලද වාර්තාගත ගම්මිරිස් ආනයනය 2017 වර්ෂයට සාපේක්ෂව 127% ප්‍රමාණයකින් ඉහල ගොස් ඇති බව නිරීක්ෂණය වන අතර සංඛ්‍යාත්මකව ගත විට එය 2017 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 1398ක් හා 2018 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 3179ක් ලෙස වාර්තා වේ.

2018 වර්ෂයේදී කරඳමුංගු අනයනයේ සැලකිය යුතු පහත බැසීමක් පෙන්නුම් කරන අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව 89%ක අඩු වීමක් එනම් 2017 වසරේදී මෙට්‍රික් ටොන් 321.88 ක් වූ ආනයනික කරඳමුංගු පරිමාව 2018 වසරේදී මෙට්‍රික් ටොන් 34ක් දක්වා පහත බැසීමක් පෙන්නුම් කරයි. එමෙන්ම 2017 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 1731.53ක් වූ ඉඟුරු ආනයනයද 2018 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 1395.38ක් දක්වා එනම් 19%කින් පහත බැසීමක් පෙන්නුම් කරයි. 2018 වර්ෂයේ කොකෝවා සහ කොකෝ නිෂ්පාදන ආනයන වටිනාකමෙහි තරමක අඩුවීමක් (3.7%) ක් පෙන්නුම් කලද ආනයන

පරිමාව 2017 වර්ෂයට සාපේක්ෂව සුළු ඉහළ යාමක් (0.8%) පෙන්නුම් කරයි. තවද 2017 වර්ෂයට සාපේක්ෂව කරාබු, කුරුඳු සහ කෝපි ආනයන පරිමාවෙහි මෙන්ම වටිනකමෙහිද වැඩිවීමක් නිරීක්ෂණය වේ. පසුගිය වර්ෂයට සාපේක්ෂව කුරුඳු පොතු තෙල්, පැහිරි තෙල් සහ වැනිලා තෙල් ආනයනයෙහි ද සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම් කරන අතර පුවක් හැර ඉහත දක්වා නොමැති අනෙකුත් සියලුම අපනයන කෘෂි බෝග හා ආශ්‍රිත නිෂ්පාදන 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවට ආනයනය කර ඇත්තේ ඉතා කුඩා පරිමාණ වලිනි (ඇමුණුම IV).

පර්යේෂණ ප්‍රකාශණ- 2018

කුමාර, පී. ජී. ඒ. එල්., අත්තනායක, සී. අයි. එම්., ඉඩමෙකෝරාළ, පී. ආර්., රන්දෙණිය, ඊ.,සුමනසේන, එච්. ඒ., බන්ඩාර, වයි. එම්. එස්., සෙනවිරත්න, ජී., සහ කුමාරසිංහ අයි., (2018) තවාන් අවස්ථාවේදී ගම්මිරිස්(*piper nigrum* l) පැළ මත "බයෝෆේම්" ජෛව ප්‍රතිකාරකයේ සහ බඳුන් මාධ්‍යයේ බලපෑම, වාර්ෂික සුළු අපනයන බෝග සමුළුව (සංස්කාරක - බී. මාරඹේ) 5 කලාපය 113 – 120 පිටුව, 18 – 19 ඔක්තෝබර්, පේරාදෙණිය.

විදානපතිරණ සී. යූ., කුමුදු පී. පී., කෝපියවත්තගේ (2018) විවිධ කෘෂිරසායන භාවිතය පිළිබඳ ගොවියන්ගේ දැනුවත්භාවය හා ඒවා භාවිතාකරණ විවිධ ආකාර- ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඟුරු (*Zingiber officinale* Rose.) වගාකරුවන් පිළිබඳ සිද්ධි අධ්‍යනයක්, අපනයන කෘෂිකර්ම භෝග පිළිබඳව වාර්ෂික සමුළුව,(බී. මාරඹේ සං)ග 5 වෙළුම, 63 -75 පිටු අංක: 18-19 ඔක්. පේරාදෙණිය, ශ්‍රී ලංකාව.

කොඩිතුවක්කු ආර්.ඩී., විජේකෝන් ඩබ්.එම්.ආර්.ඩබ්.බී.,පිල්ලෙ ඩී.එස් (2018) ෆයිටොප්තොරා කැප්සිසි (Phytophthora capsici) දිලීරය රෝග කාරක වන ගම්මිරිස් ක්ෂණික මැලවීමේ රෝගය තිරසාර ලෙස කළමණාකරනය කිරීමේ හැකියාව අපනයන කෘෂිකර්ම පර්යේෂණ සමුළුව 2018., 18 - 19 ඔක්. පේරාදෙණිය, ශ්‍රී ලංකාව. පිටු අංක :44-51.

කොඩිතුවක්කු ආර්.ඩී., විජේකෝන් ඩබ්.එම්.ආර්.ඩබ්.බී.දියර මාධ්‍ය තුල ට්‍රයිකොඩර්මා දිලීරයේ ජීවඝ්‍යතාවය නීර්ණය කිරීම. SLCARP

විජේකෝන් ඩබ්.එම්.ආර්.ඩබ්.බී.රූපසිංහ පී.එස්.ඒ., ද සිල්වා පී.ඩී.පී.එම්., කොඩිතුවක්කු ආර්.ඩී,දෙණියපහල ඩි.වී.ආර්.අයි 2018 කරාඹු පත්‍ර පතන රෝගය සඳහා ඇති අනෙකුත් ධාරක ශාක

පිළිබඩ අධ්‍යනය. අපනයන කෘෂිකර්ම භෝග පිළිබඳ වාර්ෂික සමුළුව, (බී. මාරඹේ. සං). 2018., 18 - 19 ඔක්. පේරාදෙණිය, ශ්‍රී ලංකාව

මදුශංක, ජී. ඩි. එම්. පී., තිලකරත්න, ආර්. සී. එන්., ලියනගේ, ටී., නවරත්න, එස්. බී (2018): ඉන්දියානු කහ රයිසෝම සහ ශ්‍රී ලාංකික කහ රයිසෝමවල ශාක රසායනික ගුණාංග සංසන්දනය කිරීම . Journal of Pharmacognosy and Phytochemistry; වෙළුම 03, පිටු අංක 1995-1998.

ඉඳුරුව, අයි. වී. ඒ. ඩි. සී. එස්. රාජ්කුමාර්, කේ. ප්‍රසාදි, වී.පී.එන්. (2018): ආනයනික ඉන්දියානු කහ සහ ශ්‍රී ලාංකික කහ සාම්පලවල රසායනික තත්වය සංසන්දනය කිරීම. අපනයන කෘෂිකර්ම භෝග පිළිබඳ වාර්ෂික සමුළුව, (බී. මාරඹේ. සං) 2018. 18 - 19 ඔක්. පේරාදෙණිය, ශ්‍රී ලංකාව; වෙළුම 05, පිටු අංක 195-202,

ලියනගේ, ටී. දළුක්වටිය, පී. ඩි. ඒ. එම්., එධිරිසිංහ, ඊ.ඩි.කේ., කරුණාරත්න, ඒ. අයි. (2018): පැසුණු ගම්මිරිස් අස්වැන්නේ ඇති සැහැල්ලු ඇට සංරචකය වෙන් කිරීම සහ ප්‍රමාණාත්මක කිරීම. අපනයන කෘෂිකර්ම භෝග පිළිබඳ වාර්ෂික සමුළුව, (බී. මාරඹේ. සං) 2018: 18 - 19 ඔක්. පේරාදෙණිය, ශ්‍රී ලංකාව, වෙළුම 05, පිටු අංක 100-106.

මදුශංක, ජී. ඩි. එම්. පී., තිලකරත්න, ආර්. සී. එන්., ලියනගේ, ටී., නවරත්න, එස්. බී. (2018): ඉන්දියානු කහ රයිසෝම සහ ශ්‍රී ලාංකික කහ රයිසෝමවල කකියුමින් ප්‍රතිශතය නිර්ණය කිරීම සහ කහවල වර්ණයට එහි බලපෑම අධනය කිරීම: International Journal of Food Science and Nutrition ISSN: 2455-4898. www.foodsciencejournal.com වෙළුම 3; පිටු අංක 03-05.

ඩිශාන්, එම්.ඒ., සමරසින්හ, එම්.කෙ.එස්.ආර්.ඩී., වීරවන්ශ, ඒ.එන්.ආර්, සහ අල්විස්, එල්.එම්.එච්.ආර්.කෝපි බදරි ගුල්ලාගේ ආසාදනය සදහා විවිධ කෝපි ප්‍රබේද කෂ්ත්‍ර ඇගයීම. දෙවන අන්තර්ජාතික පර්යේෂන සමුලුව. 1-2 පෙබරවාරි 2018. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, බඩුල්ල, ශ්‍රී ලන්කා, පිටු අංක: 20

සමරසින්හ, එම්.කෙ.එස්.ආර්.ඩී, සහ ඩිශාන්, එම්.ඒ., 2018. ලක් පරකුම් නව ප්‍රබේදය සහ තෝරාගත් වෙනත් කෝපි ප්‍රබේද සදහා කෝපි බදරි ගුල්ල ආසාදනය. අපනයන කෘෂිකර්ම භෝග පිළිබඳ වාර්ෂික සමුළුව, (බී. මාරඹේ. සං). 5 වෙළුම, 18 - 19 ඔක්. පේරාදෙණිය, ශ්‍රී ලංකාව. පිටු අංක: 52-62

පී.කේ. යූ. ඉන්දීවරී, එච්.එම්.පී.ඒ. සුබසිංහ සහ ඒ.ඩී. අම්පිටියවත්ත. ගම්මිරිස් බෝගයේ (*Piper nigrum* L.) ආරම්භක වර්ධනය හා ආතති දින අතර පවතින සම්බන්දතාවය.. ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්යාලයේ වාර්ෂික සමුළුවේ ප්‍රගති සමාලෝචනය. 2018.

එච්.ඩබ්ලිව්. රෝසයුරු, එච්.එම්.පී.ඒ. සුබසිංහ හා ඩබ්.ජී. වෙකුඹුර. ගම්මිරිස් (*Piper nigrum* L.) බෝගයේ වියන වර්ධනය වීම කෙරෙහි විවිධ කප්පාදු ක්‍රම සහ පුහුණු ක්‍රම බලපාන ආකාරය.. ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්යාලයේ වාර්ෂික සමුළුවේ ප්‍රගති සමාලෝචනය. 2018.

සුබසිංහ එච්.එම්.පී.ඒ. සහ ආරියතිලක ඩී. ජී. එස්. එස්. "ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා අපනයන කෘෂි බෝග නිෂ්පාදනය හා අනුවර්තන ක්‍රමෝපායන් මත ඇති වූ දේශගුණික වෙනස්වීම්: වත්මන් තත්වය සමාලෝචනය කිරීම." දේශගුණික විපර්යාස අනුවර්තනයන් පිළිබඳ පර්යේෂණ කියාකාරකම් පිළිබඳ වැඩමුළුව (බී. මාරබේ), 49.57 පි. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලය, කොළඹ. 2018.

ආර්.ඩබ්.අයි.බී ප්‍රියදර්ශන හා එච්.එම්.පී.ඒ. සුබසිංහ විවිධ ජල සම්පාදන මට්ටම් ගම්මිරිස් *(Piper nigrum* L.) වල මල් ආරම්භ කිරීම සහ අස්වනු ගුණාංග වෙනස් කිරීම මත ඇතිකරවන බලපෑම.. ශ්‍රී ලංකා උෆ වෙල්ලස්ස විශ්ව විද්යාලයේ වාර්ෂික සමුළුවේ ප්‍රගති සමාලෝචනය.2018

වීරවර්ධන ටී. බණ්ඩාර (2018), පාංශු දිලිරක මුලවල බිජාණු ගණත්වය දිලීර ආසාදිත මුල්වල රූප විදියාත්මක වෙනස්කම් අද්දියනය (*Piper nigrum* L. මානෘකාව:: SLCARP ජාත්යන්තර පර්යේෂණ සම්මන්ත්රණය 2018, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ සභාව, අගෝස්තු 13, 14, 2018, කොළඹ, ශ්‍රී ලංකාව, පිටුව 83

වීරවර්ධන ටී. බණ්ඩාර (2018), මානලේ ගම්මිරිස් වගාවන්හි මුල් ආසන්නයේ සිටින පාංශු ජීවීන් අද්‍යනය, කෘෂි සහ පරිසර පිළිබඳ අටවන ජාත්යන්තර සමුළුව (ISAE-2018): කුළු බඩු සැසිය, ජනවාරි 2018, කොළඹ, පිටුව 24

ඉඩමෙකෝරාල පී.ආර්., ඒ.පී. හීන්කෙන්ද, එච්.ඩී.ඒ.කේ. ගුණරත්න, ඩබ්ලිව් බණ්ඩාර (2018): රත්නපුර දිස්ත්රික්කයේ තෝරාගත් ගොවිබිම් වල කළු ගම්මිරිස් (*Piper nigrum* L. පාංශු සහ පටක පෝෂක තත්ත්වය. කෘෂිකර්ම බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්රණය 18-19 ඔක්තෝබර් 2018, පේරාදෙණිය, ශ්‍රී ලංකාව: පිටු 8-13

ගුණරත්න, එච්.ඩී.ඒ.කේ., පී.ආර්.ඉඩමෙකෝරාල , ටී. වීරවර්ධන සහ ඩබ්ලිව් බණ්ඩාර මලුවල වගාකරන ලද ඉඟුරුවල (*Zingiber officinale* Rosc.) වර්ධන සහ අස්වැන්න අදයනය කිරීම අපනයන කෘෂිකර්ම බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්රණය 18-19 ඔක්තෝබර් 2018, පේරාදෙණිය, ශ්‍රී ලංකාව: පිටු 1-7

ආරියරත්න ,.ඒ.එම්.බී.එච් ,වීරසුරියතෝරාගත් වගා .(2018) ,.කේ.එස්.පී.ටී.ඩබ් ,සහ සෙනරත් .එන්.එස් , *Cinnamomum Schaeff* කරනු ලබන කුරුඳු දර්ශ දෙකක් සහකුරුඳු ගණයට අයත් වල් කුරුඳු විශේෂ හයක රූපිය සහ රසායනික ලක්ෂණ සැසඳීම :DOI .23-pp.11 ,(1)3 . tp://doi.org/10.4038/sljb.v3il.14ht

තරංගා ,.එම්.ජී.එච්.කේ ,සමරවීර ,.එන්.ඩි ,අමරසේකර ,.එස්.ටී.ජී.එම් ,එරන්දිකා ,.ඩි.ඩබ්.කේ ,පත්‍ර ඌණතා ලක්ෂණ අනුව කුරුඳු ,වල ශාක පෝෂක තත්වය හඳුනා ගැනීම (*Cimnnamomum zeylanicum*) අපනයන කෘෂි බ - 2018ෝග පිලිබඳ වාර්ෂික සමුළු වාර්තාව 2018 .(මාරඹේ .බී :සංස්කරණය) ඔක්තෝම්බර් ,19-18පේරාදෙණියව,, ශ්‍රී ලංකාව.

විජේවීර,.ඒ.ඒ , විදානපතිරණ ,.යූ.සී ,ජයසිංහ ,.ජී.ජී ,විජේසිංහ ,.ජී.ජී.කේ ,මාතර දිස්ත්‍රික්කය තුල මූලික පිරිසැකසුපිරිසැකසුම් ක්‍රියාවලියෙන් පසු අගය දාමයේ ස්ථර අතර කුරුඳු කුරු වල ගුණාත්ම පරාමිතීන්ගේ විචලනය.ASEAC),2018) අපනයන කෘෂි බෝග පිලිබඳ වාර්ෂික සමුළුව ,

ප්‍රියදර්ශනී, කේ.ඩි.එන්, සිල්වා එස් .අයි සී සහ රණසිංහ, ආර්.ඒ.ඩි.ආර්.ඒ. "අපනයන තත්ත්වයේ බුලත් කොළ අස්වැන්න මත විවිධ කොළ පොහොර සහ ගොම පොහොර වල බලපෑම සෙවීම". **(2018).**අපනයන කෘෂිකර්ම බෝග සඳහා වන වාර්ෂික සමුළුව.**18-19** ඔක්තෝම්බර් **2018 .**පේරාදෙණිය . ශ්‍රී ලංකා .පිටුව **37.**

ප්‍රියදර්ශනී, කේ.ඩි.එන්, සිල්වා එස් .අයි සී සහ රූපසිංහ කේ.ඒ.එස්.ඒ. "සාමාන්‍ය ගම්මිරිස් සහ පදුරු ගම්මිරිස් වල අස්වැන්න සංසන්දනය කිරීම" . **(2018).**අපනයන කෘෂිකරිම බෝග සඳහා වන වාර්ෂික සමුළුව.**18-19** ඔක්තෝම්බර් **2018 .**පේරාදෙණිය . ශ්‍රී ලංකා .පිටුව **135.**

ජයසිංහ ජී. ජී., සේනාරත්න, ජී., හේමවන්ද්‍ර, කේ. එස්., විජේසිංහ, කේ.ජී. ජී. සහ වැලිගමගේ එස්. (2018) "ශ්‍රී ලංකාවේ කුරුඳු ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා සාධනීය ශෂ්‍ය විද්‍යාත්මක පැකේජයක් සූත්‍රකරණය කිරීම" අපනයන කෘෂිකර්ම බෝග සඳහා වන වාර්ෂික සමුළුව.**18-19** ඔක්තෝම්බර් **2018 .**පේරාදෙණිය . ශ්‍රී ලංකා .වෙළුම 5,පිටුව 85-98.

ජයසිංහ ජී. ජී, කුමාර, කේ. එල්. ඩබ්., සඳමාලි, එස්. ඒ. ඒ. ඩබ්., මැද්දේගොඩ, සී. සහ තරංග කේ. එච්. ජී. එම්. (2018) කුරුඳු පොත්ත රළුවීමේ රෝගය වර්ධනය වීමේදී කුරුඳුවල සිදුවන පෝෂණිය හා

භෞතරසායන වෙනස්වීම් :සංස්කරණය)නිරන්ජන් සහ පිරිස.(අන්තර්ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැසිය. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව 13- 14 අගෝස්තු 2018, කොළඹ, ශ්‍රී ජංකා පිටුව 32.

එච්.බී.එම්.ඒ. ආරියරත්න, එස්. එන්. වීරසූරිය, ඩබ්ලිව්.ටී.පී.එස්.කේ. සෙනරත්, කුරුඳු විශේෂයේ තෝරාගත් ප්‍රභේධ දෙක සහ වල දර්ශ හයක රූපවිද්‍යාත්මක හා රසායනික ලක්ෂණ වල සැසඳීම, ශ්‍රී ලංකා ජීව විද්‍යා ජර්නලය, 2018.

ටී.අයි. එන්. ද සිල්වා, ඩී. එන්. සමරවීර, ජී.ඒ. එස්. ගිනිගද්දර , කේ.එච්.ජී.එම්.තරංගා , ඒ.එන්. කොඩිතුවක්කු, කුරුඳු වගාකරන් පසෙහි ග්ලිරිසිඩියා (*Gliricidia sepium*) සහ මල් රටකජු (*Arachis pintoi*) වලින් ඇති බලපෑම.

ඩබ්ලිව්. ජී.එම්. දිලානි, ඒ. ඒ. විජේවීර, එච්.ඒ.එස්.එල්. ජයසිංහ, පී. ඩබ්ලිව්. ජීවන්ති, මාතර දිස්තික්කයේ මූලික පිරිසැකසුමෙන් පසු අගය දාමයේ ස්ථර අතර කුරුඳු කුරු වල ගුණාත්ම පරාමිතීන් පිළිබඳව විශ්ලේෂණය, ජාත්‍යන්තර කෘෂි පර්යේෂණ සමුළුව 2018, උෆව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා.

චන්ද්‍රරත්න, ඩබ්. එම්.,සුභසිංහ එච්. එම්. පී. ඒ., (2018), "අපනයන තත්වයේ බුලත් කොළ නිෂ්පාදනය සඳහා විවිධ ක්ෂේත්‍ර ස්ථාපන ක්‍රම අත්හදා බැලීම" අපනයන කෘෂිකර්ම බෝග සඳහා වන වාර්ෂික සමුළුව.**18-19** ඔක්තෝම්බර් **2018 .**පේරාදෙණිය . ශ්‍රී ලංකා .පිටුව **1**07-112 වෙළුම 5.

දිසානායක් ඩී. එම්. පී. වී., ප්‍රියදර්ශනී, කේ. ඩී. එන්., ධර්මපරාක්‍රම ඒ. එල්. එස්., පෙරේරා එච්. ඒ. වී. එස්., (2018) "ශ්‍රී ලංකාවේ පහතරට අන්තර්මධ්‍ය කළාපයේ ඉහුරු වගාවේ වල් මර්ධනය හා අස්වැන්න වැඩිකිරීම සඳහා විවිධ අතුරුණු වල බලපෑම" අපනයන කෘෂිකර්ම බෝග සඳහා වන වාර්ෂික සමුළුව.**18-19** ඔක්තෝම්බර් **2018 .**පේරාදෙණිය . ශ්‍රී ලංකා .පිටුව 121-125 වෙළුම 5.

ඩී.සිල්වා ටී. අයි. එන්., සමරවීර ඩී. එන්., ගිනිගද්දර ජී. ඒ.එස්., තරංහා කේ. එච්. ජී. එම්., කොඩිතුවක්කු ඒ. එන්., "කුරුඳු වගාකිරීමේ පස සඳහා ග්ලිරිසිඩියා සහ ඇරකිස් විශේෂ වල බලපෑම" 10 වැනි වාර්ශික සමුළුව-2018. කෘෂිකර්ම විද්‍යාපීඨය, ශ්‍රී ලංකාව

ඇමුණුම I : අපනයන කෘෂි බෝග වල වගා වපසරිය දිස්ත්‍රික්ක මට්ටමින් - 2018*

දිස්ත්‍රික්කය	කුරුඳු	ගම්මිරිස්	කරාබු	එනසාල්	කෝපි	කොකෝවා	සාදික්කා	පුවක්	බුලත්	පැණිරි	එකතුව (EAC)	ඉහුරු	කහ	එකතුව (ඉහුරු සහ කහ ඇතුලත්ව)
කොළඹ	208	282	47	1	38	1	8	12	18		616	81	7	704
ගම්පහ	291	1,227	210	8	182	13	27	802	276		3,037	295	89	3,421
කළුතර	2,505	551	97	1	92	16	12	499	24		3,797	142	45	3,984
මහනුවර	186	4,988	3,207	597	1,067	182	1,909	1,173	5		13,314	337	254	13,904
මාතලේ	353	5,736	783	350	470	607	358	814	9		9,480	37	32	9,549
නුවරඑළිය	58	1,379	402	210	632	7	8	374	3		3,074	134	145	3,353
ගාල්ල	11,805	671	107	13	97	40	12	475	32		13,253	43	27	13,323
මාතර	9,258	832	387	38	169	33	14	911	10		11,651	88	64	11,804
හම්බන්තොට	3,281	2,048	86	1	85	14	6	464	8	851	6,847	17	9	6,873
යාපනය			1					186	11		198			198
මන්නාරම								7	4		10			10
වවුනියාව		1						73	2		75			75
මුලතිවු		1						63	3		68			68
කිලිනොච්චි								44	2		47			47
මඩකළපුව		2						14	56		71			71
අම්පාර	25	201	2	5	19	8	2	206	7		474	12	32	518
ත්‍රිකුණාමලය	6	61	1		1		2	38	34		143			143
කුරුණෑගල	272	2,960	323	15	459	127	180	1,278	731		6,344	378	85	6,807
පුත්තලම	16	108	2		32	1		57	101		317	56	1	375
අනුරාධපුරය	36	195	1		17	26		282	30		586	8	2	596
පොළොන්නරුව	6	189	1		11	4		152	21		383	18	14	416
බදුල්ල	479	5,729	77	4	367	58	7	1,006	6	10	7,742	97	59	7,898
මොණරාගල	167	4,884	11	4	137	555	3	754	13		6,527	6	3	6,536
රත්නපුරය	4,285	6,566	348	215	221	42	27	1,767	20	564	14,054	98	50	14,202
කෑගල්ල	351	1,634	1,865	261	445	70	212	1,082	37		5,956	150	137	6,243
ශ්‍රී ලංකාව	33,589	40,244	7,956	1,722	4,542	1,805	2,788	12,533	1,462	1,425	108,065	1,999	1,056	111,120

මූලාශ්‍රය: ආර්ථික දත්ත. 2014, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

* යාවකාලික

ඇමුණුම II: අපනයන කෘෂි බෝග වල අපනයන පරිමාව සහ අගය – 2017 සහ 2018

නිෂ්පාදනය	ඒකකය	2017	2018 *	වර්ධනය % 2017-2018
කුරුඳු	පරිමාව (මෙ.ටො.)	16,617.04	17,536.51	5.5
	අගය (රු.මි.)	30,872.79	34,852.88	12.9
කුරුඳු කොළ තෙල්	පරිමාව (මෙ.ටො.)	309.01	280.87	-9.1
	අගය (රු.මි.)	976.45	812.66	-16.8
කුරුඳු පොතු තෙල්	පරිමාව (මෙ.ටො.)	40.50	42.79	5.6
	අගය (රු.මි.)	1,492.63	1,649.96	10.5
කරාබු	පරිමාව (මෙ.ටො.)	5,809.89	1,485.15	-74.4
	අගය (රු.මි.)	6,761.46	2,174.69	-67.8
කරාබු නැටි	පරිමාව (මෙ.ටො.)	1,995.70	1,794.09	-10.1
	අගය (රු.මි.)	400.43	404.79	1.1
කරාබු තෙල්	පරිමාව (මෙ.ටො.)	9.41	10.66	13.3
	අගය (රු.මි.)	84.83	130.86	54.3
කොකෝ සහ කොකෝ නිෂ්පාදන	පරිමාව (මෙ.ටො.)	2,583.36	2,324.68	-10.0
	අගය (රු.මි.)	2,339.48	1,205.45	-48.5
කෝපි	පරිමාව (මෙ.ටො.)	13.79	23.60	71.1
	අගය (රු.මි.)	29.26	46.58	59.2
ගම්මිරිස්	පරිමාව (මෙ.ටො.)	13,309.08	13,118.10	-1.4
	අගය (රු.මි.)	12,767.97	12,074.02	-5.4
ගම්මිරිස් තෙල්	පරිමාව (මෙ.ටො.)	48.96	66.51	35.8
	අගය (රු.මි.)	484.42	308.98	-36.2
ඔලියරොසීන්	පරිමාව (මෙ.ටො.)	382.24	360.00	-5.8
	අගය (රු.මි.)	2,742.72	2,064.59	-24.7
කරඳමුංගු	පරිමාව (මෙ.ටො.)	839.17	108.31	-87.1
	අගය (රු.මි.)	870.52	156.33	-82.0
කරඳමුංගු තෙල්	පරිමාව (මෙ.ටො.)	0.42	0.22	-47.6
	අගය (රු.මි.)	22.11	12.51	-43.4
පැහිරි	පරිමාව (මෙ.ටො.)	38.02	40.88	7.5
	අගය (රු.මි.)	263.15	177.33	-32.6
සාදික්කා	පරිමාව (මෙ.ටො.)	1,691.71	1,657.56	-2.0
	අගය (රු.මි.)	1,562.11	1,671.38	7.0
සාදික්කා තෙල්	පරිමාව (මෙ.ටො.)	65.45	51.50	-21.3
	අගය (රු.මි.)	424.43	344.53	-18.8
වසාවාසි	පරිමාව (මෙ.ටො.)	351.15	280.80	-20.0
	අගය (රු.මි.)	636.48	600.61	-5.6
වසාවාසි තෙල්	පරිමාව (මෙ.ටො.)	0.04	0.03	-25.0
	අගය (රු.මි.)	0.58	0.24	-58.6
පුවක්	පරිමාව (මෙ.ටො.)	10,645.28	4,947.29	-53.5
	අගය (රු.මි.)	5,744.48	2,864.19	-50.1
බුලත්	පරිමාව (මෙ.ටො.)	5,144.92	4,009.01	-22.1
	අගය (රු.මි.)	3,164.08	2,615.72	-17.3
වැනිලා	පරිමාව (මෙ.ටො.)	5.99	1.56	-73.9
	අගය (රු.මි.)	27.06	63.22	133.6
වැනිලා තෙල්	පරිමාව (මෙ.ටො.)	0.23	6.28	2,628.3
	අගය (රු.මි.)	0.40	18.50	4,525.0
සේර තෙල්	පරිමාව (මෙ.ටො.)	0.98	5.39	449.8
	අගය (රු.මි.)	5.00	28.59	471.8
මුළු අපනයන කෘෂි බෝග	පරිමාව (මෙ.ටො.)	59,902.34	48,151.76	-19.62
	අගය (රු.මි.)	71,672.84	64,278.59	-10.32
ඉඟුරු	පරිමාව (මෙ.ටො.)	81.59	97.17	19.1
	අගය (රු.මි.)	93.83	121.96	30.0
ඉඟුරු තෙල්	පරිමාව (මෙ.ටො.)	4.18	6.53	56.2
	අගය (රු.මි.)	100.37	87.29	-13.0
කහ	පරිමාව (මෙ.ටො.)	114.88	76.36	-33.5
	අගය (රු.මි.)	103.12	102.67	-0.4
එකතුව (ඉඟුරු සහ කහ)	පරිමාව (මෙ.ටො.)	200.65	180.06	-10.3
	අගය (රු.මි.)	297.32	311.92	4.9
මුළු එකතුව (ඉඟුරු සහ කහ ඇතුළත්ව)	පරිමාව (මෙ.ටො.)	60,102.99	48,331.82	-19.58
	අගය (රු.මි.)	71,970.16	64,590.51	-10.25

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

* අගයන් තාවකාලික වේ

ඇමුණුම III: 2016/2018 වර්ෂයන්හි අපනයන කෘෂි බෝගයන්හි සාමාන්‍ය මිල ගණන් (රු./කි.ග්‍රෑ.)

බෝගය	මිල	වාර්ෂික සාමාන්‍ය මිල			වර්ධනය % 2017/18
		2016	2017	2018	
කොකෝවා	ගො.මි.	297.47	309.81	302.77	-2.27
	වෙ.මි.	403.58	418.52	467.55	11.71
	ලෝ.මි.	491.66	365.35	421.10	15.26
කෝපි	ගො.මි.	362.65	463.93	489.53	5.52
	වෙ.මි.	414.32	343.80	677.29	97.00
	ලෝ.මි.	415.88	425.19	393.10	-7.55
ගම්මිරිස්	ගො.මි.	1,246.23	831.90	585.84	-29.58
	වෙ.මි.	1,308.72	904.32	631.19	-30.20
	ලෝ.මි.	1,609.09	1,347.46	995.72	-26.10
කරාබු	ගො.මි.	1,053.14	975.38	1,071.39	9.84
	වෙ.මි.	1246.63	1,145.02	1,296.48	13.23
	ලෝ.මි.	1,220.53	1,366.09	1,263.68	-7.50
කුරුඳු කුරු	ගො.මි.	1,544.58	1,846.13	2,018.70	9.35
	වෙ.මි.	1,805.51	1,834.66	2,495.09	36.00
	ලෝ.මි.			2374.73	
සාදික්කා	ගො.මි.	522.88	460.00	428.51	-6.85
	වෙ.මි.	562.5	547.40	501.74	-8.34
	ලෝ.මි.	1,567.80	1,555.31	1,364.67	-12.26
වසාවාසි	ගො.මි.	1,478.08	1,324.68	1,495.23	12.87
	වෙ.මි.	1,743.07	2,045.83	1,670.83	-18.33
	ලෝ.මි.	1,986.27	2,044.76	2,207.13	7.94
කරඳමුංගු	ගො.මි.	1,638.50	2,502.47	2,778.36	11.02
	වෙ.මි.	1,967.55	1,758.89	2,618.11	48.85
	ලෝ.මි.	1,331.15	2,394.56	3,180.52	32.82
බුලත් (රු./1000 කොළ)	ගො.මි.	4,151.63	1,855.26	3,728.65	100.98
	වෙ.මි.				
	ලෝ.මි.				
පුවක්	ගො.මි.	294.90	294.75	295.68	0.32
	වෙ.මි.	394.55	304.17	292.62	-3.80
	ලෝ.මි.				
පැහිරි	ගො.මි.	9,668.99	3,745.18	2,788.78	-25.54
	වෙ.මි.	10,500.00	8,750.00		
	ලෝ.මි.	2,457.29	2,974.94	4,679.04	57.28
අමු ඉහුරු	ගො.මි.	127.12	425.67	349.09	-17.99
	වෙ.මි.	90.00	75.00		
	ලෝ.මි.	421.53	337.06		
අමු කහ	ගො.මි.	43.18	65.38	52.08	-20.34
	වෙ.මි.	32.5	27.08		
	ලෝ.මි.				

මූලාශ්‍ර: ERU data base ගො.මි.: ගොවිපළ මට්ටමේ මිල; වෙ.මි.: වෙන්දේසි මිල; ලෝ.මි.: ලෝක වෙළඳපලේ මිල

ඇමුණුම IV: අපනයන කෘෂි බෝගයන්හි ආනයන පරිමාව සහ වටිනාකම – 2017 සහ 2018

නිෂ්පාදනය	ඒකකය	2017	2018 *	වර්ධනය % 2017-2018
කුරුඳු	පරිමාව (මෙ.ටො.)	61.64	112.52	82.5
	අගය (රු.මි.)	87.70	187.26	113.5
කුරුඳු කොළ තෙල්	පරිමාව (මෙ.ටො.)	0.10		
	අගය (රු.මි.)	0.04		
කුරුඳු පොතු තෙල්	පරිමාව (මෙ.ටො.)	0.16	0.80	398.1
	අගය (රු.මි.)	3.81	8.56	124.7
කරාබු	පරිමාව (මෙ.ටො.)	9.51	11.62	22.2
	අගය (රු.මි.)	11.32	16.02	41.5
කරාබු නැටි	පරිමාව (මෙ.ටො.)	14.01		
	අගය (රු.මි.)	1.87		
කරාබු තෙල්	පරිමාව (මෙ.ටො.)	3.15	2.09	-33.7
	අගය (රු.මි.)	11.71	9.73	-16.9
කොකෝ සහ කොකෝ නිෂ්පාදන	පරිමාව (මෙ.ටො.)	4,828.04	4,866.51	0.8
	අගය (රු.මි.)	3,557.86	3,425.04	-3.7
කෝපි	පරිමාව (මෙ.ටො.)	75.04	95.71	27.5
	අගය (රු.මි.)	88.54	129.52	46.3
ගම්මිරිස්	පරිමාව (මෙ.ටො.)	1,398.08	3,179.05	127.4
	අගය (රු.මි.)	1,231.30	1,931.97	56.9
ගම්මිරිස් තෙල්	පරිමාව (මෙ.ටො.)	0.99	0.36	-63.9
	අගය (රු.මි.)	0.07	0.05	-28.6
ඔලියරොසින්	පරිමාව (මෙ.ටො.)	1.69	2.66	57.5
	අගය (රු.මි.)	8.08	16.32	102.0
කරඳමුංගු	පරිමාව (මෙ.ටො.)	321.88	34.03	-89.4
	අගය (රු.මි.)	334.42	81.90	-75.5
කරඳමුංගු තෙල්	පරිමාව (මෙ.ටො.)	2.20		
	අගය (රු.මි.)	12.51		
පැහිරි	පරිමාව (මෙ.ටො.)	2.45	16.08	556.5
	අගය (රු.මි.)	5.87	29.06	395.1
සාදික්කා	පරිමාව (මෙ.ටො.)	10.23	0.29	-97.2
	අගය (රු.මි.)	8.40	0.07	-99.2
සාදික්කා තෙල්	පරිමාව (මෙ.ටො.)			
	අගය (රු.මි.)			
වසාවාසි	පරිමාව (මෙ.ටො.)		0.02	
	අගය (රු.මි.)		0.01	
වසාවාසි තෙල්	පරිමාව (මෙ.ටො.)		0.01	
	අගය (රු.මි.)		0.02	
පුවක්	පරිමාව (මෙ.ටො.)	242.34	211.62	-12.7
	අගය (රු.මි.)	73.16	87.48	19.6
බුලත්	පරිමාව (මෙ.ටො.)		0.75	
	අගය (රු.මි.)		0.71	
වැනිලා	පරිමාව (මෙ.ටො.)	5.27	4.75	-9.9
	අගය (රු.මි.)	5.40	7.97	47.6
වැනිලා තෙල්	පරිමාව (මෙ.ටො.)	0.65	2.06	216.9
	අගය (රු.මි.)	0.95	2.91	206.3
සේර තෙල්	පරිමාව (මෙ.ටො.)	0.96	0.49	-49.0
	අගය (රු.මි.)	2.55	2.18	-14.5
මුළු අපනයන කෘෂි බෝග	**පරිමාව (මෙ.ටො.)**	6,978.39	8,541.42	22.40
	අගය (රු.මි.)	5,445.56	5,936.78	9.02
ඉහුරු	පරිමාව (මෙ.ටො.)	1,731.53	1,395.38	-19.4
	අගය (රු.මි.)	259.82	276.97	6.6
ඉහුරු තෙල්	පරිමාව (මෙ.ටො.)	1.67	0.16	-90.4
	අගය (රු.මි.)	17.19	2.28	-86.7
කහ	පරිමාව (මෙ.ටො.)	4,958.32	5,386.72	8.6
	අගය (රු.මි.)	1,046.87	1,158.48	10.7
එකතුව (ඉහුරු සහ කහ)	පරිමාව (මෙ.ටො.)	6,691.52	6,782.26	1.4
	අගය (රු.මි.)	1,323.88	1,437.73	8.6
මුළු එකතුව (ඉහුරු සහ කහ ඇතුළත්ව)	**පරිමාව (මෙ.ටො.)**	13,669.91	15,323.68	12.10
	අගය (රු.මි.)	6,769.44	7,374.51	8.94

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

* අගයන් තාවකාලික වේ

ඇමුණුම V: ව්‍යාප්ති නිලධාරින් ස්ථානගත කිරීම

ගාල්ල	ව්‍යාප්ති නිලධාරි කොට්ඨාසය
	අලුත්වෙල
	හිනිදුම
	හබරාදූව
	අම්බලන්ගොඩ
	බලපිටිය
	අක්මීමන
	ඇත්කඳුර
	ඇල්පිටිය
	කරන්දෙණිය
	බද්දේගම
	නියගම
	හික්කඩුව
	යක්කළමුල්ල
	නාගොඩ

හම්බන්තොට	ව්‍යාප්ති නිලධාරි කොට්ඨාසය
	ඕකේවෙල
	බෙලිඅත්ත
	මිද්දෙණිය
	කටුවන
	වලස්මුල්ල
	සූරියවැව
	වීරකැටිය
	වරාපිටිය
	තංගල්ල

නුවරඑළිය	ව්‍යාප්ති නිලධාරි කොට්ඨාසය
	ගිනිගත්හේන
	හෙල්බොඩ
	හඟුරන්කෙත
	වලපනේ
	රිකිල්ලගස්කඩ
	මල්දෙණිය

ගම්පහ	ව්‍යාප්ති නිලධාරි කොට්ඨාසය
	දොම්පේ
	උඩුගම්පළ
	ගම්පහ
	මහර
	බඩල්ගම
	පල්ලෙවෙල
	බියගම
	මීරිගම
	දිවුලපිටිය
	මිනුවන්ගොඩ
	අත්තනගල්ල

මහනුවර	ව්‍යාප්ති නිලධාරි කොට්ඨාසය
	ගලගෙදර
	උඩුනුවර
	කුරුඳුවත්ත
	හාරිස්පත්තුව
	පූජාපිටිය
	උඩදුම්බර
	රඹුක්පිටිය
	යටිනුවර
	වත්තේගම
	කුණ්ඩසාලේ
	හතරලියද්ද
	අලවතුගොඩ
	මැදපිටිය
	ගඟවට කෝරලේ
	උඩපළාත
	තෙල්දෙණිය
	තලාතුඔය
	ගලහ
	මීණිපේ

රත්නපුර	ව්‍යාප්ති නිලධාරි කොට්ඨාසය
	වැලිගෙපොල
	කොළොන්න
	අයගම
	ගොඩකවෙල
	පැල්මඩුල්ල
	බලංගොඩ
	රත්නපුර
	ඇඹිලිපිටිය
	නිවිතිගල
	කෑල්ල
	ඇළපාත
	පොතුපිටිය

මොණරාගල	ව්‍යාප්ති නිලධාරි කොට්ඨාසය
	බිබිලේ
	මොණරාගල
	බඩල්කුඹුර
	මඩුල්ල
	හිඟුරුකඩුව
	මැදගම
	පදියතලාව
	වැල්ලවාය
	මීගහයාය
	කොටගම

කෑගල්ල	ව්‍යාප්ති නිලධාරී කොට්ඨාසය
	මාවනැල්ල
	උස්සාපිටිය
	පින්නවල
	කෑගල්ල
	වරකාපොළ
	දැරණියගල
	දැදිගම
	අරණායක
	රුවන්වැල්ල
	යටියන්තොට
	බුලත්කොහුපිටිය
	ගලිගමුව
	රඹුක්කන

කොළඹ	ව්‍යාප්ති නිලධාරී කොට්ඨාසය
	අවිස්සාවේල්ල
	හෝමාගම
	පාදුක්ක

කුරුණෑගල	ව්‍යාප්ති නිලධාරී කොට්ඨාසය
	පොල්ගහවෙල
	දොඩම්ගස්ලන්ද
	මාවතගම
	රම්බඩගල්ල
	පොල්පිතිගම
	කරඳගොල්ල
	මැල්සිරිපුර
	දඹදෙණිය
	කටුගම්පළ
	උඩුබද්දාව
	වාරියපොළ
	කුලියාපිටිය
	පඬුවස්නුවර
	මාදම්පේ
	නාත්තන්ඩිය
	පුත්තලම


බදුල්ල	ව්‍යාප්ති නිලධාරී කොට්ඨාසය
	බදුල්ල
	හල්දුම්මුල්ල
	නිකපොත
	ඌවපරණගම
	පස්සර
	රිදීමාලියද්ද
	හාලිඇළ
	මීගහකිවුල
	කන්දකැටිය
	බණ්ඩාරවෙල

මාතර	ව්‍යාප්ති නිලධාරී කොට්ඨාසය
	දෙනියාය
	අකුරැස්ස
	පස්ගොඩ
	හක්මන
	වැලිගම
	දෙවිනුවර
	දෙයියන්දර
	කඹුරුපිටිය
	මාතර
	පිටබැද්දර

කළුතර	ව්‍යාප්ති නිලධාරී කොට්ඨාසය
	මාදුරාවල
	බණ්ඩාරගම
	කළුතර
	මතුගම
	ඉත්තැපාන
	බදුරළිය
	බේරුවල
	හොරණ
	බුලත්සිංහල
	පැළවත්ත
	අගලවත්ත

මාතලේ	ව්‍යාප්ති නිලධාරී කොට්ඨාසය
	පලාපත්වල
	උකුවෙල
	තැන්න
	රත්තොට
	වේරගම
	යටවත්ත
	පල්ලේපොළ
	වහකෝට්ටේ
	අලුගොල්ල

සංවිධාන සැලැස්ම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - 2018



නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ, **ස.අ.** - සහකාර අධ්‍යක්ෂ,,**ව්‍යා.උ.ඒ**- **ව්‍යාපාර උපදේශන ඒකකය.** - පැළැටි සංරක්ෂණය, **ම.ප.ම.**-මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, **උ.ප.ම.** -උප පර්යේෂණ මධ්‍යස්ථානය,**ආ.ප.ඒ.**- ආර්ථික පර්යේෂණ ඒකකය,**සං.ලේ.** -සංඛ්‍යාලේඛනඥ, **පරි.නි.** - පරිපාලන නිලධාරී, **භාෂා පරි.**- භාෂා පරිවර්තක,තො.හා.සං.තා.නි - ඝන්නිවේදන හා තොරතුරු තාක්ෂණ නි. හා **පර්.සං.ස**- පර්යේෂණ හා සංවර්ධන සහකාර, , **අය.සහ.**- අයවැය සහකාර, **සං.නි.** - සංවර්ධන නිලධාරී,, **ප්‍ර.තා.නි.**-ප්‍රධාන තාක්ෂණ නිලධාරී, **කළ.ස.**- කළමනාකරණ සහකාර, **පුස්ත.**- පුස්තකාලාධිපති, **ව්‍යා.නි.(වී)** - ව්‍යාජ්ති නිලධාරී (විශේෂ), **ව්‍යා.නි.**- ව්‍යාජ්ති නිලධාරී, **කා.නි** - කාර්මික නිලධාරී **තා.නි.**- තාක්ෂණ නිලධාරී,**කා.නි** - කාර්මික නිලධාරී**සං.තා.සහ.** - ඝන්නිවේදන තාක්ෂණ සහකාර,**ගො.ක.** - ගොවිපළ කළමනාකරු,**ගො.සේ.ස.**- ගොවිපළ සේවා සහකාර, **නි.පා.** - නිවාස පාලක.

ගණන්දීමේ නිලධාරී
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි මස 28 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත.

වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව, මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 7 (vi) ඡේදය පරිදි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව රු.104,719,508 ක ශේෂයට අක්මුදල් ගැලපීම් ගිණුමක් නිවැරදිව සකස් කර නොතිබුණි.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු අනාවරණය විය.

(අ) මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශනය අනුව තැන්පතු ලැබීම්වල වටිනාකම රු.36,899,162 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව එම ශේෂය රු.37,725,353 ක් වූ බැවින් රු.826,191ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි මුදලින් ලද අත්තිකාරම් ලැබීම් ලෙස රු.587,455 ක් දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව එම ශේෂය රු.31,555,342 ක් වූ බැවින් රු.30,967,887ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ වෙනත් ලැබීම් ලෙස රු.79,643,440 ක් දක්වා තිබුණද මාසික ගිණුම් සාරාංශය අනුව ශුද්ධ ආදායම රු.113,074,077 ක් වූ බැවින් රු.33,430,637 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වාර්තාව හා තැන්පත් ලේඛනවල ආරම්භක ශේෂ අතර රු.31,599 ක වෙනස්කම් පැවතුණි.

1.6.3 දේපල පිරියත හා උපකරණ

පහත විගණන නිරීක්ෂණයන් අනාවරණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනයේ රු.281,472,925 ක ස්ථාවර වත්කම් පෙන්නුම් කළද, ස්ථාවර වත්කම් වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකෙරුනි.

(ආ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ආරම්භක ශේෂය අතර රු.222,261,420 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් වටිනාකම රු. 21,851,383 ක් වුවද මාසික ගිණුම් සාරාංශයේ මිලදී ගැනීම් ලෙස රු.14,165,029 ක ශේෂයක් දක්වා තිබුණි.

(ඈ) මාසික ගිණුම් සාරාංශය අනුව රු.916,275 ක වත්කම් අපහරණයක් දක්වා තිබුණද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි අපහරණ අගයක් දක්වා නොතිබුණි.

1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මියගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් හා සේවකයන් 11 දෙනෙකුගෙන් 2013 වර්ෂයේ සිට අයවිය යුතු රු.429,818 ක ණය මුදලක් දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2001 වර්ෂයේ සිට පැවත එන නිලධාරීන් දෙදෙනෙකුට අදාළව පිළිවෙලින් රු.232,965ක දේපල ණය ශේෂයක් ද, එකතුව රු. 330,585 ක උත්සව, විශේෂ, ආපදා, හා දේපල ණය ශේෂයක් ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවකයෙකුගෙන් අයවිය යුතු රු.178,570 ක වෙනත් ණය ශේෂ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණු අතර, හඳුනා නොගත් රු.2,500 ක ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි රු. 79,643,440 ක් වූ ආදායම් නොවන වෙනත් ලැබීම් හා රු.1,086,631,057 ක් වූ ආදායම් නොවන ලැබීම් උපලේඛන ලබානොදීම නිසා නිරවද්‍යතාවය පැහැදිලි කර ගැනීමට නොහැකි විය.

1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ලේඛන වර්ගය		අදාල රෙගුලාසිය	නිරීක්ෂණ
(i)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය.	යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ii)	විදුලි උපකරණ පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය.	ලේඛනයක් පවත්වා නොතිබුණි.
(iii)	බැරකම් පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය.	යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(iv)	වාහන ලැයිස්තු ගතකිරීමේ ලේඛනය	දෙපාර්තමේන්තුව සතුව වාහන 96 ක් පැවතුණද මුදල් රෙගුලාසි 1647(ඊ) ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගත යුතුය.	ලේඛනයක් පවත්වා නොතිබුණි.

(v)	ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතුය.	ලේඛනයක් පවත්වා නොතිබුණි.

2 - මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අග්‍රිම සැලැසුම් කිරීම, අග්‍රිම ඉල්ලුම් කිරීම, අග්‍රිම උපයෝජනය හා සමාලෝචිත වර්ෂය අවසාන ශේෂය සම්බන්ධයෙන් අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වෙනත් දෙපාර්තමේන්තු වියදම් වෙනුවෙන් සියයට 361 ක් ලෙස තාත්ත්වික නොවන ආකාරයට අග්‍රිම ප්‍රතිපාදන සංශෝධනය කර තිබුණි.

(ආ) නිරවුල් කළ යුතුව පවතින බිල්පත් පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් කරන ලද මාසික අක් මුදල් අයදුම් පත්‍රයට අමුණා ඉදිරිපත් කර නොතිබුණි.

2.2 වියදම් කළමනාකරණය

වැය විෂයයන් 14 ක් වෙනුවෙන් වෙන්කර තිබුණු එකතුව රු.536,390,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.6.757,050 ක් හෙවත් සියයට 5 සිට සියයට 76 දක්වා පරාසයක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරිකර තිබුණි.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

මුදල් රෙගුලාසි 94 (2) හි විධිවිධානවලින් බැහැරව දෙපාර්තමේන්තුව විසින් මූලධන වැය විෂයයන් 05 කට අදාළව එකතුව රු. 24,216,161 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹී තිබුණි.

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ ව්‍යාපෘති වෙනුවෙන් රු. 15,670,339 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද නියමිත පරිදි කාර්යයන් ඉටු නොකර රු. 2,479,498 ක් ආපසු යවා තිබුණි.

2.5 ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතික වීම්

අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳවසමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචන පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) xix පරිච්ඡේදයේ 5.6 උප වගන්තිය	නිල නිවාස 33 ක නිවාස කුලියේ අයකර ගැනීමේදී ආර්ථික කුලිය පදනම් කර ගැනීමට අදාළව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ii) xix පරිච්ඡේදයේ 6.1.1 උප වගන්තිය	සියලුම රජයේ නිවාසවල බදු කාලය වර්ෂ 05 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 08 ක නිලධාරීන් වර්ෂ 06 සිට වර්ෂ 18 දක්වා කාලයක් රැඳී සිටින බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 138 (8)	වවුවර් සහතික කිරීමට බලය ලත් නිලධාරියා විසින් වවුවරය නිවැරදි සහ / හා සෑම විස්තරයක් අනින්ම සම්පූර්ණ බවට ගණන්දීමේ නිලධාරියා වගකීමකින් තොරව එකතුව රු.521,800 ක් වූ වවුවර් 02 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සහතික කර ගෙවීම් කර තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 570	අර්ධ වර්ෂයක් අවසානයේ ඉකුත් වූ සියලු තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර මෙහෙයුම් වක්‍රලේඛ

(i) 2016 දෙසැම්බර් 01 දිනැති අංක 08/2016 දරන වක්‍රලේඛය	අක් මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිවැරදිව සකස් කර නොතිබුණු අතර කාර්තුමය වියදම් සැලැස්මක්ද පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ii) 2017 නොවැම්බර් 30 දිනැති අංක 05/2017 දරන වක්‍රලේඛයෙහි (3) ඡේදය	සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.1,171,155,000 ප්‍රතිපාදන ලබාදී තිබුණද එම ප්‍රතිපාදන කාර්තු 4 සඳහා වෙන්කර නොතිබුණි.

2.7 අවධිමත් ගනුදෙනු

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (දකුණ) ගිවිසුමේ අත්සන් කළ යුතු ස්ථානයේ අත්සන් කර නොතිබීම, කොන්ත්‍රාත්කරු වෙනුවෙන් සාක්ෂි අත්සන් කර නොතිබීම, ගිවිසුමෙහි කොන්ත්‍රාත්කරු විසින් අත්සන් කර නොතිබීම සහ ගිවිසුමේ 12 වන පරිච්ඡේදයෙහි සඳහන් පරිදි ගිවිසුම අත්සන් කරන ලද දිනය සඳහන් කර නොතිබීම වැනි අඩුපාඩු සහිතව ගිවිසුම්ගත වීම හේතුවෙන් මිද්දෙණිය කෘෂිහෝග උද්‍යානයේ නළ ළිඳක් ඉදිකිරීම වෙනුවෙන් රු.606,855 ක මුදලක් ගෙවා තිබුණි.

2.8 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) විශේෂිත කාර්යයක් සඳහා අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද එකතුව රු.3,724,059 ක් වූ අත්තිකාරම් ශේෂ 121 ක් අදාළ කාර්යය නිමවී, මුදල් අත රඳවා ගනිමින් ප්‍රමාදවී පියවා තිබුණි.

(ආ) අවස්ථා 15 කදී ලබාදුන් එකතුව රු.381,695 ක අත්තිකාරම් මුදල් කිසිදු කාර්යයකට යොදා නොගෙන අත රඳවා-ගෙන සම්පූර්ණ මුදලම ආපසු පියවා තිබුණි.

(ඇ) නිලධාරීන්ට අවස්ථා 35 කදී ලබාදුන් එකතුව රු.1,163,430 ක අත්තිකාරම් මුදලින් රු.671,747 ක් හෙවත් සියයට 40 සිට සියයට 95.08 ක පරාසයකට ඇතුළත් මුදල් ප්‍රමාණයක් නැවත පියවා තිබුණි.

(ඈ) කිසියම් විශේෂිත කාර්යයක් සඳහා තත්ත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදීමට කටයුතු කළ යුතු වුවද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වර්ෂය පුරා සිදුකරනු ලබන පුහුණු හා ප්‍රදර්ශන කටයුතු හා ආයතනයේ දෛනික කටයුතු වෙනුවෙන් නිරන්තරයෙන් අතුරු අග්‍රිම ලබාදීමට කටයුතු කර තිබුණි.

2.9 තැන්පතු ශේෂයන්

තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් වේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රජයේ ආදායමට බැර කර තිබූ රු.977,600 ක මුදල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) තැන්පත් ගිණුමක අවිනිශ්චිතව තබා ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීමට ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළයුතු හෝ හැකි ඉක්මණින් ආපසු ගෙවිය යුතුය යන්න දක්වා තිබුණද රු.113,351 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 හා 571(3)පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 ජූනි 24 දිනැති ලිපිය පරිදි දුම්කොළ වෙනුවට විකල්ප ආර්ථික භෝග වගා කිරීම යටතේ ගම්මිරිස් වගාව ප්‍රවලිත කිරීමට රජයේ දායකත්වය ලබාගැනීමේ වැඩසටහන යටතේ ලබාදුන් ප්‍රතිපාදන මුදලින් රු.414,427 ක ප්‍රමාණයක් අදාළ කාර්යය වෙනුවෙන් වැය නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 29 දින අමාත්‍යාංශය වෙත යවා තිබුණි.

(ඈ) පෞද්ගලික සමාගමකට ඉල්ලුම් කරන ලද කුරුඳු පැළ 41,000 ක් වෙනුවෙන් තැන්පත් කරන ලද රු.585,000 ක මුදල සඳහා පැල නිකුත් නොකර තැන්පත් ලේඛනයේ වසර 02කට අධික කාලයක් රඳවා තබාගෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31ට ආදායමට ගෙන තිබුණු අතර 2019 වර්ෂයේදී පැළ නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.

(ඉ) 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අයත් රු.8,214,274 ක් වටිනා තැන්පතු 14 ක් ඊට අයත් නොවන තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු කාණ්ඩය යටතේ දක්වා තිබුණි.

(ඊ) 2015 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නීතියෙන් වෙන් කරනු ලැබූ මැනිවරණ, වැටුප් හා වෙනත් ගෙවීම් ලෙස දක්වන ලද නිශ්චිත ගෙවීම්, ගෙවීමට කටයුතු නොකර රු.27,149 ක් වූ වර්ෂ 02 ඉක්මවන ලද තැන්පතු 08 ක් 2018 දෙසැම්බර් 31 දින ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණි.

(උ) 2018 ජනවාරි මස සිට මැයි මස දක්වා තැන්පතු ගිණුමට බැර කරන ලද රු.389,486 ක් අර්ථසාධක අරමුදල ලෙස ඇතුළත් විශ්‍රාම වැටුප් අරමුදල් වෙනුවෙන් කළ යුතු ගැලපීම් නොකර තාවකාලික රඳවා ගැනීම් මත තැන්පතු ලේඛනයේ තැන්පත් කර තිබුණි.

(ඌ) දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුම්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීම් කර නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර පසුව එළඹෙන වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ එදිනට පෙර විගණකාධිපති වෙත යොමුකළ යුතු වුවත් 2019 මාර්තු 21 දින වන විටත් විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි.

2.10 බැංකු ගිණුම් මෙහෙයවීම

ලංකා බැංකුවේ ජංගම ගිණුම් තුනකට අදාළව පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි සඳහන් 2017ජුනි මස සිට 2018 නොවැම්බර් මස දක්වා කාල පරාසයට අයත් රු.256,662 ක් වටිනා හදුනානොගත් ලැබීම් හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3- මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව විසින් රු. 27,000,000 ක් වූ මූලධන ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 2018 දෙසැම්බර් 26 දින සංශෝධනය කරමින් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය වාර්තා කිරීම තාත්වික නොවුණි.

(ඇ) මූලධන වියදම් වශයෙන් වෙන් කළ රුපියල් මිලියන 500 ක ප්‍රතිපාදනයෙන් රු.18,080,000 ප්‍රතිපාදන පරිපාලන වියදම් සඳහා වෙන් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ රු.19,680,000 ක් පැළ තවාන් අග්‍රිමයෙන්, පැළ තවාන් ඉන්ධන හා ගමන් වියදම් යන මූල්‍ය නොවන මෙහෙයුම් වියදම් සඳහා වියදම් කර තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් රු.79,643,440 ක ආදායමක් රැස්කර තිබුණද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

අපනයන කෘෂි භෝග නිපැයුම් හා රෝපණ ද්‍රව්‍ය ආනයන පාලනය අපනයන කෘෂිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරකමක් වුවද ආනයන පරිමාව සියයට 0.8 සිට සියයට දක්වා වැඩිවී තිබුණි.

3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මධ්‍යම පැළ තවාන් 04 කට අදාළව බීජ වර්ග දෙකක අවශ්‍යතාවය බීජ 92,500 ක් වූ ප්‍රගතිය බීජ 5,932 ක් වූ බැවින් අඩු ප්‍රගතියක් හෝ ශූන්‍ය ප්‍රගතියක් නිරීක්ෂණය විය.

(ආ) කාර්මික නිලධාරියකුගේ පුරප්පාඩුව පිරවීමට කටයුතු නොකර වෙනත් ආයතන මඟි ඇස්තමේන්තු සකස් කර තිබූ අතර රු.37,000,000 ක් වෙන්කර තිබුණු ව්‍යාපෘති 03 ප්‍රගතිය රු.12,686,216 ක් වූ බැවින් ඉටු නොකළ ප්‍රමාණය සියයට 65 ක් වැනි අ මට්ටමක පැවතුණි.

(ඇ) අයවැය මඟින් රු. 19,000,000 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද සන්නිවේදන මාධ්‍ය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් දෙකක භෞතික ප්‍රගතිය සියයට 33 ත් සියයට 58 ර අතර පරාසයක පැවති අතර රු. 1,850,000 ක් වූ ක්‍රියාකාරකමක් දෙකක භෞතික ප්‍රගති 2018 දෙසැම්බර් 31 දිනට ශූන්‍ය මට්ටමක පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සතුව මධ්‍යම පැළ තවාන් 10 ක් පැවතියද මුළු පැළ අවශ්‍යතාවයෙන් පැළ නිකුත් කිරීම සියයට 8.41 ක් වැනි අඩු ප්‍රමාණයක් විය.

(ඉ) ඇස්තමේන්තුගත ආදායමට වඩා සත්‍ය ආදායම රු.මිලියන 43.2 කින් වැඩිවී තිබුණු අතර ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.1.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට යුතුයි මීද්දෙණිය අපනයන කෘෂි භෝග උද්‍යානයේ නල ළිඳක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකට රු.606,855ක් ගෙවීම් කර තිබුණද 2018 දෙසැම්බර් 12 දින විගණන දිනය වන විටත් නළ ළිඳ ඉදිකර හාරදී නොතිබුණි.

3.1.5 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘතිය

කර්මාන්ත 09 ක් සම්බන්ධයෙන් සැලැසුම් කළ දිනයත් සත්‍ය වශයෙන්ම ආරම්භ කළ දිනයත් අතර මාස 04 සිට මාස 10 දක්වා පරාසයක ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

3.2 ප්‍රසම්පාදනයන්

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1(ආ) මාර්ගෝපදේශය පරිදි සැලැසුම් කර ඇති පරිදි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කාල සටහන් සමාලෝචනය කිරීම සහ ඊට එකඟවීම ප්‍රසම්පාදන පාර්ශවවල වගකීමක් විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය පරිදි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව ඇතුළත් කරමින් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත් එසේ සකස් කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2(අ) මාර්ගෝපදේශයට අනුව එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් කාලක්‍රමානුගතව විස්තර කරන පරිදි අදියර 1 සහ 2 වශයෙන් ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කළ යුතු වුවද ප්‍රසම්පාදන සැලැස්මෙහි සියලුම කාර්යයන් 2018 පෙබරවාරි 01 දින සිට දෙසැම්බර් 12 දක්වා යනුවෙන් සඳහන් කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු නොකර ප්‍රසම්පාදන කාර්යයන් 04 ක් සම්බන්ධයෙන් රු.255,710 ක ප්‍රතිපාදන ඉක්මවා ගෙවීම් කර තිබුණි.

(ඉ) රු.70,000,000 කට වැඩි ප්‍රදානය කරනු ලැබ ඇති කොන්ත්‍රාත් සම්බන්ධයෙන් විස්තර ආකෘතියේ වෙබ් අඩවියේ පළකළ යුතු වුවත් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රදානය කරන ලැබූ කොන්ත්‍රාත්කරු සම්බන්ධ විස්තර දෙපාර්තමේන්තුව වෙබ් අඩවියෙහි පළකර නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) මාර්ගෝපදේශය අනුව තාක්ෂණික කමිටුවකට නිලධාරීන් පත් කරන විට අදාළ විෂය සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයකු කමිටුවට ඇතුළත් විය යුතු වුවද තාක්ෂණික ඇගැයීම් කමිටුව සඳහා එසේ පත්කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ වාහන 44 කට අදාළව ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි.

(ආ) මිද්දෙණිය මධ්‍යම පෑළ තවානේ අවශ්‍යතාවය සඳහා ඉල්ලීමකින් තොරව විවිධ අවස්ථාවලදී ප්‍රධාන කාර්යාලය මඟින් සපයා දී තිබුණු එකතුව රු.528,589 ක් වටිනා ද්‍රව්‍ය අවුරුදු 01 ක සිට අවුරුදු 04 ක පමණ කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඇ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු නිල නිවාසවලින් නිල නිවාස 07 ක් විගණන පරීක්ෂණ දින වූ 2019 මැයි 08 දින වන විටත් වසා දමා තිබුණු අතර වසා දමා තිබූ කාලය මාස 07 සිට අවුරුදු 04 ක් දක්වා විය.

3.4 පවරා නොගත් වත්කම් පරිහරණය

දෙපාර්තමේන්තුව විසින් හෙක්ටයාර් 203.29 ක් වූ ඉඩම් කට්ටි 37 ක් පවරා ගැනීමට ක්‍රියා නොකර පරිහරණය කරනු ලබන බව් නිරීක්ෂණය විය.

3.5 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාහන 34 ක් සම්බන්ධයෙන් වාහනවල අයිතිය දෙපාර්තමේන්තුව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 මාර්තු 22 දිනැති කල්බදු වාහන සඳහා වූ ගිවිසුමෙහි 03 ඡේදය අනුව සෑම වාහනයක්ම මාසිකව අවම වශයෙන් කි.මී.3000 ක් ධාවනය කළ යුතු වුවද වාහන 10 න් 04 ක් කිසිදු මාසයක කි.මී.3000 ක් ධාවනය කර නොතිබුණි.

(ඇ) ඉතිරි වාහන 06 න් 04 ක් එක් මාසයක් පමණක් කි.මී.3000 ඉක්මවා ධාවනය කර තිබුණි.

(ඉ) කල්බදු ක්‍රමය යටතේ ලබාගත් කැබ් රථයක් සමාලෝචිත වර්ෂයට අදාළව කි.මී.18,124ක් වැනි අවම දුර ප්‍රමාණයක් ධාවනය කර තිබුණි.

3.6 බැඳීම් හා බැරකම්

දෙපාර්තමේන්තුව විසින් රු.92,560,080 ක බැරකම්වලට බැඳීමෙන් භාණ්ඩාගාර ලේකම්ගේ 05/2016 අංක දරන 2016 දෙසැම්බර් 28 දිනැති අයවැය වක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.7 රජයේ නිළධාරීන් ඇප තැබීම

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක සේවයේ නිලධාරීන් 6 දෙනෙකුගෙන් අයවිය යුතු රු.610,000 ක ඇප මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ ලැයිස්තුව ප්‍රතිශෝධනය කර අදාළ අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.8 කළමනාකරණ දුර්වලතා

තවාන්කරුවන්ගෙන් රඳවාගත් රු.4,281,072 ක මුදල 2019 මාර්තු 19 වන විට මාස 03 ත් මාස 09 ත් අතර කාලයක් තැන්පත් ලේඛනයේ නිෂ්ක්‍රීයව රඳවාගෙන තිබුණි.

4 - තිරසාර සංවර්ධනය

4. තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත දැක්වෙන කරුණුනිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සංදිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගත හැකි වුවද, ආයතනය විසින් ඔවුන් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයට අදාළ ඉලක්ක පිළියෙළ කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපණය නොවුණි..

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධන දත්ත පදනමක් පැවැතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. ක්‍රියාපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 133(2) අනුව වැඩ, යෝජනා ක්‍රම හා ව්‍යාපෘති යන මේවායේ ප්‍රගතිය සොයා බැලීම සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාට හා ප්‍රගති/අන්වේෂන කමිටුවට සහායවීමෙහිලා අභ්‍යන්තර විගණන ඒකකයට අයත් කාර්යයන් ඉටුවී නොතිබුණි.

(ආ) 2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009(1) අනුව සෑම වර්ෂයකම ජනවාරි මස 31 දිනට පෙර අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණන වැඩසටහන් පිළියෙල කර එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබූ අතර වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වාර්තා 06 ක් දක්වා තිබුණද එයින් මූලික වාර්තාව සහ සාරාංශ වාර්තාව සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූලිකඩම සකස් කරනු ලැබුණු අභ්‍යන්තර විගණන සැලැස්මේ එක් එක් කාර්යය සඳහා අවදානම් ගණනය කර නොතිබුණු අතර ඉටුකිරීමට බලාපොරොත්තු වන කාලය සහ මිනිස් දින ගණන නිශ්චිතව දක්වා නොතිබුණි.

(ඇ) අනුමත කරන ලද පළමු අභ්‍යන්තර විගණන සැලැස්මෙහි අඩංගු කාර්යයන් සංශෝධන විගණන සැලැස්ම සමඟ සැසඳීමේදී ඉවත් කිරීමට හේතුව විගණනයට පැහැදිලි නොවුණි. විස්තර පහත දැක්වේ.

i. භෝග සංවර්ධන වැඩසටහන යටතේ සියලු පැළ තවාන්වල ප්‍රගතිය පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබුණද සෘශෝධිත ඇස්තමේන්තුවෙන් බැලැක්වෝටර් පැල තවාන පමණක් ඇතුළත් කර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි බාහිර තවාන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පරීක්ෂා කිරීම අවලංගු කර තිබීම.

ii. නව වගා වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 17 ක් ආවරණය වන පරිදි විගණන කටයුතු සැලැසුම් කළද පසුව එය මාතලේ දිස්ත්‍රික්කයට පමණක් සීමාකර තිබුණි.

iii. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන සහ ධන සවිය වැඩසටහන දිස්ත්‍රික්ක 17 ක් ආවරණය කිරීමට සැලැසුම් කළද පසුව ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන සැලැස්මෙන් ඉවත් කර ධන සවිය වැඩසටහන දිස්ත්‍රික්ක 06 දක්වා අඩුකර තිබීම.

iv. භෝග අගය එකතු කිරීමේ වැඩසටහන යටතේ පරීක්ෂා කිරීමට නියමිතව තිබුණු මූලික සැකසුම් හා යහපත් පුරුදු යන ක්‍රියාකාරකම් සංශෝධිත සැලැස්ම අනුව ඉවත් කර තිබුණි.

v. සන්නිවේදනය හා දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පරීක්ෂා කිරීමට සැලැසුම් කළ සියලු කාර්යයන් සංශෝධිත සැලසුම අනුව ඉවත් කර තිබුණි.

(ඉ) කාර්යාලය තුළ සාමාන්‍යයෙන් සිදුවන දෛනික කටයුතු වෙනුවෙන් මිනිස් දින 440 ක් හෙවත් සමස්ථ සැලැසුම්ගත කාලයෙන් සියයට 44 ක් දක්වා තිබීම හේතුවෙන් විගණන නොවන කටයුතු වෙනුවෙන් වැඩි කාලයක් වෙන් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී අපනයන භෝග පර්යේෂණ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 28.5 ක් වෙන් කර තිබුණද පර්යේෂණ ක්‍රියාවලියේ ඵලදායිතාවය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයේ අවධානය යොමුකර නොතිබුණි.

(උ) නාරම්මල අතුරු භෝග හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රසම්පාදන කටයුතු හැර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් ප්‍රසම්පාදන විගණනය සඳහා ප්‍රමාණවත් අවධානයක් අභ්‍යන්තර විගණනය විසින් යොමුකර නොතිබුණි.

(ඌ) සාධාරණ හේතුවක් නොමැතිව වර්ෂයට අදාළව සිදු කරනු ලැබූ විගණන කාර්යයන් වර්ෂය අවසානයේදී සංශෝධනය කර තිබුණි.

6 - මානව සම්පත් කළමනාකරණය

6.1 සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

සේවා වර්ගය	අනුමත කාර්ය මණ්ඩලය	තථ්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	85	68	17
තෘතීය මට්ටම	29	06	23
ද්විතියික මට්ටම	800	630	170
ප්‍රාථමික මට්ටම	450	400	50
	1,364	1,104	260

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය වෙත පැවරී ඇති කාර්යයන්ට අනුව සිදුවන්නේද යන්නත්, ඒ අනුව සැලැසුම්ගත ඉලක්ක, අරමුණු, මෙහෙවර හා දැක්ම ඉටුකර ගැනීම සහා අවශ්‍ය ක්‍රියාවලිය සම්බන්ධයෙන් විධිමත් ඇගැයීමක් සිදුකර එය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනාගත යුතු වුවද එවැනි හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම රු.1,171,155,000 ක් වැඩසටහන් දෙකකට අදාළව සකස් කර තිබුණද එම සැලැස්මේ සඳහන් ඉලක්ක ඉටුකර ගැනීමට අවශ්‍ය රාජකාරි වෙන් වෙන්ව වැඩ තක්සේරු කිරීමක් සිදුකර එය පදනම් කර අදාළ ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කර නොතිබුණි.

(ඇ) අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකර වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන සේවය හැරගිය පර්යේෂණ හා සංවර්ධන සහකාර නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.2,651,500 ක දණ්ඩන මුදල වාරික වශයෙන් රු.10,000 ක් බැගින් ගෙවීමට නිලධාරිනිය විසින් ඉල්ලා තිබුණි. දණ්ඩන මුදල් වාරික වශයෙන් අයකිරීමට අදාළ විධිවිධාන ආයතන සංග්‍රහය තුළ නොමැති අතර 2019 මැයි 06 දින වන තෙක් සුදුසු පියවරක් නිර්දේශ කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටම, කෘතීය මට්ටම හා ද්විතීය මට්ටමේ සමස්ථ තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව 704 ක් වූ අතර ඉන් තනතුරු 13 කට අදාළ නිලධාරීන් 480 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ කිසිදු පුහුණුවීමක් ලබාදී නොතිබුණි.

(ඉ) කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීමට කටයුතු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන අංශයේ සේවය කරනු ලබන නිලධාරීන් හට කිසිදු පුහුණුවීමක් ලබාදී නොතිබුණි.

(ඊ) පැළ තවාන් 11 ක තනතුරු 06 ක් සඳහා පුරප්පාඩු 50 ක් 2018 දෙසැම්බර් 31 දිනට පැවති බව නිරීක්ෂණය විය.

එච්.එන්.රණතුංග
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.



අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ஏற்றுமதி விவசாயத் திணைக்களம்
DEPARTMENT OF EXPORT AGRICULTURE

+ 94 812 388651 + 94 812 388738 direxag@sltnet.lk

1095, Getambe, Peradeniya, Sri Lanka. www.dea.gov.lk



අතමිටි සරු හෙට දිනකට...

Cover Designed by : **PRASANNA THILAKARATHNA** | COM Division